35 වන කාණ්ඩය
8 වන කලාපය

බදාදා
1985 ජුනි 5

EVELYN RUTNAM INSTITUTE
271
REFERENCE
LIBRARY
18/7/9
JAFFNA

# පාර්ලිමේන්තු විවාද

## (හැන්සාඩ්)

## නිල වාර්තාව

RUTNAM LIBRARY
69275
JAFFNA

(අශෝධිත පිටපත)

## අන්තර්ගත ප්‍රධාන කරුණු

**ප්‍රශ්නවලට වාචික පිළිතුරු**

**විශ්‍රාම වැටුප් (විශේෂ විධිවිධාන) පනත් කෙටුම්පත :**

පළමුවන වර කියවන ලදී

**ලංකාවේ රෝමානු කතෝලික අග්‍ර රාජගුරු ප්‍රසාදීන් වහන්සේ සහ රාජගුරු ප්‍රසාදීන් වහන්සේලා පිළිබඳ (සංශෝධන) පනත් කෙටුම්පත :**

සලකා බලා තුන්වන වර කියවා සංශෝධිතාකාරයෙන් සම්මත කරන ලදී

**වාර්ෂික වාර්තා :**

ලංකා සම්භාණ්ඩ සංයුක්ත මණ්ඩලය
ලංකා ප්‍රමිති කාර්යාංශය
ශ්‍රී ලංකා ජාතික ඉංජිනේරු පර්යේෂණ සහ සංවර්ධන මධ්‍යස්ථානය
ඉංජිනේරුමය කාර්යයන් පිළිබඳ මධ්‍යම උපදේශක කාර්යාංශය
ශ්‍රී ලංකා රාජ්‍ය ඖෂධ නීතිගත සංස්ථාව

**ජාතික සුළු කර්මාන්ත සංයුක්ත මණ්ඩලය : ඇවරකරුවකු පත් කිරීම**

**මැලනියොත් පාලන පනත් කෙටුම්පත :**

දෙවන වර හා තුන්වන වර කියවා සංශෝධිතාකාරයෙන් සම්මත කරන ලදී

**වෛද්‍ය (සංශෝධන) පනත් කෙටුම්පත :**

දෙවන වර හා තුන්වන වර කියවා සංශෝධිතාකාරයෙන් සම්මත කරන ලදී

**කල් තැබීමේ යෝජනාව**

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

தொகுதி 35
இல. 8

புதன்கிழமை
5 ஜூன் 1985

# பாராளுமன்ற விவாதங்கள்

*(ஹன்சாட்)*
*அதிகார அறிக்கை*

*(பிழை திருத்தப்படாதது)*

*பிரதான உள்ளடக்கம்*

வினாக்களுக்கு வாய்மூல விடைகள்
ஓய்வூதியம் (சிறப்பேற்பாடுகள்) சட்டமூலம் :
முதன்முறை மதிப்பிடப்பட்டது
இலங்கை உரோமன் கத்தோலிக்க அதிமேற்றிராணியார், மேற்றிராணியார்கள் (திருத்தம்) சட்டமூலம் :
பரிசீலிக்கப்பட்டு மூன்றும் முறை மதிப்பிடப்பட்டு, திருத்தப்பட்டவாறு நிறைவேற்றப்பட்டது
ஆண்டறிக்கைகள் :
இலங்கை தோற்பொருட் கூட்டுத்தாபனம்
இலங்கைக் கட்டளைகள் பணியகம்
இலங்கைத் தேசிய எந்திரவியல் ஆராய்ச்சி, அபிவிருத்தி நிலையம்
மத்திய பொறியியல் உசாத்துணைப் பணியகம்
இலங்கை அரச மருந்தாக்கற் கூட்டுத்தாபனம்
தேசிய சிறு கைத்தொழிற் கூட்டுத்தாபனம் : கலைப்பாளர் நியமனம்
மலத்தியன் கட்டுப்பாட்டுச் சட்டமூலம் :
இரண்டாம் மூன்றும் மதிப்புக்களிடம்பெற்று திருத்தப்பட்டவாறு நிறைவேற்றப்பட்டது
மருத்துவ (திருத்தம்) சட்டமூலம் :
இரண்டாம் மூன்றும் மதிப்புக்களிடம்பெற்று திருத்தப்பட்டவாறு நிறைவேற்றப்பட்டது
ஒத்திவைப்புப் பிரேரணை

**Volume 35**
**No. 8**

**Wednesday**
**5th June 1985**

# PARLIAMENTARY DEBATES

**(HANSARD)**

## OFFICIAL REPORT

**(Uncorrected)**

## PRINCIPAL CONTENTS

ORAL ANSWERS TO QUESTIONS
PENSIONS (SPECIAL PROVISIONS) BILL :
Read the First time
ROMAN CATHOLIC ARCHBISHOP AND BISHOPS OF CEYLON (AMENDMENT) BILL :
Considered, read the Third time, and passed as amended
ANNUAL REPORTS :
Ceylon Leather Products Corporation
Bureau of Ceylon Standards
National Engineering Research and Development Centre of Sri Lanka
Central Engineering Consultancy Bureau
State Pharmaceuticals Corporation of Sri Lanka
NATIONAL SMALL INDUSTRIES CORPORATION : APPOINTMENT OF LIQUIDATOR
MALATHION CONTROL BILL :
Read a Second, and the Third time, and passed as amended
MEDICAL (AMENDMENT) BILL :
Read a Second, and the Third time, and passed as amended
ADJOURNMENT MOTION

2 – A 084084 – 2,750 (85/06)

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

# පාර්ලිමේන්තුව

## பாராளுமன்றம்

# PARLIAMENT

**1985 ජූනි 5 වන බදාදා**

**புதன்கிழமை, 5 ஜூன் 1985**

*Wednesday, 5th June, 1985*

---

*පූ.භා. 10 ට පාර්ලිමේන්තුව රැස් විය. කථානායකතුමා [ඊ. එල්. සේනානායක මහතා] මූලාසනාරූඪ විය.*

*பாராளுமன்றம் மு. ப. 10 மணிக்குக் கூடியது. சபாநாயகர் அவர்கள் [திரு. ஈ. எல். சேனநாயக்க] தலைமை வகித்தார்கள்.*

*The Parliament met at* 10 A.M. MR. SPEAKER (MR. E. L. SENANAYAKE) *in the Chair.*

---

## 47 (5) වන ස්ථාවර නියෝගය යටතේ පිළිගන්වන ලද වාර්තාව

**நிலைக்கட்டளை இல. 47 (5) இன்படி சமர்ப்பிக்கப்பட்ட அறிக்கை**

## REPORT PRESENTED UNDER STANDING ORDER NO. 47 (5)

### ශ්‍රී ලංකා සාමෝදය පදනම (සංස්ථාගත කිරීමේ) පනත් කෙටුම්පත

### இலங்கை சாமோதய மன்றம் (கூட்டிணைத்தல்) சட்டமூலம்

### SRI LANKA SAMODAYA FOUNDATION (INCORPORATION) BILL

Report on the Bill intituled "An Act to incorporate the Sri Lanka Samodaya Foundation". – (*Mr. M. Vincent Perera, on behalf of the Minister of Cultural Affairs*).

*පනත් කෙටුම්පත 1985 ජූනි 6 වන බ්‍රහස්පතින්දා දෙවන වර කියවිය යුතුයයි නියෝග කරන ලදී.*

*சட்டமூலம் 1985 ஜூன் 6 வியாழக்கிழமை இரண்டாம்முறை மதிப்பிடப்படக் கட்டளையிடப்பட்டது.*

*Bill ordered to be read a Second time upon Thursday, 6th June 1985.*

## ප්‍රශ්නවලට වාචික පිළිතුරු

**வினாக்களுக்கு வாய்மூல விடைகள்**

## ORAL ANSWERS TO QUESTIONS

### එච්. ආර්. චන්ද්‍රසේන මහතාගේ අර්ථසාධක මුදල්

### திரு. எச். ஆர். சந்திரசேனவுக்குரிய சேமலாபநிதி

### MR. H. R. CHANDRASENA'S PROVIDENT FUND DUES

142/85

1. **ආචාර්ය ඩබ්ලිව්. දහනායක මහතා (ගාල්ල)**
**(கலாநிதி டபிள்யு. தஹநாயக்க — காலி)**
(Dr. W. Dahanayake–Galle)

ධීවර කටයුතු පිළිබඳ ඇමතිතුමාගෙන් ඇසූ ප්‍රශ්නය :

(අ) මට්ටක්කුලියේ ධීවර වරාය සංස්ථාවේ වඩුකාර්මික (සේවා අංකය 356) එච්. ආර්. චන්ද්‍රසේන මහතා අවුරුදු 20 ට වැඩි සේවා කාලයකින් පසුව 1983 පෙබරවාරි 28 වැනිදා මියගිය බැව් එතුමා දන්නේද?

(ආ) අර්ථසාධක අරමුදල් හා අතිකුත් මුදල් කිසිවක් මේ දක්වාම කිසිවකුට හෝ ගෙවා නොමැති බැව් එතුමා දන්නේද?

(ඇ) ඉදිරිපත් කොට ඇති විවාහ සහතිකයට අනුව ගාල්ලේ ඇත්තිලිගොඩ ගල්ගොඩවත්තේ ආර්. එච්. කල්‍යාණවතී මහත්මිය මියගිය අයගේ නීත්‍යානුකූල භාර්යාව බැව් එතුමා දන්නේද?

(ඈ) අර්ථසාධක අරමුදල් හා අතිකුත් සියලු මුදල් නීත්‍යානුකූල භාර්යාව වන කල්‍යාණවතී මහත්මියට ගෙවීමට එතුමා කටයුතු සලස්වන්නේද?

(ඉ) නොඑසේ නම්, ඒ මන්ද?

கடற்றொழில் அமைச்சரைக் கேட்ட வினா :

(அ) மட்டக்குளியாவிலுள்ள மீன்பிடித் துறைமுகக் கூட்டுத்தாபனத்தில் 20 வருடங்களுக்கு மேலாகத் தச்சுத் தொழிலாளியாயிருந்த திரு. எச். ஆர். சந்திரசேன என்பவர் (சேவை இலக்கம் 356) 1983, பெப்ருவரி 28 ஆந் திகதி மரணமடைந்தாரென்பதை அவர் அறிவாரா ?

(ஆ) இவரது சேமலாப நிதி நயங்களோ ஏனைய கொடுப்பனவுகளோ இதுவரை எவருக்கும் வழங்கப்படவில்லை என்பதை அவர் அறிவாரா ?

(இ) சமர்ப்பிக்கப்பட்டுள்ள விவாகச் சான்றிதழின்படி காலஞ்சென்றவரின் சட்டபூர்வமான மனைவி காலி, எத்திலிகொடை, கல்கொடவத்தை என்னுமிடத்தைச் சேர்ந்த திருமதி ஆர். எச். கல்யாணவதி என்பதை அவர் அறிவாரா ?

(ஈ) சேமலாபநிதி நயங்களையும் ஏனைய கொடுப்பனவுகளையும் சட்டபூர்வமான மனைவியான திருமதி கல்யாணவதிக்கு வழங்குவதற்கு அவர் உரிய நடவடிக்கைகளை எடுப்பாரா ?

(உ) இன்றேல், ஏன் ?

asked the Minister of Fisheries :

(*a*) Is he aware that Mr. H. R. Chandrasena, Carpenter, Service Number 356, Fisheries Harbour Corporation, Mattakkuliya, died on 28th February, 1983, after over 20 years of service ?

(*b*) is he aware that the Provident Fund and other dues have not yet been paid to anybody ?

(*c*) Is he aware that Mrs. R. H. Kalyanawathie of Galgodawatta, Eththiligoda, Galle, is the legal wife of the deceased, as shown in the marriage certificate that has been produced ?

(*d*) Will he take steps to cause payment of the Provident Fund dues and all other dues to the legal wife, Mrs. Kalyanawathie ?

(*e*) If not, why ?

**ජී. එම්. ප්‍රේමචන්ද්‍ර මහතා (නියෝජ්‍ය ධීවර ඇමතිතුමා)**
**(திரு. ஜீ. எம். பிரேமசந்திர — கடற்றொழில் பிரதி அமைச்சர்)**
(Mr. G. M. Premachandra–Deputy Minister of Fisheries)

ගරු කථානායකතුමනි, පිළිතුර දීර්ඝ එකක් නිසා එය * සභාගත කරනවා.

** සභාමේසය මත තබන ලද පිළිතුර :*
*சபாபீடத்தில் வைக்கப்பட்ட மறுமொழி*
*Answer Tabled :*

(අ) 1983 පෙබරවාරි 28 වැනි දින මොහු මියගිය බව මරණ සහතිකයක් මගින් ලංකා ධීවර වරාය නීතිගත සංස්ථාවට දන්වා ඇත.

(ආ) විවාහ සහතිකයක් හා ග්‍රාමසේවක සහතිකයක් මගින් ඔහුගේ භාර්යාව බවට සහතික ඉදිරිපත් කිරීමෙන් අනතුරුව ආර්. එච්. කල්‍යාණවතී තමැත්තියට අර්ථසාධක අරමුදල් ප්‍රතිලාභ ලබා දෙන ලෙස 1983.04.23 දින කම්කරු කොමසාරිස් වෙත අයදුම්පත් භාර දී ඇත.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

(ඈ) සේවා අංක 3976/ජ සහ සාමාජික අංක 5707 යටතේ මොහු සේවක අර්ථසාධක අරමුදලේ ලියාපදිංචි කොට ඇත්තේ ධීවර සංස්ථාව මඟිනි. කම්කරු කොමසාරිස් විසින් ඔහුගේ අංක : සී7/11/1543/83 හා 1984.10.22 දින දරණ ලිපියෙන් ලංකා ධීවර වරාය නීතිගත සංස්ථාව වෙත දන්වා ඇත්තේ මොහු සේවක අර්ථ සාධක අරමුදලේ ලියාපදිංචි කිරීමේ දී ඔහුගේ භාර්යාව වශයෙන් සඳහන් කර ඇත්තේ එන්. පී. ඥාණවතී තමැත්තිය බවත්, ප්‍රතිලාභ පසු අයිතිය එච්. ආර්. තිලකරත්න නමැති ඔහුගේ පුතකුට පවරා ඇති බවත් ය. නමුත් ඔහුගේ මරණය පිළිබඳව ලංකා ධීවර වරාය නීතිගත සංස්ථාව වෙත දන්වා ඇත්තේත්, විවාහ සහතිකයක් මඟින් භාර්යාව බවට ඉදිරිපත්ව ඇත්තේත්, ආර්. එච්. කල්‍යාණවතී තමැත්තියකි. මේ අනුව ඔහුගේ නීත්‍යානුකූල බිරිද එන්. පී. ඥාණවතී තමැත්තිය ද, නැතිනම් ආර්. එච්. කල්‍යාණවතී තමැත්තිය ද කියා නිගමනය කළ නොහැකි බව ලංකා ධීවර වරාය නීතිගත සංස්ථාව විසින් 1984.12.19 දින කම්කරු කොමසාරිස් වෙත දන්වා යවා ඇත.

(ඈ) විවාහ සහතිකයක් සමඟ ලංකා ධීවර වරාය නීතිගත සංස්ථාව වෙත ඉදිරිපත්වූ ආර්. එච්. කල්‍යාණවතී තමැත්තියට මොහුගේ ප්‍රතිලාභ මුදල් ලබාදෙන ලෙස 1984.12.19 දින කම්කරු කොමසාරිස් වෙත දන්වා ඇත.

**ආචාර්ය ඩබ්ලිව්. දහනායක මහතා**
**(கலாநிதி டபிள்யு. தஹநாயக்க)**
(Dr. W. Dahanayake)

ගරු කථානායකතුමනි, මම හිතන්නෙ මේ ප්‍රශ්නයට සතුටුදායක පිළිතුරක් ලැබී තිබෙනවාය කියායි. ගරු ඇමතිතුමා මේ පටලැවිල්ල බේරා තිබෙන බව මට දැනගන්නට තිබෙනවා. ස්තුතියි.

## ඒ. වී. රෝසාහාමි මහත්මිය : වැන්දඹු විශ්‍රාම වැටුප්
## திருமதி ஏ. வீ. ரோஸஹாமி : விதவை ஓய்வூதியம்
## MRS. A. V. ROSAHAMY : WIDOW'S PENSION

149/85

2. **ආචාර්ය ඩබ්ලිව්. දහනායක මහතා**
**(கலாநிதி டபிள்யு. தஹநாயக்க)**
**(Dr. W. Dahanayake)**

**කෘෂිකාර්මික සංවර්ධනය හා පර්යේෂණ පිළිබඳ ඇමතිතුමා සහ ආහාර හා සමූපකාර ඇමතිතුමාගෙන් ඇසූ ප්‍රශ්නය :**

(අ) ලබුදූව ගොවිපලේ කම්කරු එච්. එල්. විජේසේන මහතා 1984 ජූලි 13 වැනිද මියගිය බවත්, ඔහුගේ භාර්යාව වන ගාල්ලේ ලබුදූවේ දූල්කැටදූව වත්තේ ඒ. වී. රෝසාහාමි මහත්මිය විශ්‍රාම වැටුප් අංක 323702 යටතේ වැන්දඹු විශ්‍රාම වැටුප් හා අනිකුත් සියලු මුදල් ඉල්ලා ඇති බවත් එතුමා දන්නේද?

(ආ) මේ මුදල් ඇයට ගෙවන්නේ කවදද?

(ඇ) නොගෙවන්නේ නම්, ඒ මන්ද?

**கமத்தொழில் அபிவிருத்தி, ஆராய்ச்சி அமைச்சரும் உணவு, கூட்டுறவு அமைச்சருமானவரைக் கேட்ட வினா :**

(அ) 1984 ஜுலை 13 ஆம் திகதி காலமான, லபுதுவப்பண்ணை சிற்றூழியர் திரு. எச். எல். விஜேசேன என்பவரின் மனைவி காலி, லபுதுவ, தூலவத்தை, தெல்கெற்றவில் வசிக்கும் திருமதி ஏ. வி. ரோஸஹாமி என்பவர் ஓய்வூதிய இலக்கம் 323702 இன்படி விதவை ஓய்வூதியத்தையும் ஏனைய பாக்கிகளையும் கோரியுள்ளார் என்பதை அவர் அறிவாரா ?

(ஆ) இவருக்கு இவை எப்போது வழங்கப்படும் ?

(இ) இல்லையேல், ஏன் ?

asked the Minister of Agricultural Development and Research and Minister of Food and Co-operatives :

(*a*) Is he aware that labourer, Mr. H. L. Wijesena of the Labuduwa Farm, died on 13th July, 1984, and that his wife, Mrs. A. V. Rosahamy of Dalketaduwawatte, Labuduwa, Galle has asked for Widow's Pension on Pension No. 323702, and all other dues ?

(*b*) When will these be paid to her ?

(*c*) If not, why ?

**එස්. එස්. අබේසුන්දර මහතා (වැඩබලන කෘෂිකාර්මික සංවර්ධන හා පර්යේෂණ ඇමතිතුමා)**

**(திரு. எஸ். எஸ்.அபேசுந்தர பதில் விவசாய அபிவிருத்தி, ஆராய்ச்சி அமைச்சர்)**

(Mr. S. S. Abeysundera – Acting Minister of Agricultural Development & Research)

(*a*) I am aware that Mr. H. L. Wijesena died on 13.06.1984.

(*b*) The payment of death gratuity has already been approved. The Widows' & Orphans' Pension and the Provident Fund contributions will be paid when approved by the relevant authorities.

(*c*) Does not arise.

## දකුණු ප්‍රාදේශීය ගමනාගමන මණ්ඩලය : තීන්ත සොරකම
## தென் பிராந்திய போக்குவரத்துச்சபை : வர்ணக் கலவைகள் களவு
## SOUTHERN REGIONAL TRANSPORT BOARD : THEFT OF PAINT

150/85

3. **ආචාර්ය ඩබ්ලිව්. දහනායක මහතා**
**(கலாநிதி டபிள்யு. தஹநாயக்க)**
**(Dr. W. Dahanayake)**

**ප්‍රවාහන ඇමතිතුමා සහ ගමනාගමන මණ්ඩල ඇමතිතුමා සහ පුද්ගලික බස් ප්‍රවාහනය පිළිබඳ ඇමතිතුමා සහ වාණිජ සහ කර්මාන්ත ආයතනයන්ගේ ආරක්ෂාව පිළිබඳ ඇමතිතුමාගෙන් ඇසූ ප්‍රශ්නය :**

(අ) දකුණු ප්‍රාදේශීය ගමනාගමන මණ්ඩලයෙන් රු. 3,945 ක් වටිනා තීන්ත සොරකම් කළ බවක් දන්වා එවූ 1985 පෙබරවාරි 14 වැනි දින දරන ලිපිය එතුමාට ලැබුණේද?

(ආ) මෙම පෙත්සම මත එතුමා ගත් ක්‍රියාමාර්ගය කුමක්ද?

**போக்குவரத்து அமைச்சரும், போக்குவரத்து சபைகள் அமைச்சரும், தனியார் பஸ் போக்குவரத்து அமைச்சரும், வர்த்தக கைத்தொழில் நிறுவனங்களின் பாதுகாப்பு அமைச்சருமானவரைக் கேட்ட வினா :**

(அ) தென் பிராந்திய போக்குவரத்துச் சபையிலிருந்து ரூபா 3,945/- பெறுமதியான வர்ணக் கலவைகள் களவு எடுக்கப்பட்டுள்ளதாகக் குற்றஞ்சாட்டி 1985 பெப்ருவரி 14 ஆம் திகதியிட்ட மனு ஒன்றை அவர் பெற்றாரா ?

(ஆ) இந்த மனுவின் மீது அவர் என்ன நடவடிக்கை எடுத்துள்ளார் ?

asked the Minister of Transport and Minister for Transport Boards and Minister for Private Omnibus Transport and Minister for Security of Commercial and Industrial Establishments :

(*a*) Did he receive a letter dated 14th February, 1985, alleging that Rs. 3,945 worth of paint had been stolen from the Southern Regional Transport Board ?

(*b*) What action has he taken on this petition ?

**එච්. බී. අබේරත්න මහතා (නියෝජ්‍ය ගමනාගමන මණ්ඩල ඇමතිතුමා)**

(திரு. எச். பி. அபேரத்ன — போக்குவரத்துச் சபைகள் பிரதி அமைச்சர்)

(Mr. H. B. Abeyratne- Deputy Minister for Transport Boards)

(*a*) Yes.

(*b*) This is being inquired into.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

## කේ. ජී. හැන්ඩි මහතා : මරණ පරීක්ෂණ වාර්තාව

## திரு. கே. ஜி. ஹெண்டி : மரண விசாரணை

## MR. K. G. HENDY : INQUEST PROCEEDINGS

66/85

4. **ලක්ෂ්මන් ජයකොඩි මහතා** (අත්තනගල්ල)
**(திரு. லக்ஷ்மன் ஜயக்கொடி — அத்தனகல்ல)**
(Mr. Lakshman Jayakody–Attanagalla)

ස්වදේශ කටයුතු ඇමතිතුමාගෙන් ඇසූ ප්‍රශ්නය :

(අ) කෝදගොඩ ගමගේ හැන්ඩිගේ මරණය, ගාලු දිස්ත්‍රික්කයේ ගාලු නගරයේ උතුරු කොට්ඨාශයේ අංක. 2962 යටතේ යථා පරිදි ලියාපදිංචි කරනු ලැබුවේද?

(ආ) 1984. 01. 25 වැනිද මෙම මරණය ලියාපදිංචි කළ රෙජිස්ට්‍රාර්වරයා එසේ කලේ මරණ පරීක්ෂණයක් පැවැත්වීමෙන් අනතුරුවද?

(ඇ) මරණයට හේතුව කුමක්ද?

(ඈ) මරණ පරීක්ෂණයේ කටයුතුවල පිටපතක් එතුමා සභාගත කරන්නේද?

**உள்நாட்டலுவல்கள் அமைச்சரைக் கேட்ட வினா :**

**(அ) கோதாகொட கமகே ஹெண்டி என்பவரின் மரணம் காலி மாவட்டத்தின் காலி நகர வடக்குப் பிரிவில் இல. 2962 என முறையாகப் பதிவு செய்யப்பட்டதா ?**

**(ஆ) 25—1—1984 ஆந் திகதி இம் மரணத்தைப் பதிவு செய்த பதிவாளர் மரண விசாரணையொன்றின் பின்னரா அவ்வாறு செய்தார் ?**

**(இ) மரணத்திற்கான காரணம் யாது ?**

**(ஈ) மரண விசாரணை அறிக்கைப் பிரதியை அவர் சமர்ப்பிப்பாரா ?**

asked the Minister of Home Affairs :

(*a*) Was the death of Kodagode Gamage Hendy duly registered as No. 2962 in Galle Town North Division of the District of Galle ?

(*b*) Did the Registrar who registered this death on 25.01.1984 do so after an inquest ?

(*c*) What was the cause of death ?

(*d*) Will he table a copy of the proceedings of the inquest ?

**කේ. ඩබ්ලිව්. දේවනායගම් මහතා (ස්වදේශ කටයුතු ඇමතිතුමා)**
**(திரு. கே. டபிள்யு. தேவநாயகம் — உள்நாட்டலுவல்கள் அமைச்சர்)**
(Mr. K. W. Devanayagam–Minister of Home Affairs)

(*a*) Yes.

(*b*) Yes. The death was registered under entry No. 2962 on 25.01.1984 by the Registrar, Galle Town North Division, on the certificate dated 12.01.1984 issued by Mr. N. D. Wijenayake, the Inquirer into Sudden Deaths, within the Galle Municipality, after the inquest held by him under Section 39 of the Births and Deaths Registration Act (Cap. 110).

(*c*) Electrocution – a sudden death.

(*d*) *Yes – tabled herewith.*

***සභාමේසය මත තබන ලද ලියවිලි :**
**சபாபீடத்து வைக்கப்பட்ட ஆவணங்கள்**
*Document tabled :*

අංකය :ඩබ. 23/94 12.01.84
12/1

කෝදගොඩ ගමගේ හැන්ඩි, වයස : අවුරුදු 69, රැකියාව, ගොවිතැන, සිංහල, බුද්ධාගම, ලිපිනය : කෝදගොඩ වත්ත, පිටිදූව, හබරාදූව යන අයගේ මරණ පරීක්ෂණය පො : කො : 1774 ටයිටස් මහතාගේ සාක්ෂි මෙහෙයවීම පිට ගාල්ල මහමෝදර රෝහල් පොලිසියේදී 1984.01.12 වෙනි දින අ : භා : 16.30 ට ආරම්භ කරන ලදී. කෝදගොඩ ගමගේ මාලිනී, වයස අවුරුදු 36 විවාහකයි, සිංහල, බුද්ධාගම, ලිපිනය : කෝදගොඩ වත්ත, පිටිදූව, හබරාදූව මෙසේ ප්‍රකාශ කරයි :

මියගොස් ඇති කෝදගොඩ ගමගේ හැන්ඩි මගේ පියාය. 1984.01.12 වෙනි දින (අද) දවල් කෑමෙන් පසු මම නැවත කුඹුරේ (දෙල්ගහ අද්දර කුඹුරේ) ගොයම් කැපීමට යන විට වේල්ලේදී එකවිට කම්බියක් ඇඟේ පැටලුනා. මට කථා කරගන්ට බැරිඋනා. මා ඇද වැටුනා. සිහියද නැතුව ගියා. කීපදෙනෙකු විසින් මා උස්සාගෙන ගොඩට ගෙන එනවිට මට සිහිය ආවා. මා දැක්කා මම වැටී සිටිය කිට්ටුවෙන්ම වෙලේ වතුරේ තාත්තා උඩ අතට සිහිය නැතුව වැටී සිටින බව. වෙනත් අයවලුත් කීපදෙනෙක් මම සහ තාත්තා කාර් එකක දමාගෙන ගාලු රෝහලට ගෙනාවා. මම රෝහලට පැමිණෙන විට දවල් 14.30 ට පමණ ඇත. මම 18 වෙනි වාට්ටුවට ඇතුලත් කළා. මට වාට්ටුවේදී ආරංචිවුවා තාත්තා මැරී ඇති බව. මම වහාම ටිකට් කප්පවා ගත්තා. තාත්තාද ජීවත්වන්නේ මම සමගයි. අම්මාද ජීවත් වන්නේ මම සමගයි. මට ළමයි නැත. පුරුෂයා මා සමග දැනට ජීවත් වන්නේ නැත. වැඩ කරන අය මට කිව්වා මා බේරාගැනීමට පැමිණි තාත්තාට විදුලි සැර වැදී තාත්තාට සිහිය නැතුව ගිය බව. තාත්තාගේ මේ මරණය සිදුවී ඇත්තේ එම විදුලි සැර වැදීමෙනි. තාත්තාගේ දකුණු කකුලේ කලවේ අඟල් පහක පමණ ප්‍රමාණයක විදුලි සැරයෙන් පිලිස්සී ගොස් ඇත. තාත්තාගේ මරණයට මා කිසිකෙනෙක් අවිශ්වාස නොකරන අතර එය විදුලි සැරය වැදීමෙන් සිදුවූ මරණයක් ලෙස මා ස්ථිර වශයෙන්ම දන්වා සිටිමි.

අත්/ කේ. ජී. මාලිනී.

කනත්කෙලියන ආරච්චිගේ මහින්දපාල, වයස අවුරුදු 30 යි. රැකියාව ගොවිතැන, ලිපිනය : වල්පිටවත්ත, පිටිදූව, හබරාදූව මෙසේ ප්‍රකාශ කරයි.

මියගොස් ඇති හැන්ඩි මගේ මාමාය. අද දවල් 13.30 ට පමණ මම බත් කා නැවත කුඹුරේ වැඩට යෑම පිණිස ආවා. මම ද වැඩ කලේ අක්කලාගේම කුඹුරේය. අක්කා මට ප්‍රථමයෙන් වැඩට ගියා. මම බුලත්විටක් කෑම සඳහා සමීපයේ ඇති අක්කලාගේම කඩයට ගියා. මට එකවිටම ඇසුනා වෙලේ වැඩකරන අනික් උදවිය කෑගසනවා. කෑගැසුවේ මාලිනී වෙලේ වැටිලාය කියමිනි. මේ ඇසෙනවාත් සමගම හැන්ඩි මාමා එතැනට දිව්වා. මමද පසු පස දිව්වා. දුර ප්‍රමාණය යාර 20 ක් පමණ ඇත. මම යනවිට මාමා සහ අක්කා යන දෙදෙනාම වෙලේ වැටී සිටියා. මමද අක්කාගේ කකුලෙන් ඇද්ද, මම අඩි 3 ක් පමණ විසිවී ඇද වැටුනා මම නැගිට ගොස් පොල්පිත්තක් රැගෙන කම්බියට ගැසුවෙමි. එවිට අක්කාගේ අනිත් කම්බිය ඈතට විසිවුනි. නමුත් මාමාත් කම්බියේ පැටලිලා සිටියා. මම අක්කා උස්සාගෙන ගොඩට ආවා. මේ අතර කීප දෙනෙක් දුවගොස් විදුලිය නැති කළා. ඊට පසු වෙන අයවලුත් ගොස් මාමා උස්සාගෙන ගොඩට ගෙනාවා. මගේ ඇඟේ මඩ තිබුන බැවින් මම රෝහලට ආවේ නැත. වෙනත් අය අක්කා සහ මාමා රැගෙන ගාලු රෝහලට පැමිණියා. මම ද පසුව රෝහලට පැමිණියා. එවිට මා දැනගත්තා මාමා මැරුන බව. මේ හදිසිම නිසා කිසි කෙනෙකුට හබරාදූව පොලීසියට පැමිණිල්ලක් කිරීමට නොහැකිවුවා. මාමාගේ මරණය සිදුවූයේ විදුලි සැරය වැදීමෙනි. මෙම මරණයට කිසිම වෙනත් අවිශ්වාසයක් නැත.

අත්/ කේ. ඇල්. ඒ. මහින්දපාල.

සටහන — මම මෙම සාක්ෂිකරුවූ මහින්දපාල මහතාගේ ස්ථානෝචිත ප්‍රඥව ගැනත් ඔහුගේ මේ වීර ක්‍රියාව නිසා මාලිනීගේ ජීවිතය බේරාගත හැකි වූ බවත් ඒ ගැන ඔහුට ප්‍රශංසා කරන ලදී.

අත්/

ගාල්ල රෝහල් පොලිසියේ පොලිස් කොස්තාපල් 1774 ටයිටස් මහතා මෙසේ ප්‍රකාශ කරයි. මේ සිද්ධිය සිදුවී ඇත්තේ හබරාදූව පොලිස් වසම තුළ බැවින් මේ සිදුවීම ගැන පරීක්ෂණ පැවැත්වීමට නිලධාරියෙකු එවන මෙන් ඉල්ලා සිටියමුත් ස්ථානයේ නිලධාරීන් දැනට නොමැති නිසා මට මෙම පරීක්ෂණය කරන ලෙස දුරකථනයෙන් ඉල්ලා සිටින ලදී. අදාල දූ. ක. අංකය 127 ඒ අනුව මම විභාග පැවැත්තුවෙමි. මම ගොස් හැන්ඩිගේ මළ සිරුරද පරීක්ෂා කළෙමි. ඔහුගේ දකුණු කකුලේ කලවේ අඟල් 5 ක් පමණ දිගට සුදු පැහැති තුවාල කැලලක් තිබුනි. මවිසින් පවත්වන ලද පරීක්ෂණ අනුව මෙම මරණය විදුලි සැර වැදීමෙන් සිදුවී ඇති මරණයක් ලෙස විශ්වාස කරමි.

අත්/

ඉහත සඳහන් සාක්ෂි අනුව මෙය වෙලේ වැටී ඇති විදුලි ආලෝක කම්බියක් පැටලීමෙන් විදුලි ආලෝක සැර වැදීමෙන් සිදුවූ හදිසි මරණයක් ලෙස තීරණය කර, මේ අනතුර ගැන තවදුරටත් පරීක්ෂණ පැවැත්වීමට හබරාදූව පොලිස්ථානාධිපතිට උපදෙස් දී එම මෘතදේහය හබරාදූවේ පිටිදූව කෝදගොඩ වත්තේ භූමිදාන කිරීම සඳහා ගෙනයෑමට මියගිය අයගේ දුව වන කෝදගොඩ ගමගේ මාලිනී යන අයට බලය පැවරුවෙමි.

අත්/ ඇන්. ඩී. විජේනායක
12.01.84

ඉහත සඳහන් වන්නේ ගාල්ල මහේස්ත්‍රාත් අධිකරණයේ ඩබ–23/94
12/1

දරන හදිසි මරණ පරීක්ෂණ වාර්තාවේ සත්‍ය පිටපතක් බව සහතික කරමි. මුද්දර ගාස්තු රහිතව රාජකාරී කටයුත්තක් සඳහා නිකුත් කරමි.

පී. වී. කේ. ජයසේකර,
රෙජිස්ට්‍රාර්,
මහේස්ත්‍රාත් අධිකරණය,
ගාල්ල.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

## උප ලේඛණය
## அட்டவணை
## SCHEDULE

| | |
|---|---|
| 1. මරණය සිදුවූ දිනය හා ස්ථානය<br>இறந்த திகதியும் இடமும் (கிராமம் அல்லது வாட் பிரிவு, தெரு, வீட்டிலக்கம்)<br>Date and Place of Death (Village or Ward, Street and No. of House) | 84.01.12<br>මහ මෝදර රෝහල, ගාල්ල |
| 2. සම්පූර්ණ නම * හා පදිංචි ස්ථානය<br>முழுப் பெயரும் வதிவிடமும்<br>Full name* and residence | කෝදගොඩ ගමගේ හැන්ඩි<br>කෝදගොඩ වත්ත,<br>පිටිදූව, හබරාදූව. |
| 3. ස්ත්‍රී පුරුෂ භාවය හා ජාතිය †<br>பால், சாதி†<br>Sex and race | පුරුෂ. සිංහල |
| 4. වයස<br>வயது<br>Age | අවුරුදු 69 |
| 5. තත්ත්වය නොහොත් වෘත්තිය<br>அந்தஸ்து அல்லது தொழில்<br>Rank or profession | ගොවිතැන |
| 6. මව්පියන්ගේ සම්පූර්ණ නම<br>பெற்றோரின் முழுப் பெயர்<br>Parents' full names — පියා / தந்தை / Father | කෝදගොඩ ගමගේ දෙන් ආබුහමි. |
| මව / தாய் / Mother | තිත්තගල්ලෙ ගමගේ ගිමාරා. |
| 7. මරණයට හේතුව † (මිනීමැරීමද සියපන හානිකර ගැනීමද නැතහොත් හදිසි මරණයක්ද යන්න සදහන් කරනු)<br>மரணத்துக்குக் காரணம் (மரணம் கொலையினாலோ, தற்கொலையினாலோ அல்லது விபத்தினாலோ என்பதைக் குறிப்பிடுக)<br>Cause of death (also state whether the death is due to homicide, suicide or accident) | විදුලි සැර වැදීමෙන් සිදුවූ හදිසි මරණයක්. |

මරණ පරීක්ෂක තැනගේ සහතිකය [39 (1) සහ 41 (1)[1] (උ) වගන්ති]

மரண விசாரணைக்காரரின் அத்தாட்சிப் பத்திரம் [ பிரிவுகள் 39 (1), 41 (1) (உ)],

Inquirer's Certificate of Death [Sections 39(1) and 41(1)(*e*)]

ගාල්ල නගර සභා සීමා තුළ මරණ පරීක්ෂක වන නාගගේ ධර්මදස විජේනායක නැමති මම* අද දින අපරාධ නඩු විධාන සංග්‍රහයේ විධිවිධාන යටතේ, කෝදගොඩවත්ත, පිටිදූව, හබරාදූව පදිංචිව සිටි කෝදගොඩ ගමගේ හැන්ඩි නමැත්තාගේ මෘත ශරීරය පිළිබඳව විභාගයක් පැවැත්වූ බවද මෙහි පෙනෙන උපලේඛනයේ සදහන් විස්තර කරුණු සැබෑ බව හා නිවැරදි බවද මෙයින් සහතික කරමි. තවද එකී මෘත ශරීරය කෝදගොඩවත්ත, පිටිදූව, හබරාදූව භූමදාන කිරීම සදහා බලයද මෙයින් පවරමි.

1984 ක්වූ ජනවාරි මස 12 දින.
ගාල්ල දීය.

අ.ක./ඇන්. ඩී. විජේනායක
මරණ පරීක්ෂක තැන

## ග්‍රාමාරක්ෂක කොමිටි
## கிராமப் பாதுகாப்புக் குழுக்கள்
## VIGILANCE COMMITTEES

135/85

5. **ලක්ෂ්මන් ජයකොඩි මහතා**
(திரு. லக்ஷ்மன் ஜயக்கொடி)
(Mr. Lakshman Jayakody)

ජාතික ආරක්ෂාව පිළිබඳ ඇමතිතුමා සහ රාජ්‍ය ආරක්ෂක නියෝජ්‍ය ඇමතිතුමාගෙන් ඇසූ ප්‍රශ්නය :

(අ) ග්‍රාම ආරක්ෂක කටයුතු දැනට ක්‍රියාත්මක වන දිස්ත්‍රික්ක මොනවාදැයි එතුමා සදහන් කරනවාද?

(ආ) එම දිස්ත්‍රික්කවලින් ග්‍රාම ආරක්ෂක කටයුතු සදහා දැනට බඳවා ගෙන ඇති අයගේ නම් සහ ලිපිනයන් එතුමා සදහන් කරනවාද ?

(ඉ) එසේ නොවේ නම් ඒ මන්ද?

தேசிய பாதுகாப்பு அமைச்சரும், பிரதிப் பாதுகாப்பு அமைச்சருமானவரைக் கேட்ட வினா :

(அ) கிராமப் பாதுகாப்புச் சம்பந்தமாகத் தற்பொழுது செயல்படும் மாவட்டங்கள் யாவை ?

(ஆ) இம்மாவட்டங்களில் கிராமப் பாதுகாப்புக்காகத் தற்பொழுது சேர்க்கப்பட்டவர்களின் பெயர், முகவரிகளை அவர் குறிப்பிடுவாரா ?

(இ) இன்றேல், ஏன் ?

asked the Minister of National Security and Deputy Minister of Defence :

(*a*) Will he state the districts where Vigilance Committees are now in force ?

(*b*) Will he state the names and addresses of those who have been appointed for vigilance activities in those districts ?

(*c*) If not, why ?

එම්. වින්සන්ට් පෙරේරා මහතා (පාර්ලිමේන්තු කටයුතු හා ක්‍රීඩා ඇමතිතුමා සහ ආණ්ඩු පාර්ශ්වයේ ප්‍රධාන සංවිධායකතුමා)
(திரு. எம். வின்சன்ற் பெரேரா — பாராளுமன்ற அலுவல்கள், விளையாட்டுத்துறை அமைச்சரும் பிரதம அரசாங்கக் கொறடாவும்)
(Mr. M. Vincent Perera Minister of Parliamentary Affairs & Sports and Chief Government Whip)

I answer on behalf of the Minister of National Security and Deputy Minister of Defence.

(*a*) Vigilance Committees are in force in the following districts :

| | |
|---|---|
| 1. Colombo | 10. Ratnapura |
| 2. Gampha | 11. Kegalle |
| 3. Kalutara | 12. Moneragala |
| 4. Nuwara Eliya | 13. Badulla |
| 5. Kandy | 14. Puttalam |
| 6. Matale | 15. Kurunegala |
| 7. Hambantota | 16. Anuradhapura |
| 8. Galle | 17. Polonnaruwa |
| 9. Matara | 18. Amparai |

(*b*) The names and addresses of those who have been appointed are held by the respective police stations in areas where these Vigilance Societies have been formed.

(*c*) Does not arise.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

ලක්ෂ්මන් ජයකොඩි මහතා
(திரு. லக்ஷ்மன் ஜயக்கொடி)
(Mr. Lakshman Jayakody)

Will he get the names of those who are in these Committees ?

එම්. වින්සන්ට් පෙරේරා මහතා
(திரு. எம். வின்சன்ற் பெரேரா)
(Mr. M. Vincent Perera)

It will take a little time.

ලක්ෂ්මන් ජයකොඩි මහතා
(திரு. லக்ஷ்மன் ஜயக்கொடி)
(Mr. Lakshman Jayakody)

I ask this question in all earnestness, because I want to ask the Hon. Minister whether he is aware of the various people of various hues who have joined these Vigilance Committees ? There are undesirables–

සරත් මුත්තෙට්ටුවෙගම මහතා (කලවාන)
(திரு. சரத் முத்தெட்டுவெகம — கலவான)
(Mr. Sarath Muttetuwegama–Kalawana)

Mostly *kukul horas !*

ලක්ෂ්මන් ජයකොඩි මහතා
(திரு. லக்ஷ்மன் ஜயக்கொடி)
(Mr. Lakshman Jayakody)

–Some who are robbers, some who have been convicted, charged in courts, and some who have been in the remand prison and now released on bail. In fact, various types of people are there in these Committees. If there are such people who have been appointed to these Committees, will the Hon. Minister take necessary steps to see that they are removed immediately because they are a danger to these Vigilance Committees ?

එම්. වින්සන්ට් පෙරේරා මහතා
(திரு. எம். வின்சன்ற் பெரேரா)
(Mr. M. Vincent Perera)

I will ask the hon. Minister to take necessary steps. If you want the names it will take a long time to get them from the various districts.

දිනේෂ් ගුණවර්ධන මහතා (මහරගම)
(திரு. தினேஷ் குணவர்த்தன — மஹரகம)
(Mr. Dinesh Gunawardene–Maharagama)

They have boards of directors also.

මන්ත්‍රීවරයෙක්
(அங்கத்தவர் ஒருவர்)
(A Member)

These names are all given by the MPs.

සරත් මුත්තෙට්ටුවෙගම මහතා
(திரு. சரத் முத்தெட்டுவெகம)
(Mr. Sarath Muttetuwegama)

I suppose there must be a very great deal of vigilance being enforced !

ලක්ෂ්මන් ජයකොඩි මහතා
(திரு. லக்ஷ்மன் ஜயக்கொடி)
(Mr. Lakshman Jayakody)

They are recommended by the Members of Parliament, but do hon. Members know their background and whether they were charged in court ?

## ග්‍රාම සංවර්ධන සමිති : ව්‍යාපාර පිරිවැටුම් බද්ද
## கிராம அபிவிருத்திச் சபைகள்
## RURAL DEVELOPMENT SOCIETIES : BTT

139/85

6. ලක්ෂ්මන් ජයකොඩි මහතා
(திரு. லக்ஷ்மன் ஜயக்கொடி)
(Mr. Lakshman Jayakody)

ග්‍රාම සංවර්ධන පිළිබඳ ඇමතිතුමියගෙන් ඇසූ ප්‍රශ්නය :

(අ) ග්‍රාම සංවර්ධන සමිති වලින් ව්‍යාපාර පිරිවැටුම් බද්දක් අයකරන බව එතුමිය දන්නවාද?

(ආ) ග්‍රාම සංවර්ධන සමිති සමාජ සේවා ආයතන බැවින් එම බද්ද වහාම ඉවත් කිරීම පිණිස එතුමිය කටයුතු කරනවාද?

(ඇ) එසේ නොවේ නම් ඒ මන්ද?

கிராம அபிவிருத்தி அமைச்சரைக் கேட்ட வினா :

(அ) கிராம அபிவிருத்திச் சபைகளிடம் வியாபார மொத்த விற்பனை வரி அறவிடுவதை அவர் அறிவாரா ?

(ஆ) கிராம ,அபிவிருத்திச் சங்கம் சமூக சேவை நிறுவனமாக இருப்பதனால் குறித்த வரியை அறவிடாதிருக்க நடவடிக்கை எடுப்பாரா ?

(இ) இன்றேல், ஏன் ?

asked the Minister of Rural Development :

(*a*) Is she aware that a Business Turnover tax is being charged from Rural Development Societies ?

(*b*) Will she take action to immediately withdraw that tax as Rural Development Societies are social service institutions ?

(*c*) If not, why ?

එම්. වින්සන්ට් පෙරේරා මහතා
(திரு. எம். வின்சன்ற் பெரேரா)
(Mr. M. Vincent Perera)

I answer on behalf of the Minister of Rural Development.

(*a*) Yes.

(*b*) No.

(*c*) Business Turnover Tax is levied on all the institutions including public sector institutions, co-operative societies, Rural Development Societies and charitable institutions engaged in business activities. However, in terms of the BTT Ordinance, BTT will not be levied on the institutions which undertake business activities less than Rs. 1 lakh a year.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

ලක්ෂ්මන් ජයකොඩි මහතා
(திரு. லக்ஷ்மன் ஜயக்கொடி)
(Mr. Lakshman Jayakody)

Is the Hon. Minister aware that the aims and objectives under the Rural Development Societies Ordinance do not include any activity to do business ? I certainly do not mind their doing voluntary work, but they have no power to do business. They are voluntary organizations. Doing business is against the law. Is the Hon. Minister aware of that ?

එම්. වින්සන්ට් පෙරේරා මහතා
(திரு. எம். வின்சன்ற் பெரேரா)
(Mr. M. Vincent Perera)

I will refer tht question to the Minister and see that it is answered. Today is Cabinet day. You cannot expect the Minister to be present.

කථානායකතුමා
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)

Today is Cabinet day. You cannot expect the Ministers to be present.

ලක්ෂ්මන් ජයකොඩි මහතා
(திரு. லக்ஷ்மன் ஜயக்கொடி)
(Mr. Lakshman Jayakody)

The important Ministers are there.

එම්. වින්සන්ට් පෙරේරා මහතා
(திரு. எம். வின்சன்ற் பெரேரா)
(Mr. M. Vincent Perera)

I am not that important !

## පනත් කෙටුම්පත් පිළිගැන්වීම

### சமர்ப்பிக்கப்பட்ட சட்டமூலங்கள்

### BILLS PRESENTED

### විශ්‍රාම වැටුප් (විශේෂ විධිවිධාන) පනත් කෙටුම්පත

### ஓய்வூதியம் (சிறப்பேற்பாடுகள்) சட்டமூலம்

### PENSIONS (SPECIAL PROVISIONS) BILL

"to provide for the reckoning of the services of civilian employees and ex-Servicemen of the British Government or in their Bases in Sri Lanka for the purpose of paying pension ; and for matters connected therewith or incidental thereto".

*පිළිගන්වන ලද්දේ අග්‍රාමාත්‍ය සහ පළාත් පාලන, නිවාස හා ඉදිකිරීම් ඇමතිතුමා සහ මහාමාර්ග කටයුතු පිළිබඳ ඇමතිතුමා සහ හදිසි අවස්ථා මහජන පරිපාලන ඇමතිතුමා වෙනුවට එම්. වින්සන්ට් පෙරේරා මහතා විසිනි.*

*1985 ජූනි 21 වන සිකුරාද දෙවන වර කියවිය යුතුයයිද, එය මුද්‍රණය කළ යුතුයයිද නියෝග කරන ලදී.*

*பிரதம அமைச்சரும் உள்ளூராட்சி, வீடமைப்பு, நிர்மாண அமைச்சரும் நெடுஞ்சாலைகள் அமைச்சரும் அவசரகால, சிவில் நிர்வாக அமைச்சருமானவர் சார்பில் திரு. எம். வின்சன்ற் பெரேரா அவர்களால் சமர்ப்பிக்கப்பட்டது. 1985 ஜூன் 21 வெள்ளிக்கிழமை இரண்டாம் முறையாக மதிப்பிடப்பட வேண்டுமெனவும் அச்சிடப்படவேண்டுமெனவும் கட்டளையிடப்பட்டது.*

*Presented by Mr. M. Vincent Perera, on behalf of the Prime Minister and Minister of Local Government, Housing and Construction and Minister of Highways and Minister of Emergency Civil Administration ; to be read a Second time upon Friday, 21st June 1985, and to be printed.*

## ලංකාවේ රෝමානු කතෝලික අග්‍ර රාජගුරු ප්‍රසාදීන් වහන්සේ සහ රාජගුරු ප්‍රසාදීන් වහන්සේලා පිළිබඳ (සංශෝධන) පනත් කෙටුම්පත

### இலங்கை உரோமன் கத்தோலிக்க அதிமேற்றிராணியார், மேற்றிராணியார்கள் (திருத்தம்) சட்டமூலம்

### ROMAN CATHOLIC ARCHBISHOP AND BISHOPS OF CEYLON (AMENDMENT) BILL

*පනත් කෙටුම්පත (ස්ථාවර කාරක සභාවෙහි දී) සංශෝධනය කළ ආකාරයෙන් සලකා බැලීමේ නියෝගය කියවන ලදී.*

*(நிலையற் குழுவில்) திருத்தப்பட்டவாறு, பரிசீலித்தற்கான கட்டளை வாசிக்கப்பட்டது.*

*Order for consideration, as amended (in the Standing Committee), read.*

එම්. වින්සන්ට් පෙරේරා මහතා (පාර්ලිමේන්තු කටයුතු හා ක්‍රීඩා ඇමතිතුමා සහ ආණ්ඩු පාර්ශ්වයේ ප්‍රධාන සංවිධායකතුමා)
(திரு. எம். வின்சன்ற் பெரேரா — பாராளுமன்ற அலுவல்கள், விளையாட்டுத்துறை அமைச்சரும் பிரதம அரசாங்கக் கொறடாவும்)
(Mr. M. Vincent Perera Minister of Parliamentary Affairs & Sports and Chief Government Whip)

I move,

"That the Report of the Standing Committee be accepted."

*ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.*
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

එම්. වින්සන්ට් පෙරේරා මහතා
(திரு. எம். வின்சன்ற் பெரேரா)
(Mr. M. Vincent Perera)

I move,

"That the Bill, as amended, be now read the Third time".

*ප්‍රශ්නය විමසන ලදින්, සභාසම්මත විය.*

*පනත කෙටුම්පත ඊට අනුකූලව සංශෝධිතාකාරයෙන් තුන්වන වර කියවා සම්මත කරන ලදී.*

*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*

*அதன்படி, சட்டமூலம் திருத்தப்பட்டவாறு மூன்றும் முறையாக மதிப்பிடப்பெற்று நிறைவேற்றப்பெற்றது.*

*Question put, and agreed to.*

*Bill as amended, accordingly read the Third time, and passed.*

## ලංකා සම්භාණ්ඩ සංයුක්ත මණ්ඩලය : වාර්ෂික වාර්තාව

### இலங்கை தோற்பொருட் கூட்டுத்தாபனம் : ஆண்டறிக்கை

### CEYLON LEATHER PRODUCTS CORPORATION : ANNUAL REPORT

*කල් තබන ලද විවාදය තව දුරටත් පවත්වනු පිණිස නියෝගය කියවන ලදී. ඊට අදාළ ප්‍රශ්නය [1985 ජූනි 4]*

*ஒத்திப்போடப்பட்ட விவாதம் மீளத் தொடங்குதற்கான கட்டளை வாசிக்கப்பட்டது. வினா—[4 ஜூன்]*

*Order read for resuming Adjourned Debate on Question– [4th June 1985]*

"1957 අංක 49 දරන රාජ්‍ය කාර්මික නීතිගත සංස්ථා පනතේ 30 (2) සහ 1971 අංක 38 දරන මුදල් පනතේ 14 (3) වැනි වගන්ති යටතේ 1985. 04. 11 වැනි දින ඉදිරිපත් කරන ලද 1982. 12. 31 වැනි දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා විගණකාධිපතිවරයාගේ නිරීක්ෂණ ඇතුළත් ලංකා සම්භාණ්ඩ සංයුක්ත මණ්ඩලයේ වාර්ෂික වාර්තාව අනුමත කළ යුතුය." [ඩෙන්සිල් ප්‍රනාන්දු මහතා]

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

" 1957 ஆம் ஆண்டின் 49 ஆம் இலக்க அரச கைத்தொழிற் கூட்டுத்தாபனச் சட்டத்தின் 30(2) ஆம் பிரிவினதும் 1971 ஆம் ஆண்டின் 38 ஆம் இலக்க நிதிச் சட்டத்தின் 14(3) ஆம் பிரிவினதும் நியதிகளுக்கு ஏற்ப 1985.04.11 ஆந் தேதி சமர்ப்பிக்கப்பட்ட 1982.12.31 இல் முடிவுற்ற ஆண்டுக்கான கணக்காய்வாளர் அதிபதியின் குறிப்பீடுகள் உள்ளடங்கிய இலங்கை தோற்பொருட் கூட்டுத்தாபனத்தின் ஆண் டறிக்கை அங்கீகரிக்கப்படுமாக " [திரு. என். டென்சில் பெர்ஞன்டோ]

"That in terms of section 30 (2) of the State Industrial Corporations Act, No. 49 of 1957, and section 14 (3) of the Finance Act, No. 38 of 1971, the Annual Report of the Ceylon Leather Products Corporation being report incorporating the Auditor-General's observations for the year ended 31.12.1982, which was presented on 11.04.1985, be approved."-(*Mr. N. Denzil Fernando.*)

ප්‍රශ්නය යළිත් සභාභිමුඛ කරන ලදී.

வினா மீண்டும் எடுத்தியம்பப்பெற்றது.

*Question again proposed.*

ලක්ෂ්මන් ජයකොඩි මහතා (අත්තනගල්ල)
(திரு. லக்ஷ்மன் ஜயக்கொடி — அத்தனகல்ல)
(Mr. Lakshman Jayakody-Attanagalla)

First and foremost, I find that the Hon. Minister is not here and there is no Deputy Minister also here. Shall we postpone this Debate, Sir ?

එම්. වින්සන්ට් පෙරේරා මහතා
(திரு. எம். வின்சன்ட் பெரேரா)
(Mr. M. Vincent Perera)

You can go ahead. He will be here to answer.

ලක්ෂ්මන් ජයකොඩි මහතා
(திரு. லக்ஷ்மன் ஜயக்கொடி)
(Mr. Lakshman Jayakody)

Sir, the Hon. Minister is not here. I can understand that. They should have at least appointed a Deputy Minister. This is what is happening.-(*Interruption*). There are various Ministers, Sir.

In fact, I came prepared with some suggestions partaining to the Leather Products Corporation, which we find is going through very severe constraints these days, so much so that we want them to consider strengthenning the corporation and to make it work. For one reason I can remember, sometime ago the Export Development Board decided that where the export of textiles, garments and leather products are concerted, there should be a concreted effort. There is a lot of scope in this country for the export of leather products mainly because our people are competent, but there are certain constraints and one of them is the lack of good hides and so on.

Sir, I feel that very soon we will have to pass a Bill in this House to stop the slaughter of cattle, which I think is a very good step that anyone could take in this country, not merely for religious reasons but also for reasons of health and other reasons like agricultural purposes. I think everyone of us will and should vote for such a Bill. Therefore, if we are not going to slaughter cattle in this country we must make some arrangement to see that the raw material for the manufacture of leather products comes into this country from other countries. This is something that we should do but I do not know whether this Ministry has thought about it. When they find that raw material is not available in this country normally what they do is to hand it over to the private sector. The private sector somehow or other gets the hides down. This has happened in almost all the industries. When the government cannot handle it has been handed over to the private sector. Although the government sector cannot handle it the private sector somehow gets the raw material ! I have a feeling, Sir, that very soon the Government will consider handing over even this Corporation to the private sector and ultimately ruin that also. Therefore Sir, I think, we have to bring to the notice of the Hon Minister that he should strengthen the exports and maintain a lot of vigilance in importing hides and raw materials.

I would also like to ask him another important question. Sometime ago I was made to understand that UNIDO had given some aid and grants to this Corporation. Now, what have they done with that money ? They had put up a vulcanizing plant. I can remember this happened sometime ago and they wanted to increase the capacity of this Corporation by 50 per cent. Now, I have a feeling that very soon this Corporation will have to close down, unless they look sharp because certain other joint ventures have been opened in this country and taken over the manufacture of shoes. Now, I know that those joint ventures are not involved in leather products. Therefore, we have no fear about that matter. But very soon if the Ceylon Leather Products Corporation fail in the production of canvas shoes and soon they may even try to get permission from the GCEC or FIAC and produce leather products and collar the market of the Corporation. Thus, one has to be extra careful with this open economy policy. Having an open economy as it is if anyone goes to some high-ups in this country and requests that it should be done, sometimes it will be done. They do not look into the other aspects of what is going to happen to the existing organizations and so on. I think this Corporation should formulate a programme and see that they export the finished leather products. Sometime ago there was an Association of Manufacturers formed to study this problem. I do not know what they have done. I do not know whether the Hon, Minister met them. It is an association of those people who are manufacturing leather products in this country. They should meet separately with the Minister and then meet jointly with the Corporation. I say this because there is fairly a strong sector of the private sector involved in the manufacture of leather products.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[ලක්ෂ්මන් ජයකොඩි මහතා]

Therefore, I think it is high time that we get a better and clearer picture of what the private sector has to say – the small private sector, the small shoe-maker, the small belt-maker, the small bag-maker, the small chrome-leather-maker. There are various types of people of that nature. I think we should ask the Corporation to discuss these matters with them, because I find that there is no connection or link nor a dialogue between the Corporation and the private sector. I think that is very necessary. I hope he will take steps to do so.

Finally, I would like to bring to the notice of the Hon. Minister that in rupee terms, our exports are coming down. This is one area where the Government feels that there can be a very powerful area of operation to get more and more foreign currency to this country. But, I find, sir, from the progress that the income has dwindled and is coming down. I do not know what the Hon. Minister wishes to do about that matter. With this method of having the floating rupee and the variation of exchange rates that take place in this country, what we earned in 1979 or 1977 is about three times the value today in rupee terms. But though the value has gone up the quality may have come down, and at the same time you must realise that there is a massive inflation. Now, according to the projections that they have, they hope to earn Rs. 56 million this year and Rs. 61 million next year and Rs. 67 million the year after. Now, these are targets laid down. I want to know from the Hon. Minister whether he has achieved there target. You have not achieved these targets at all in rupee terms. Therefore, Sir, I think a total reorganization of this Leather Products Corporation has to take place.

Now, yesterday, for instance, when I asked an adjournment question he gave me an answer saying that a person is going to be paid compensation legally because he died when they were constructing a tank in the tannery. Now, they explained to these workers and said that this is a very serious thing to fix this tank, because it may collapse. The engineer of the Corporation I am made to understand, had also been interdicted. But this worker died mainly because they could not put up that tank! Who are they? It is the General Engineering Lanka Limited who worked on a tender. So, therefore, Sir, I want to bring to the notice of the Hon. Minister that when he gives me a reply not to be vague in his replies but to be more precise, because we are definitely made to understand that even an engineer had been interdicted in the Leather Products Corporation with regard to the construction of this tank. Therefore, I hope the Hon. Minister will be given the correct information by the officials. I am not blaming the Hon. Minisiter. I am not blaming anyone. But you may not have been given the correct information by the Directors who are there. I do not know who the Directors are. You must find out the activities of the General Engineering Lanka Limited who did the construction work. I do not know who they are. Therefore, Sir, I hope the Hon. Minister will look into these matters in a more detailed manner.

සරත් මුත්තෙට්ටුවෙගම මහතා (කළවාන)
(திரு. சரத் முத்தெட்டுவெகம — கலவான)
(Mr. Sarath Muttetuwegama–Kalawana)

ගරු ඇමතිතුමාට බොහොම වැඩ බහුල තත්ත්වයක් තිබෙන බව පෙනෙනවා. එහෙ මෙහෙ යනවා. නියෝජ්‍ය ඇමති කෙනෙක් දීලත් නැහැ. ඒ නිසා එතුමාට හුඟක් වැඩ තිබෙනවා. ඒ නිසා මම බොහොම කෙටියෙන් කථා කරන්නටයි බලාපොරොත්තු වෙන්නේ. අක්මීමන ගරු මන්ත්‍රීතුමා (රිචඩ් පතිරණ මහතා) ඊයේ කියූ කාරණා මමත් අනුමත කරනවා. බොහොම වැදගත් කාරණා වගයක් ඒ ගරු මන්ත්‍රීතුමා ඉදිරිපත් කළා. මමත් ඒවා සියයට සියයක්ම අනුමත කරනවා. සම් භාණ්ඩ සංයුක්ත මණ්ඩලයේ නිෂ්පාදන පාවිච්චි කර කුඩා කර්මාන්ත, මධ්‍යම ප්‍රමාණයේ කර්මාන්ත සහ තරමක විශාල කර්මාන්ත පටන් ගත් සියලු දෙනාටම අද ඒවා අත්හරින්නට සිදු වී තිබෙනවා. ඒක මේ සංස්ථාවේ වරදක් නොවෙයි, තමුන්නාන්සේලා අනුගමනය කරන ප්‍රතිපත්තියේ වරදක්. තමුන්නාන්සේලාගේ විවෘත ආර්ථික ප්‍රතිපත්තියේ වරදක්. මම හිතන හැටියට තමුන්නාන්සේලා සම් භාණ්ඩ සංස්ථාවත් කවුරු හෝ මුදලාලි කෙනෙකුට ලඟදීම පූජා කරයි. තවත් මොකක්ද කුඩා කර්මාන්ත ආයතනයක් විසුරුවා හරින්ට අවසර ඉල්ලීමේ යෝජනාවක් අද අපි මේ සාකච්ජා කරන න්‍යාය පත්‍රයේ තිබෙනවා. ජාතික සුළු කර්මාන්ත සංයුක්ත මණ්ඩලය විසුරුවා හරින්නටයි ඒ යෝජනාව තිබෙන්නේ. ඒ කියන්නේ උළු කර්මාන්ත ආදී සියල්ලක්ම පුද්ගලික අංශයට පූජා කරන්නටයි යන්නේ. මොකක්ද මේ තමුන්නාන්සේලා කරන වැඩය? තමුන්නාන්සේලාගේ ආණ්ඩුව භංග වෙන්න ඉස්සෙල්ලා, මේ රටේ ජනතා ව්‍යාපාර, ජනසතු ව්‍යාපාර, පොදු අංශය සම්පූර්ණයෙන්ම විසුරුවා හරින්නට තමයි, කටයුතු කරන්නේ. දූන් හදිසියේ [බාධා කිරීමක්]

**එන්. ඩෙන්සිල් ප්‍රනාන්දු මහතා (කර්මාන්ත හා විද්‍යා කටයුතු ඇමතිතුමා)**
**(திரு. என். டென்சில் பெர்னாண்டோ — கைத்தொழில், விஞ்ஞான அலுவல்கள் பிரதி அமைச்சர்)**
(Mr. N. Denzil Fernando – Minister of Industries & Scientific Affairs)

මේක 1972 ජූනි මාසයේ 21 වනදා කැබිනට් මණ්ඩලය විසින් ගත් තීරණයක්. අපේ ආණ්ඩුව නොවෙයි, ඊට කලින් තිබුණු ආණ්ඩුව.

සරත් මුත්තෙට්ටුවෙගම මහතා
(திரு. சரத் முத்தெட்டுவெகம)
(Mr. Sarath Muttetuwegama)

ඒක සුළු දෙයක්.

**එන්. ඩෙන්සිල් ප්‍රනාන්දු මහතා**
**(திரு. என். டென்சில் பெர்னாண்டோ)**
(Mr. N. Denzil Fernando)

මම එන්නම් ඒකට. යන්න එපා පොඩ්ඩක් ඉන්න. 1972 දීයි එය විසුරුවා හැර තිබෙන්නේ. අපි මේ 'ලික්විඩේටර්' කෙනෙක් 'ඇපොයින්ට්' කරන්නටයි කටයුතු කරන්නේ.

සරත් මුත්තෙට්ටුවෙගම මහතා
(திரு. சரத் முத்தெட்டுவெகம)
(Mr. Sarath Muttetuwegama)

ඒක ගැන නොවෙයි මම මේ කථා කරන්නේ. ඒකත් අද න්‍යාය පත්‍රයේ තිබෙනවා.

**එන්. ඩෙන්සිල් ප්‍රනාන්දු මහතා**
**(திரு. என். டென்சில் பெர்னாண்டோ)**
(Mr. N. Denzil Fernando)

න්‍යාය පත්‍රයේ දමන්නට එපායැ. ඒකේ වැඩ ඉවර කරන්නටයි යන්නේ. අවුරුදු ගණනාවකට ඉවර කරලා නැහැ.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

සරත් මුත්තෙට්ටුවෙගම මහතා
(திரு. சரத் முத்தெட்டுவெகம)
(Mr. Sarath Muttetuwegama)

අවුරුදු 8 ක් තමුන්නාන්සේලා බලයේ ඉඳලා ගරු ඇමතිතුමා ආවාම තමයි, මේ කුණු ගොඩවල් ඔක්කෝම හාරලා අවුස්සලා ගත්තේ ; මේවා විසුරුවන්න යන්නේ.

එන්. ඩෙන්සිල් ප්‍රනාන්දු මහතා
(திரு. என். டென்சில் பெர்ணாண்டோ)
(Mr. N. Denzil Fernando)

' ලික්විඩේටර් ' කෙනෙක් ' ඇපොයින්ට් ' කරලා මේක ඉවර කරන්නේ නැතිව ඉන්නද කියන්නේ ?

දිනේෂ් ගුණවර්ධන මහතා
(திரு. தினேஷ் குணவர்த்தன)
(Mr. Dinesh Gunawardene)

අමාත්‍යාංශයත් ඉවර කරලා දන්නයි යන්නේ.

එන්. ඩෙන්සිල් ප්‍රනාන්දු මහතා
(திரு. என். டென்சில் பெர்ணாண்டோ)
(Mr. N. Denzil Fernando)

මේක 1972 කැබිනට් මණ්ඩල තීරණයකින් විසුරුවා හැරිය එකක්. ඉතින් අපි මොකද කරන්නේ ?

සරත් මුත්තෙට්ටුවෙගම මහතා
(திரு. சரத் முத்தெட்டுவெகம)
(Mr. Sarath Muttetuwegama)

බොහොම හොඳයි. තමුන්නාන්සේට පරණ දේවල් ඔක්කෝම අහුවෙලා. දැන් ඒවා ඔක්කෝම අනුමත කරන්නට යනවා. මම කියන්නට යන්නේ මෙයයි. ජනසතු අංශය ඉවර කරලා දන්න මේ ආණ්ඩුව දැන් සීඝ්‍රයෙන් කටයුතු කරනවා. තමුන්නාන්සේලාගේ කාලයත් සීමා වී තිබෙන බව තමුන්නාන්සේලා දන්නවා. ඒක ඉවර වෙන්න ඉස්සෙල්ලා ජනසතු අංශය ඉවර කරන්නට කටයුතු කරනවා. මෙතෙක් කල් ප්‍රතිපත්තිය හැටියට තිබුණේ පාඩු විඳින ආයතන පෞද්ගලික අංශයට දීමයි. දැන් මොකක්ද කරන්නේ ? මේ රටේ රාජ්‍ය අංශයේ යම් ආයතන ලාභ ලබනවා නම් ඒවායින් එකක් තමයි ඉස්කාගාර සංස්ථාව. ඒ කවුරු ඒක කළත්, කොයි තරම් අදක්ෂ විධියට කළත්, ගුදම පිවිත්ම ගිනි ගත්තත් මිනිසුන් අරක්කු බොන නිසා ඒකෙන් ලාභ ලැබෙනවා. දැන් ඒකත් විදේශීය සමාගමකට දෙන්න යනවා. දැන් මේ කථා කරන වේලාවේත් ඒක විශ්වාස නැහැ. අද කැබිනට් මණ්ඩලයෙන් ඒක තීරණය කළාද දන්නෙත් නැහැ. අද එහෙම තීරණය කළාද කියා මම තමුන්නාන්සේගෙන් අහනවා.

එන්. ඩෙන්සිල් ප්‍රනාන්දු මහතා
(திரு. என். டென்சில் பெர்ணாண்டோ)
(Mr. N. Denzil Fernando)

තමුන්නාන්සේත් මමත් අධිතිතිඥ මහත්වරු. ඕවා මගෙන් අහලා පලක් නැති බව තමුන්නාන්සේත් දන්නවා. කැබිනට් එකේ සිදු වන ඒවා අපට තමුන්නාන්සේලාට කියන්නට බැහැනේ.

සරත් මුත්තෙට්ටුවෙගම මහතා
(திரு. சரத் முத்தெட்டுவெகம)
(Mr. Sarath Muttetuwegama)

කැබිනට් එකේ සිදු වන ඒවා දැන් ඔක්කෝම දන්නවා. අද උදේ සිදු වුණ දේවල් ඔක්කෝම දන්නවා. අපි මේ ගරු සභාව ඇතුළේ සිටි නිසා අපි දන්නේ නැහැ. එළියේ සිටිය මිනිසුන් දන්නවා. මේක ඇතුළේ සිටි නිසයි අපට දැන ගන්නට බැරි වුණේ. නැත්නම් මෙලහකට දන්නවා.

එන්. ඩෙන්සිල් ප්‍රනාන්දු මහතා
(திரு. என். டென்சில் பெர்ணாண்டோ)
(Mr. N. Denzil Fernando)

මගෙන් හම්බවෙන්නේ නැහැ එහෙම.

සරත් මුත්තෙට්ටුවෙගම මහතා
(திரு. சரத் முத்தெட்டுவெகம)
(Mr. Sarath Muttetuwegama)

අපරාදේ කියන්න බැහැ, තමුන්නාන්සේගෙන් හම්බවෙන්නේ නැහැ. විනය ගරුක ඇමතිතුමා. තමුන්නාන්සේ වැඩිය කථා කරන්නේත් නැහැ. ඒකේ කෙරුණු ඒවා මොනවාද කියා තමුන්නාන්සේ එළියට ආවාම දන්නේ නැති නිසා බාගවිට තමුන්නාන්සේගෙන් අහන්නෙත් නැතිව ඇති.

එන්. ඩෙන්සිල් ප්‍රනාන්දු මහතා
(திரு. என். டென்சில் பெர்ணாண்டோ)
(Mr. N. Denzil Fernando)

ඒක නම් බොරුවක්.

සරත් මුත්තෙට්ටුවෙගම මහතා
(திரு. சரத் முத்தெட்டுவெகம)
(Mr. Sarath Muttetuwegama)

මම අහන්නෙ මේ සංස්ථා ඔක්කොම විසුරුවා හරින්නට තමුන්නාන්සේලා තීරණයක් ගත්තාද කියලයි. එහෙම නැත්නම් තීරණයක් නොගෙනම වැඩේ කරනවාද ? දැන් ඉස්කාගාර සංස්ථාව විසුරුවා හරින්න යන්නෙ මොකද ? [බාධා කිරීමක්] ඒක හරිම ලස්සන තර්කයක්. ඉස්කාගාර සංස්ථාව විසුරුවා හරින්නෙ මොකද ? එය පෞද්ගලික අංශයට පවරා දෙන්නෙ මොකද කියා ඇසුවාම කව්දෝ රජයේ එක්කෙනෙක් බීම නිෂ්පාදනය කිරීම බෞද්ධ රටක ආණ්ඩුවකට ඔබින වැඩක් නොවෙයි කියනවා.

චන්ද්‍ර රණතුංග මහතා (මාවනැල්ල)
(திரு. சந்திர றணதுங்க — மாவனல்ல)
(Mr. Chandra Ranatunga-Mawanella)

කවුද එහෙම කියන්නෙ ?

සරත් මුත්තෙට්ටුවෙගම මහතා
(திரு. சரத் முத்தெட்டுவெகம)
(Mr. Sarath Muttetuwegama)

රජය.

[බාධාකිරීමක්] තමුන්නාන්සේ එය පිළිගන්නෙ නැහැ. තමුන්නාන්සේ කියන්නෙ බීම හදන එක හොඳයි කියලද ?

චන්ද්‍ර රණතුංග මහතා
(திரு. சந்திர றணதுங்க)
(Mr. Chandra Ranatunga)

එහෙම නොවෙයි, රජයෙන් එහෙම දෙයක් කියල නැහැ කියන එකයි අපි කියන්නෙ.

ගාමිණී අතුකෝරල මහතා (නියෝජ්‍ය යෞවන කටයුතු හා රැකීරක්ෂා ඇමතිතුමා)
(திரு. காமினி அத்துக்கோறல — இளைஞர் அலுவல்கள், தொழில் வாய்ப்புப் பிரதி அமைச்சர்)
(Mr. Gamini Atukorale-Deputy Minister of Youth Affairs & Employment)

කොහොම හරි ඉස්කාගාර සංස්ථාවේ සභාපතිතුමාට පහර ගහන්නයි මේ මන්ත්‍රීතුමා හදන්නෙ.

සරත් මුත්තෙට්ටුවෙගම මහතා
(திரு. சரத் முத்தெட்டுவெகம)
(Mr. Sarath Muttetuwegama)

මම කියන්නෙ මේ ලංකා සම්භාණ්ඩ සංයුක්ත මණ්ඩලය දැන් ඉතාම—

මන්ත්‍රීවරයෙක්
(அங்கத்தவர் ஒருவர்)
(A Member)

ඉස්කාගාර සංස්ථාවේ සභාපතිතුමා සමග තරහ ඇති.

සරත් මුත්තෙට්ටුවෙගම මහතා
(திரு. சரத் முத்தெட்டுவெகம)
(Mr. Sarath Muttetuwegama)

එහෙම නම් මම ඉස්කාගාර සංස්ථාව පෞද්ගලික අංශයට දෙනවාට කැමති වෙන්න එපායැ. එතකොට එතුමාට ' ජොබ් ' එක නැතිවෙනවා නේ. මම කැමති එතුමාට සභාපති තනතුරේම රැඳී සිටින්නට පුළුවන් වෙන්න

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[සරත් මුත්තෙට්ටුවෙගම මහතා]

ඉස්කාගාර සංස්ථාව ඉතුරු වෙනවාටයි. එහෙම නැතිව එතුමාට ' ජොබ් ' එක නැතිව ගියොත් ඒකෙනුත් කරදර වෙන්නෙ මටයි. ඊට පස්සෙ එතුමා කලවානට නිතර එන්න පටන් ගනියි. දැන් නම් එතුමා ඉන්නෙ කොළඹයි.

ගරු කථානායකතුමනි, 1977 දි මේ ආණ්ඩුව බලයට එනවිට සම්භාණ්ඩ සංස්ථාවේ නිෂ්පාදන ඉතාම උසස් මට්ටමක තිබුණා. සපත්තු සෙරෙප්පු අංශයෙන් බැලුවත්, අතේ ගෙන යන බෑග් ආදි දේවල් ගැන බැලුවත්, විශාල පරිමාණයේ බෑග්, සූට්කේස් වැනි දේවල් සම්බන්ධයෙන් බැලුවත් ඉතාම උසස් මට්ටමේ නිෂ්පාදනයන් තිබුණා. ඒ වගේම සම්භාණ්ඩ වලින් ' කෝට් ' ' ඕවර් කෝට් ' ආදිය බොහොම හොඳට මේ සංස්ථාවෙන් නිෂ්පාදනය කළා.

**එන්. ඩෙන්සිල් ප්‍රනාන්දු මහතා**
**(திரு. என். டென்சில் பெர்னாண்டோ)**
(Mr. N. Denzil Fernando)

දැනුත් ඒවා කෙරෙනවා.

**සරත් මුත්තෙට්ටුවෙගම මහතා**
**(திரு. சரத் முத்தெட்டுவெகம)**
(Mr. Sarath Muttetuwegama)

නමුත් ඒ අයගේ ' රිටේල් ' සාප්පුවලට ගිහින් බැලුවොත් කිසිම දෙයක් නැහැ.

**එන්. ඩෙන්සිල් ප්‍රනාන්දු මහතා**
**(திரு. என். டென்சில் பெர்னாண்டோ)**
(Mr. N. Denzil Fernando)

එන්න මාත් සමග බලන්න යන්න.

**සරත් මුත්තෙට්ටුවෙගම මහතා**
**(திரு. சரத் முத்தெட்டுவெகம)**
(Mr. Sarath Muttetuwegama)

නුමුත්නාන්සේ සමග ගියොත් වැඩියෙන් බඩු දමයිද කියල මම දන්නෙ නැහැ. නමුත් අපි නිකම් පාරේ යන විට බැලුවාම නම් පේන්නෙ බඩු නැති බවයි.

**එන්. ඩෙන්සිල් ප්‍රනාන්දු මහතා**
**(திரு. என். டென்சில் பெர்னாண்டோ)**
(Mr. N. Denzil Fernando)

පාරෙ යද්දි පේන්නෙ නැතිව ඇති.

**සරත් මුත්තෙට්ටුවෙගම මහතා**
**(திரு. சரத் முத்தெட்டுவெகம)**
(Mr. Sarath Muttetuwegama)

ගරු කථානායකතුමනි, මම මේ විහිළුවක් කරනවා නොවෙයි. මම ගරු ඇමතිතුමාට කියන්නේ මේ සම්භාණ්ඩ සංයුක්ත මණ්ඩලයෙන් ඉතාම උසස් වර්ගයේ භාණ්ඩ නිෂ්පාදනය කිරීම දැන් අත්හැර තිබෙන බවයි. දැන් බෑග් වගේ දේවල් නිෂ්පාදනය කිරීමේදී අලුත් නිර්මාණ මොකුත් නැති බවයි පෙනෙන්නෙ. 1977 සෑදූ දේවල්මයි අදත් හදන්නෙ. ' කෝට් ' වගේ දේවල් සම්බන්ධයෙන් බැලුවත් එහෙමයි. සපත්තු සෙරෙප්පු අංශයෙන් බැලුවත් එහෙමයි. දැන් ලංකාවේ සපත්තු කුට්ටමක් ලාභයට ගන්න බැහැ. හම් සපත්තු කුට්ටමක් ලාභයට ගන්න බැහැ. ගරු ඇමතිතුමා අන්තිමට ගත්ත සපත්තු කුට්ටමේ මිල කීයද ?

**එන්. ඩෙන්සිල් ප්‍රනාන්දු මහතා**
**(திரு. என். டென்சில் பெர்னாண்டோ)**
(Mr. N. Denzil Fernando)

සපත්තුද ? සෙරෙප්පුද ?

**සරත් මුත්තෙට්ටුවෙගම මහතා**
**(திரு. சரத் முத்தெட்டுவெகம)**
(Mr. Sarath Muttetuwegama)

මම අහන්නෙ සපත්තු කුට්ටමේ මිලයි. සෙරෙප්පු හැමදම දමන්න බැහැ නේ.

**එන්. ඩෙන්සිල් ප්‍රනාන්දු මහතා**
**(திரு. என். டென்சில் பெர்னாண்டோ)**
(Mr. N. Denzil Fernando)

සපත්තු කුට්ටමක් රුපියල් හැටකට පමණ ගන්න පුළුවන්.

**ලක්ෂ්මන් ජයකොඩි මහතා**
**(திரு. லக்ஷ்மன் ஜயக்கொடி)**
(Mr. Lakshman Jayakody)

අඩුගානෙ අර අතේ උස්සා ගෙන යන බෑග් එකවත් වෙනස් කරන්න බලන්න.

**සරත් මුත්තෙට්ටුවෙගම මහතා**
**(திரு. சரத் முத்தெட்டுவெகம)**
(Mr. Sarath Muttetuwegama)

ඇත්තවශයෙන්ම මෙය හොඳට ආරක්ෂා කර ගන්න පුළුවන් සංස්ථාවක්. නමුත් එය සම්පූර්ණයෙන්ම දිරාපත් වෙන්නට ඉඩ දී—දැන් තොන්ඩමන් මහත්මයා කියා තිබෙනවා හය මාසයකින් අස්වෙලා යනවාය කියා—මෙම සංස්ථාවේ තත්ත්වය සම්පූර්ණයෙන්ම පහත දමා, නිෂ්පාදන මොකුත් නැති තත්ත්වයට පත් කර ළඟදීම පුද්ගලික අංශයට භාර දෙයි. ඒ නිසා ගරු ඇමතිතුමාට එක පොරොන්දුවක් දෙන්න පුළුවන්ද ? නුමුත්නාන්සේ ඉන්න තෙක් මේ සංස්ථාව පුද්ගලික අංශයට පවරන්න ඉඩ දෙන්නෙ නැතැයි කියා නුමුත්නාන්සේට කියන්න පුළුවන්ද ? බැහැ.

**එන්. ඩෙන්සිල් ප්‍රනාන්දු මහතා**
**(திரு. என். டென்சில் பெர்னாண்டோ)**
(Mr. N. Denzil Fernando)

Yesterday the hon. Members of the Opposition felt that this corporation was not doing well and that the Government was not interested in it. I will read the report of the corporation. Most probably they have not read the report of the corporation. It says–

"It is expected that with the implementation of the modernisation programme, the corporation would manufacture some of the products–"

(Mr. Anura Bandaranaike)

If you have the three months time, it can lead to various corrupt practices, so on and so forth.

වෛද්‍යාචාර්ය රංජිත් අතපත්තු මහතා
(டாக்டர் ரஞ்ஜித் அத்தபத்து)
(Dr. Ranjith Atapattu)

At the Committee stage I will move that that Clause be removed.

අනුර බණ්ඩාරනායක මහතා
(திரு. அனுர பண்டாரநாயக்க)
(Mr. Anura Bandaranaike)

The last point is this. I cannot blame the Hon. Minister for this because it is really a problem with the Legal Draftsmen. He has included under the Interpretation Clause that the two words "local authority" mean any Development Council, Municipal Council, Urban Council, Town Council or Village Council. Both these bodies – Village Councils and Town Councils – have been made defunct with the DDC Act coming into operation in 1980. I am surprised that the Legal Draftsman is not aware that Sri Lanka no longer has Town Councils or Village Councils. I think it would be proper to move an amendment at the proper stage to delete the words Town Councils and Village Councils because both have long ceased to exist in the local government jargon and lexicon of Sri Lanka many years ago.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

I would thank the Hon. Minister of Health who has been most kind and accomodating in trying to change some of the Clauses in the Bill and I very earnestly hope that with this Bill, not only with this Bill but in the years to come, he would be able to eradicate the malaria disease in Sri Lanka.

Thank you.

අ. භා. 2.26

**ආනන්ද දසනායක මහතා (කොත්මලේ)**
**(திரு. ஆனந்த தஸநாயக்க — கொத்மலே)**
(Mr. Ananda Dassanayake-Kotmale)

නියෝජ්‍ය කථානායකතුමනි, මැලතියොන් පාලනය කිරීම සඳහා හෙවත් ආනයනය කිරීම, එයින් වෙනත් කෘමි නාශක ද්‍රව්‍ය සෑදීම හා මැලතියොන්වලට අදාල වෙනත් කටයුතු පාලනය කිරීම සඳහායි, ගරු සෞඛ්‍ය ඇමතිතුමා මේ පනත් කෙටුම්පත ඉදිරිපත් කර තිබෙන්නේ. එය මීට කලින් ඉදිරිපත් කල යුතුව තිබුණත් මේ අවස්ථාවේදී හෝ එය ඉදිරිපත් කිරීම අපි අගය කරනවා. ඒ මොකද කිවොත් මිනිස් ජීවිත ආරක්ෂා කිරීම සඳහා සෞඛ්‍ය අමාත්‍යාංශය ගත් වැදගත් පියවරක් හැටියට එය හඳුන්වා දෙන්න පුළුවන් නිසයි. ඒ නිසා විරුද්ධ පාර්ශ්වයේ අපට තිබෙන්නේ මේ පනත් කෙටුම්පත ගැන විවේචනයක් කිරීමවත්, පනත ක්‍රියාත්මක කිරීමට අදාලව අනුගමනය කරන යම්කිසි වැරදි ක්‍රියා මාර්ගයක් ගැන කථා කිරීමවත් නොවෙයි.

ඇත්තවශයෙන්, අවුරුදු විසිපහක-තිහක කාලයක සිටම මැලේරියා මර්දන ව්‍යාපාරය ගැන අපි දන්නවා. සමහර විට ගමක් ගානේ ගිහින් පල් වන වතුර වළවලට, දිය කඩිතිවලට—ඇලවලට පවා—ඩී.ඩී.ටී. ඉසීමට කටයුතු කල කාලයකුත් තිබුණා. ඒ සඳහා නිලධාරීන් පත් කර හිටියා. එක්දස් නමසිය පණස් ගණන්වල මැලේරියා වර්ධනය, නැත්නම් බෝවීම බොහොම නදෙට තිබුණා.

ඒකට පළමුවැනි හේතුව පරිසරයේ අපවිත්‍රතාවයි ; දුර්වලකමයි. අක්මීමන ගරු මන්ත්‍රීතුමා (රිචඩ් පතිරණ මහතා) කිවා වාගේ පල් වන වතුර ඇති වළවල්, ටින්, පොල් කටු, පොල් ලෙලි—සමහර විට ඇලවල් පවා—ඊට මුල් වුණා. ඇත්තවශයෙන්ම කියනවා නම් ඒවා මදුරුවන්ගේ බීජ බිම් හැටියට හඳුන්වන්න පුළුවනි. ඒවායේ තමයි, මදුරුවන් ඇති වුණේ. ඒ නිසා මදුරුවන් බෝවීම නවත්වන්න පුළුවන් වන්නේ ඒවා නැති කිරීමෙන් පමණයි. නමුත් ඒ විධියට පොල් ලෙලි වළවල් නම් නැති කරන්න බැහැ. ඒ මගින් රක්ෂාව කර ගන්නා සෑහෙන පිරිසක් ඉන්නවා. එවැනි තැන්වලදී කරන්න තිබෙන්නේ ඒවා තුළ මදුරුවන් බෝවීම නැති කිරීමයි. එසේ මදුරුවන් බෝවීම මර්දනය කරන්න නම් ඩී.ඩී.ටී., මැලතියොන් වගේ දෙවල් ඉහින්න ඕනැ.

මැලතියොන් අනවශ්‍ය බෙහෙතක්—කෘමි නාශකයක්—හැටියට අපි සලකන්නේ නැහැ. එය අවශ්‍යයි. නමුත් එහි පාලනයක් තිබෙන්න ඕනැ. එහි පාලනයක් නැත්නම් ජනතාව අවාසනාවන්ත තත්ත්වයකට පත් වෙනවා. දැනටමත් එය සිදු වී තිබෙනවා. ඒ සම්බන්ධයෙන් අපට සාක්ෂි ලැබී තිබෙනවා.

නමුත්නාත්සේලා බොහොම ලොකුවට කෑ ගහනවා, ' අපේ රටේ අගනුවර—කොළඹ—අංග සම්පූර්ණ නගරයක් ' කියා. නමුත් කොළඹ සෞඛ්‍ය තත්ත්වය කොහොමද ? මම හිතන්නේ නැහැ, කොළඹ කිසිම නිවසක හවස් වුණාට පස්සේ නිදා ගන්න පුළුවන් කියා, පංකාවක් හෝ මදුරු දැලක් නැත්නම්. එහෙම නැත්නම් ' කොයිල් ' එකක්වත් පාවිච්චි කරන්න ඕනැ.

ශරීරයට අහිතකර විෂ ' කොයිල් ' වර්ගත් තිබෙනවා. ඒ අතර ශරීරයට හිතකර ඒවාත් තිබෙනවා. ඒ නිසා ඒවා තෝරා—බේරා ගෙන මිල දී ගන්නැයි සෞඛ්‍ය අමාත්‍යාංශයෙන් උපදෙස් දී තිබුණා, මම දැක්කා. ඒක බොහොම හොඳයි. දැන් අපේ මිනිස්සු ඒවා තෝරනවා. ඒ නිසා ඒ ' කොයිල් ' පවා විෂ ද්‍රව්‍යයක් හැටියට ඇතුලත් කල යුතුයයි මම හිතනවා. ඒ සම්බන්ධයෙනුත් නියෝගයක් නිකුත් කරන්න ඕනැ. ඒ නියෝගයට පිටුපා වැඩ කරන අයට විරුද්ධව නීති මගින් කටයුතු කරන්න ඕනැ. ඒකත් ඉතා වැදගත් දෙයක්.

විශේෂයෙන් කොළඹ නාරාහේන්පිට පැත්ත ගැන කල්පනා කලාම පල් වන වතුර වළවල් කොයි තරම් තිබෙනවාදැයි කියන්න බැරි තරම්. දැන් කොළඹ නගරයේ පාරවලත් කොතෙකුත් වතුර වළවල් තිබෙනවා. ඒවායේ මදුරුවන් බෝ වෙනවාද නැද්ද කියන එක සොයා ගන්න. ඒවා මහාමාර්ග නොවෙයි ; වාරි මාර්ග වෙලයි තියෙන්නේ. ඒවාගෙම දිය කඩිති බහුලව තිබෙනවා. ඒවාට ඩී. ඩී. ටී. කියන ජාතිය ඉසින්නේ නැහැ ; මැලතියන් ඉසින්නේ නැහැ. ඒ සම්බන්ධයෙන් නගර සභාව කිසිම වැඩ පිළිවෙලක් අරගෙන නැහැ. දැන් අවුරුදු තුන හතරක් තුළ එකම දවසකවත් ඔය සම්බන්ධ සෞඛ්‍ය සංරක්ෂණ කටයුතු කරන බවක් මම දැක්කෙ නැහැ. එහෙම නම්, ගරු ඇමතිතුමා මොන උත්සාහය ගත්තත් අදාල ආයතනවල සහාය ලැබෙන්නේ නැත්නම් මෙය කරන්න බැහැ. ඒ නිසා ඒ ආයතනවලට නියෝග කරන්න ඕනැ. ඒ සඳහා ගරු ඇමතිතුමාට බලය තිබෙනවා ; පුළුවන්කම තිබෙනවා. ඒ නිසා සෞඛ්‍ය සංරක්ෂණය සඳහා පියවර ගැනීම පසුගිය කාලයේදී මෙන් කරගෙන යන්න.

මැලේරියා මර්දන ව්‍යාපාරයේ යෙදී සිටි සේවකයන් වැඩි දෙනෙකු අස් කල බව මම දන්නවා. වැඩ නැතැයි කියා, මැලේරියාව ඉවරයි කියා හුඟ දෙනකු අස් කලා. මේ අය අස් කරන්නේ ඇයිද කියලා 1977 දීත් අපි විරුද්ධ වුණා. අස්කරනවා නම් ඔවුන්ට වෙනත් රැකියා දෙන්න කියාත් අපි කිව්වා. නමුත් රජය—ඒ දෙපාර්තමේන්තුව—කිසිම තේරුමක් නැතිව ඒ සේවකයන් අස්කලා. දැන් නැවතත් මැලේරියාව බෝවී ගෙන යනවා. මැලේරියා මදුරුවා කවදාවත් " අපේ ජාතිය විනාශයි ; අපේ වර්ගය විනාශයි " කියා නිශ්ශබ්දව ඉන්නේ නැහැ. උන් යම්කිසි කොටසක් ඉතිරි වෙනවා. ඉන් නැවත බෝවීම සිදු වෙනවා. ඒ නිසා මැලේරියාව නැත්තටම නැති කරන්න පුළුවන් රෝගයක් නොවෙයි. මැලේරියා මදුරුවන් විනාශ කිරීමේ ව්‍යාපාරය දිගටම යා යුතුමයි. පැරණි කාලයේදී—සුද්දාගේ කාලයේදී පවා—නගරබද පමණක් නොව ගම්බදත් මැලේරියා මර්දන කටයුතු තිබුණා. මැලේරියා මර්දන ආයතනය අද ඊයේ ඇති වුණු එකක් නොවෙයි. දැන් අවුරුදු පනහක් හැටක් ගත වී තිබෙන ආයතනයක්. ඒ නිසා සෞඛ්‍ය සංරක්ෂණ සංවිධාන වැඩි දියුණු කරනවා මිස ඒවා නැති කිරීම ප්‍රතිපත්තියක් වශයෙන් අනුගමනය කරන්න හොඳ නැහැ. අඩුම වශයෙන් අවුරුද්දකට වරක්වත් අවශ්‍ය තැන්වලට ඩී. ඩී. ටී. නැත්නම් මැලතියන් විදින ලෙස ගරු ඇමතිතුමාගේ බලතල අනුව ඒ ඒ ආයතනවලට නියෝග කරන්න පුළුවනි. ඒ ඒ ප්‍රදේශවල වතුර කඩිති ආදියට ඒවා ඉසින්න ඕනැ. එක් කාලයකදී ගෙවලට සම්පූර්ණයෙන්ම ඩී. ටී. ටී. ඉස්සා. සමහර විට අවුරුද්දකට වරක් පමණ එය කලා. දැන් ඒවා කෙරෙන්නේ නැහැ. ඒ නිසා සෞඛ්‍ය සංරක්ෂණය ඇති කරන්නට නම් නැවතත් ඒ ක්‍රම ඇති කල යුතු වෙනවා.

මා හිතන හැටියට ගරු ඇමතිතුමාගේ මේ ගැන ලොකු උනන්දුවක් තිබෙනවා. ඒවාගේම වෛද්‍යාචාර්යවරයෙකු වශයෙන් එතුමාට දැනුමක් තිබෙනවා. ලෙඩ රෝග කෙසේ වෙතත්, මදුරුවන් දෂ්ට නොකර නිද ගන්න පුළුවන් නම් ඒකත් ඇති. අපට ඕනැ කරන්නේ ඒකයි. ලෙඩ හැදුණාට පසු සුවකර ගන්නවාට වඩා ලෙඩ රෝග වළක්වා ගැනීම වැදගත් යයි කියමනක් තිබෙනවා. ලෙඩ රෝග වළක්වා ගැනීම සෞඛ්‍ය දෙපාර්තමේන්තුවේ පරමාර්ථයක්. ඒ නිසා මේ සම්බන්ධයෙන් සෞඛ්‍ය දෙපාර්තමේන්තුව අනෙකුත් ආයතනවලට නදින් නියෝග දෙන්න ඕනැ. ඒ සඳහා නීති රීති සකස් කරන්න ඕනැ. නීතිරීතිවල අඩුපාඩුකම් තිබෙනවා නම් ඒවා සකස් කර නිසි විධියට ක්‍රියාත්මක කරන ලෙස මම ඉල්ලා සිටිනවා.

මේ පනතේ 13 වැනි වගන්තිය වැඩක් නැහැයි මමත් අදහස් කලා. එය කාරක සභා අවස්ථාවේදී ඉල්ලා අස්කර ගන්නා බව ඇමතිතුමා කිව්වා. 13 (ආ) වගන්තිය මෙසේ කියැවෙනවා :

" එම වරද සිදුකිරීම සොයා ගත් දිනයේ සිට මාස තුනක කාල සීමාවක් ඉකුත් වීමෙන් පසු නඩු පැවරීමක් කරනු නොලැබිය යුතුය. "

එහෙම නම් ඕනැම හොරෙකුට, වරද කරන පුද්ගලයකුට ලෙස්සලා යන්න ඉඩ තිබෙනවා. ගරු ඇමතිතුමා ඒ ගැන කල්පනා කිරීම ඉතා වැදගත් වෙනවා. ඒ සංශෝධනය කාරක සභා අවස්ථාවේදී කරන බව කීම ගැන ගරු ඇමතිතුමාට මගේ ස්තුතිය හිමි කරනවා.

**වෛද්‍යාචාර්ය රංජිත් අතපත්තු මහතා**
**(டாக்டர் ரஞ்ஜித் அத்தபத்து)**
(Dr. Ranjith Atapattu)

Mr. Deputy Speaker, wish to thank the hon. Members of the Opposition for the very valuable contributions they have made. Since so much has been spoken of the Anti-Malaria Campaign and malaria in general, I would like to clarify a few points.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[වෛද්‍යාචාර්ය රන්ජිත් අතපත්තු මහතා]

One is that the eradication of malaria in Sri Lanka first occurred in 1945 with the introduction of DDT. In the process of one year the death rate in this country fell from 21 per thousand to 14 per thousand ; that is it fell by 7 per thousand which is an achievement that no country in the world has ever achieved in the course of one year – purely by the introduction of DDT in the year 1945.

The, from 1945 onwards till the early 1960s malaria was under control. Then again it reared its head in 1968. It was adequately dealt with at that time and brought under control and subsequently again in 1975.

After that, in 1977 when this Goverment came to power, I know in my electorate we had 80 per cent of the households having malaria mosquitoes. In 1982 the World Health Organization advised us that we have brought malaria under reasonable control and as such to phase out the spraying of Malathion. In 1982 we phased out the spraying of Malathion, but unfortunately the unprecedented drought, which resulted in the drying up of rivers in the Kegalle District, resulted in a resurgence and at the moment we are in the middle of it. I might report to the House that the first three months of this year have shown a decrease of malaria compared to the first three months of last year.

**අනිල් මුණසිංහ මහතා**
**(திரு. அனில் முனசிங்ஹ)**
(Mr. Anil Moonesinghe)

Are you taking steps to carry out any research on the biological control of malaria ?

**වෛද්‍යාචාර්ය රංජිත් අතපත්තු මහතා**
**(டாக்டர் ரஞ்ஜித் அத்தபத்து)**
(Dr. Ranjith Atapattu)

We are carrying out research on the biological control of malaria, but it is not one of our main arms of activity. At the moment our concentration is mainly on the spraying of Melathion and health education.

The Hon. Leader of the Opposition mentioned the necessity to obtain the co-operation of the people. This we are doing in a big way. We have had seminars with the village leaders in many districts, and some of the members of the Opposition have participated in them in some of the remote areas where we have stressed the importance of getting into grips with this problem and enlisting the co-operation that is necessary from the community if we are to eradicate malaria.

Again, the hon. Member for Kotmale mentioned that the other organizations and other departments must be alerted to this problem. We have had joint discussions. We had a seminar the other day and had a joint discussion with the various other organizations such as the Gem Corporation. I must say that all these organizations have been coming forward with very useful suggestions and I can envisage greater co-operation in this matter.

Regarding the amendment to the Act, I have been advised by the Legal Draftsman that we could make it six months rather than three months, that it is not advisable to remove it entirely.

Then, the hon. Member for Akmeemana mentioned the problem of Filaria which I know concerns him. I have called a meeting in the course of the next two weeks to pay some special attention to this problem which the Member for Habaraduwa also raised on an earlier occasion.

On this occasion I wish to point out that the trade name is Malathion as opposed to the generic name. The generic name of Malthion is Dimethyl-s-phosphoro-dithidoae. Now, I think it will cause more legal problems if we put that into the Act. So far all the manufacturers of this drug or this insecticide have used the word "Malathion". All the stocks of Malathion that are imported to this country are imported on the US Aid Agreement. I think we can be fairly sure about any subterfuges not being attempted in the import of Malathion.

On this occasion, since so much has been spoken about this, I wish to thank the Government of the United States for their generous contribution. We have annual reviews with the World Health Organization and the donor countries as to the progress of the Anti-Malaria Campaign. There are a lot of shortcomings. I will be the first to admit that, but we are making every effort to overcome them. One of our biggest problems has been the running down of our equipment. We did not have a vehicle which was newer than 15 years. All our spraying equipment was very out-dated.

I am very thankful to the Government of Japan for giving us a gift of Rs. 40 million consisting of vehicles, spraying equipment and anti-Malarian drugs which we have just received. And they have promised a further similar donation this year. So it is with this help and the assistance of the people of this country that we hope to eradicate Malaria.

While thanking all hon. Members for their very valuable contributions, I commend this Bill to the House.

**සරත් මුත්තෙට්ටුවේගම මහතා**
**(திரு. சரத் முத்தெட்டுவெகம)**
(Mr. Sarath Muttetuwegama)

I was not here, Sir, and I wish to raise two matters. One is with regard to the personnel in the Anti-Malarian Campaign. Those people who are

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

involved in spraying have a Trade Union. This Union has sought an interview with the Hon. Minister, I believe, over some problems that they have and the Hon. Minister had undertaken to give that interview for a discussion with them. I think it has not yet materialized. Will the Hon. Minister look into that ?

The other matter does not really concern malaria or Malathion. That is the question of the present virus flues that are ravaging the country. The so called Dengue fever and various things have had very serious consequences. There have been children who have been crippled or paralysed as a result of this flu. There are other people who have just died after having two days of fever and some kind of dysentry or bowel disease. Yesterday I saw a statement by Dr. Tissa Vitharana, the head of the MRI, asking people to be careful. What is the Ministry and the MRI doing about this present wave of Dengue flu – I do not know the names of these flues because they seem to be strains of a new virus but rather dangerous and frightening for lay people.

**වෛද්‍යාචාර්ය රංජිත් අතපත්තු මහතා**
**(டாக்டர் ரஞ்ஜித் அத்தபத்து)**
(Dr. Ranjith Atapattu)

Mr. Deputy Speaker, with regard to the interviews, that the hon. Member mentioned, I have met several Unions of the Anti-Malarian Campaign and if there are any others, if they just give me a reminder I will certainly meet them.

As far as this flu is concerned, the Medical Research Institute is taking steps to find out whether they can isolate this virus. And even isolating a virus is not going to help because we have no vaccine for this type of thing. It will only have to be the exercise of a considerable amount of care on the part of the people to prevent the infection, and the advice that had been given by the MRI will have to be followed very carefully and also the advice that has been given from time to time by the Ministry in this matter. If any further information is forthcoming I would most certainly enlighten the House. I commend this Bill to the House.

***ප්‍රශ්නය විමසන ලදින්, සභාසම්මත විය.***

***පනත් කෙටුම්පත ඊට අනුකූලව දෙවන වර කියවන ලදී.***

***வினா விடுக்கப்பட்டு, ஏற்றுக்கொள்ளப்பட்டது.***

***அதன்படி, சட்டமூலம் இரண்டாம் முறையாக மதிப்பிடப்பெற்றது.***

*Question put, and agreed to.*
*Bill accordingly read a Second time.*

***මතු පළවන යෝජනාව සභාසම්මත විය :***

***"පනත් කෙටුම්පත පූර්ණ පාර්ලිමේන්තු කාරක සභාවකට පැවරිය යුතුය."–[වෛද්‍යාචාර්ය රංජිත් අතපත්තු]***

***தீர்மானிக்கப்பட்டது :***

***"சட்டமூலம் முழுப் பாராளுமன்றக் குழுவுக்குச் சாட்டப்படுமாக." [வைத்தியகலாநிதி ரஞ்ஜித் அத்தபத்து]***

*Resolved :*

"That the Bill be referred to a Committee of the whole Parliament."–[*Dr. Ranjith Atapattu.*]



**කාරක සභාවෙහිදී සලකා බලන ලදී.**
***[නියෝජ්‍ය කථානායකතුමා මූලාසනාරූඪ විය.]***

***குழுவில் ஆராயப்பட்டது.***
***[பிரதிச் சபாநாயகர் அவர்கள் தலைமை வகித்தார்கள்.]***

*Considered in Committee.*
*[Mr. Deputy Speaker in the Chair.]*

***1 සිට 8 තෙක් වගන්ති, පනත් කෙටුම්පතෙහි කොටසක් හැටියට තිබිය යුතු යයි නියෝග කරන ලදී.***

***1 ஆம் வாசகத்திலிருந்து 8 ஆம் வாசகம் வரை சட்டமூலத்தின் பகுதியாக இருக்க வேண்டுமென கட்டளையிடப்பட்டது.***

*Clauses 1 to 8 ordered to stand part of the Bill.*

**9 වන වගන්තිය.–(අනුමත කළ විශ්ලේෂක)**

**வாசகம் 9. — [அங்கீகரிக்கப்பட்ட பகுப்பாளர்]**

CLAUSE 9–[*(Approved Analyst)*]

**අනිල් මූණසිංහ මහතා**
**(திரு. அனில் முனசிங்ஹ)**
(Mr. Anil Moonesinghe)

I thought the Hon. Minister undertook to include the services of personnel from the Universities.

**වෛද්‍යාචාර්ය රංජිත් අතපත්තු මහතා**
**(டாக்டர் ரஞ்ஜித் அத்தபத்து)**
(Dr. Ranjith Atapattu)

No, no ! I think I explained that in this way. I do not think we should include that in the Act because it might cause problems when you go to court. In getting reports I think we can get the Government Analyst to get the co-operation of these people because it will be finally the Government Analyst who will have to go to court on this matter.

**අනිල් මූණසිංහ මහතා**
**(திரு. அனில் முனசிங்ஹ)**
(Mr. Anil Moonesinghe)

How can you do that ?

**වෛද්‍යාචාර්ය රංජිත් අතපත්තු මහතා**
**(டாக்டர் ரஞ்ஜித் அத்தபத்து)**
(Dr. Ranjith Atapattu)

They can get the assistance of the University.

**අනිල් මූණසිංහ මහතා**
**(திரு. அனில் முனசிங்ஹ)**
(Mr. Anil Moonesinghe)

But legally that will not be possible.

**වෛද්‍යාචාර්ය රංජිත් අතපත්තු මහතා**
**(டாக்டர் ரஞ்ஜித் அத்தபத்து)**
(Dr. Ranjith Atapattu)

As long as the Government Analyst stands by his report it will be possible. I do not think we can include them because–

**අනිල් මූණසිංහ මහතා**
**(திரு. அனில் முனசிங்ஹ)**
(Mr. Anil Moonesinghe)

Clause 9(3) says :

**"No person shall be approved as an Additional Approved Analyst unless he possesses the prescribed qualifications".**

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

වෛද්‍යාචාර්ය රංජිත් අතපත්තු මහතා
(டாக்டர் ரஞ்ஜித் அத்தபத்து)
(Dr. Ranjith Atapattu)

Yes.

අනිල් මුණසිංහ මහතා
(திரு. அனில் முனசிங்ஹ)
(Mr. Anil Moonesinghe)

So these persons shall possess those qualifications ?

වෛද්‍යාචාර්ය රංජිත් අතපත්තු මහතා
(டாக்டர் ரஞ்ஜித் அத்தபத்து)
(Dr. Ranjith Atapattu)

That is right. They can be approved as Additional Approved Analysts. There is no problem.

*9 වන වගන්තිය, පනත් කෙටුම්පතෙහි කොටසක් හැටියට තිබිය යුතු යයි නියෝග කරන ලදී.*

*9 ஆம் வாசகம், சட்டமூலத்தின் பகுதியாக இருக்க வேண்டுமென கட்டளையிடப் பட்டது.*

Clause 9 ordered to stand part of the Bill.

*10 සිට 12 තෙක් වගන්ති පනත් කෙටුම්පතෙහි කොටසක් හැටියට තිබිය යුතුයයි නියෝග කරන ලදී.*

*10 ஆம் வாசகத்திலிருந்து 12 ஆம் வாசகம் வரை சட்டமூலத்தின் பகுதியாக இருக்க வேண்டுமென கட்டளையிடப்பட்டது.*

Clauses 10 to 12 ordered to stand part of the Bill.

**13 වන වගන්තිය.–(නඩු කටයුතු පැවරීම)**

**வாசகம் 13. — [வழக்கு நடவடிக்கைகளைத் தொடுத்தல்]**

CLAUSE 13.–(*Institution of Proceedings*)

වෛද්‍යාචාර්ය රංජිත් අතපත්තු මහතා
(டாக்டர் ரஞ்ஜித் அத்தபத்து)
(Dr. Ranjith Atapattu)

I move,

"In page 4, line 37, leave out "three" and insert "six".

*සංශෝධනය පිළිගත යුතුය යන ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.*

*திருத்தம் விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*

*Amendment put, and agreed to.*

*13 වන වගන්තිය, සංශෝධිතාකාරයෙන් පනත් කෙටුම්පතෙහි කොටසක් හැටියට තිබිය යුතු යයි නියෝග කරන ලදී.*

*13 ஆம் வாசகம், திருத்தப்பட்டவாறு சட்டமூலத்தின் பகுதியாக இருக்க வேண்டுமென கட்டளையிடப்பட்டது.*

*Clause 13 as amended, ordered to stand part of the Bill.*

*14 සිට 18 තෙක් වගන්ති පනත් කෙටුම්පතෙහි කොටසක් හැටියට තිබිය යුතුයයි නියෝග කරන ලදී.*

*14 ஆம் வாசகத்திலிருந்து 18 ஆம் வாசகம் வரை சட்டமூலத்தின் பகுதியாக இருக்க வேண்டுமென கட்டளையிடப்பட்டது.*

*Clauses 14, to 18 ordered to stand part of the Bill.*

**19 වන වගන්තිය.–(අර්ථ නිරූපණය)**

**வாசகம் 19. — [பொருள் கோடல்]**

CLAUSE 19.–(*Interpretation*)

අනිල් මුණසිංහ මහතා
(திரு. அனில் முனசிங்ஹ)
(Mr. Anil Moonesinghe)

Sir, in Clause 19 the words "Town Council or Village Council" have to be deleted. There are no town councils or village councils now. I move that those words be deleted. I do not think the Minister can have any objection to that.

නියෝජ්‍ය කථානායකතුමා
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(Mr. Deputy Speaker)

There is no harm in keeping them.

වෛද්‍යාචාර්ය රංජිත් අතපත්තු මහතා
(டாக்டர் ரஞ்ஜித் அத்தபத்து)
(Dr. Ranjith Atapattu)

Their presence will not cause any broblems. Let it be as it is.

*19 වන වගන්තිය, පනත් කෙටුම්පතෙහි කොටසක් හැටියට තිබිය යුතු යයි නියෝග කරන ලදී.*

*19 ஆம் வாசகம், சட்டமூலத்தின் பகுதியாக இருக்க வேண்டுமென கட்டளையிடப் பட்டது.*

*Clause 19 ordered to stand part of the Bill.*

*ප්‍රඥප්ති වගන්තිය සහ නාමය පනත් කෙටුම් පතෙහි කොටසක් හැටියට තිබිය යුතුයයි නියෝග කරන ලදී.*

*පනත් කෙටුම්පත, සංශෝධන සහිතව, වාර්තා කරන ලදී.*

*சட்டமாகு வாசகமும் தலைப்பும் சட்டமூலத்தின் பகுதியாக இருக்க வேண்டுமென கட்டளையிடப்பட்டது.*

*சட்டமூலம் திருத்தங்களுடன் அறிக்கை செய்யப்பட்டது.*

*Enacting Clause and Title ordered to stand part of the Bill.*

*Bill reported with Amendment.*

වෛද්‍යාචාර්ය රංජිත් අතපත්තු මහතා
(டாக்டர் ரஞ்ஜித் அத்தபத்து)
(Dr. Ranjith Atapattu)

I move,

"That the Bill, as amended, be now read the Third time".

*ප්‍රශ්නය විමසන ලදින්, සභාසම්මත විය.*

*පනත් කෙටුම්පත ඊට අනුකූලව සංශෝධිතාකාරයෙන් තුන්වන වර කියවා සම්මත කරන ලදී.*

*வினா விடுக்கப்பட்டு, ஏற்றுக்கொள்ளப்பட்டது.*

*அதன்படி, சட்டமூலம் திருத்தப்பட்டவாறு மூன்றும் முறையாக மதிப்பிடப்பெற்று நிறைவேற்றப்பெற்றது.*

*Question put, and agreed to.*

*Bill, as amended accordingly read the Third time, and passed.*

## වෛද්‍ය (සංශෝධන) පනත් කෙටුම්පත

## மருத்துவம் (திருத்தம்) சட்டமூலம்

## MEDICAL (AMENDMENT) BILL

*දෙවන වර කියවීමේ නියෝගය කියවන ලදී.*

*இரண்டாம் மதிப்பிற்கான கட்டளை வாசிக்கப்பட்டது.*

*Order for Second Reading read.*

වෛද්‍යාචාර්ය රංජිත් අතපත්තු මහතා (සෞඛ්‍ය ඇමතිතුමා)
(டாக்டர் ரஞ்ஜித் அத்தபத்து — சுகாதார அமைச்சர்)
(Dr. Ranjith Atapattu-Minister of Health)

I move,

"That the Bill be now read a Second time".

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

I would like to give a brief explanation of this Bill. This is really an extract of the total Medical (Amendment) Bill which will be coming up before the House before long. The pharmacists have been agitating for a long time over an impediment, to their ability to be registered, and as such we have taken this out of the main amending Bill and brought it before the house at their specific request.

There is an amendment, of which I have given notice. After the drafting of the Bill it was brought to my notice that this Bill will cause certain hardships to certain categories. We have taken steps to do away with that situation. Basically, there is a category of people called apprentice pharmacists who work under traind pharmacists, and after two years they can sit for an examination and be registered as pharmacists. According to this Bill we would have done away with that category in a specified period of time. In view of the fact that the Government, particularly in enforcing its new ordinances, will need the services of more and more pharmacists, we have decided not to have a deadline on that but leave it for the Minister to decide as to when it can be enforced. That is the only explanation I would like to make.

*ප්‍රශ්නය සභාභිමුඛ කරන ලදී.*

வினா எடுத்தியம்பப்பெற்றது.

*Question proposed.*

අමරසිරි දොඩන්ගොඩ මහතා (බද්දේගම)
(திரு. அமரசிறி தொடங்கொட — பத்தேகம
(Mr. Amarasiri Dodangoda Baddegama)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, වෛද්‍ය පනත සංශෝධනය කරමින් ඖෂධවේදීන් පිළිබඳව පැහැදිලි ප්‍රතිපත්තියක් අනුගමනය කරන්නට යාම ගැන මේ අවස්ථාවේදී සෞඛ්‍ය ඇමතිතුමාට මම ස්තුතිවන්ත වෙනවා. මොකද, මේ ඖෂධවේදීන් හැටියට මේ රටේ කටයුතු කරන බොහෝ දෙනෙකුගේ ලියාපදිංචිය මෙතෙක් විධිමත් පරිදි සිදු වුණේ නැහැ. එය මෙතෙක් පමා වීම නිසා සෑහෙන දුරට හානිදායක තත්ත්වයක් උද්ගත වුණා. විශ්ව විද්‍යාල පනත යටතේ පිහිටුවන ලද විද්‍යාලයක් මගින් ඖෂධ විද්‍යාව පිළිබඳව ප්‍රදානය කරන ලද උපාධියක් හෝ ඩිප්ලෝමාවක් තිබී එහෙම නැත්තම් සෞඛ්‍ය දෙපාර්තමේන්තුවේ ඖෂධවේදීන් සඳහා පවත්වනු ලබන පුහුණුවීමේ පාඨමාලාවක් හැදෑරූ අධ්‍යාපන සුදුසුකම් සහිත පිරිස් මෙන්ම ඒ සුදුසුකම්වලින් තොර පරිබාහිර පිරිසද ඖෂධවේදීන් හැටියට මේ රටේ කටයුතු කළා. එමනිසා ඒ අයගේ ලියා පදිංචිය පිළිබඳව ගෙනෙනු ලබන සංශෝධනය විශේෂයෙන් වෛද්‍ය ආඥාපනතේ 7 වෙනි වගන්තිය සම්බන්ධයෙන් කරනු ලබන සංශෝධනය, ඉතාමත් කාලෝචිතය, ඉක්මනින් කළයුතුව තිබුණු සංශෝධනයක්.

වෛද්‍ය ආඥාපනතේ "Ceylon Medical Council" යන වචන වෙනුවට "Sri Lanka Medical Council" කියන වචන පාවිච්චි කරන්න යොද, බොහෝම කාලයක් ගත වී වරින් වර තවත් නොයෙක් සංශෝධන කර ඇති නමුත් මා දන්නා හැටියට 1976 සිට සංශෝධනය කර තිබෙන ඒ සියලුම කොටස් පිළිබඳ සංශෝධනය වාර්තා අමාත්‍යාංශයට ලැබී තිබුණත් මේ දක්වා ඒවා පාර්ලිමේන්තුවට ඉදිරිපත් කර නීතිගත වී නැහැ.

වෛද්‍යාචාර්ය රංජිත් අතපත්තු මහතා
(டாக்டர் ரஞ்ஜித் அத்தபத்து)
(Dr. Ranjith Atapattu)

කාරණය පැහැදිලි කරන්න කැමතියි. වෛද්‍ය පනත සංශෝධනය කිරීම සඳහා හිටපු සෞඛ්‍ය ඇමතිතුමා විසින් පත් කර තිබූ කොමිටියේ වාර්තාවට කැබිනට් අනුමැතිය ලබාගෙන සංශෝධන සකස් කිරීම සඳහා දැන් නීතිපතිට යවා තිබෙනවා.

අමරසිරි දොඩන්ගොඩ මහතා
(திரு. அமரசிறி தொடங்கொட)
(Mr. Amarasiri Dodangoda)

මම ඇමතිතුමාට ස්තුතිපූර්වකව කියන්න කැමතියි. 1976 සිට සැපයූ වාර්තා අනුව වෛද්‍ය ආඥාපනතට ඉක්මනින් සංශෝධනය සිදු කළ යුතුය කියා. ඒ වාගේම සෞඛ්‍ය අමාත්‍යාංශයට අදාළ වැදගත් කාරණයක් ගැන මේ සභාවේ අවධානය යොමු කරන්න කැමතියි. මෙය මෑත අවදියේ සිට සමහර දිස්ත්‍රික්කවල ක්‍රියාත්මක කරනවා. එනම්, වෛද්‍ය නිලධාරීන්ගෙන් තොරව පරිපාලන නිලධාරීන් යොදවා දිස්ත්‍රික්කයේ වෛද්‍ය කටයුතු පරිපාලනය කිරීමයි. දැනට වෛද්‍ය නිලධාරීන් වෙනුවට පරිපාලන නිලධාරීන් යොදවා කරගෙන යනවා. දිස්ත්‍රික්ක කීපයකටම දැන් ඒ අය පත් කර වැඩ ආරම්භ කර තිබෙනවා.

ඇත්ත වශයෙන්ම මේ ගරු ඇමතිතුමා වෛද්‍යවරයෙක් හැටියට අමාත්‍යාංශයේ කටයුතු සහ පරිපාලනයත් යන දෙකම භාරව සිටිනවා. මම හිතනවා ව්‍යාපාරිකයෙක්, වැවිලිකරුවෙක් හෝ එවැනි වෙනත් කෙනෙකුට වඩා සෞඛ්‍ය අමාත්‍යාංශයේ පරිපාලන කටයුතු පිළිබඳව වෛද්‍යවරයෙක් හැටියට එතුමාට තේරුමක් තිබෙනවා. එය අදාළයි. මේ රජය අමාත්‍යාංශ පැවරීමේදී ඉතාම සාර්ථක ආකාරයෙන් මේ අමාත්‍යාංශය සඳහා උචිත පුද්ගලයෙක් තෝරාගෙන තිබෙනවා. මේ කටයුත්ත ඉහළ ස්ථානයේ සිට පහළ ස්ථානයටම සිදු වෙනවානම් පමණයි, මෙහි වැදගත්කම සහ අගය තිබෙන්නේ. මම මේ කාරණය දක්වන්න කැමතියි: 1978 දී තමුන්නාන්සේලාගේ විධායක ජනාධිපතිතුමා, මේ රටේ ජනාධිපතිතුමා, අපෙත් ජනාධිපතිතුමා, සයන්ස් පොලිසි කියා විද්‍යාව පිළබඳ ප්‍රතිපත්තියක් ඉදිරිපත් කළා. ඒ "සයන්ස් පොලිසි" එක අනුව සිරිල් පොන්නම්පෙරුම මහතා කැඳෙව්වා. ඒ මහතා විදේශයක සේවය කරමින් සිටි ලාංකිකයෙක්. ඒ මහතා ලංකාවට කැඳවා රජයේ විද්‍යා උපදේශක හැටියට පත් කරනු ලැබුවා. ඒ පත් කිරීමත් සමඟම ඒ මහතා යෝජනා කළා, විද්‍යා කටයුතු පිළිබඳ, තාක්ෂණික කටයුතු පිළිබඳ, වෘත්තීන්ට සම්බන්ධ පිරිස් හා එකී දෙපාර්තමේන්තුවල පරිපාලනය කොයි විදියටද සිද්ධ වන්නට ඕනෑ කියන කාරණය. මෙහිදී පාවිච්චි කළ වචනය තමයි, "ටෙක්නොක්‍රැට්ස්" යන්න. අදාළ වෘත්තියට සම්බන්ධ දෙපාර්තමේන්තුවල පාලනය 'ටෙක්නොක්‍රැට්ස්' ලාට දෙන්නට ඕනෑය කියා යෝජනා කළා. අපි ඒ සඳහා පාවිච්චි කරන සිංහල වචනය 'තාක්ෂණ වේදීන්' කියන වචනයයි. තාක්ෂණ වේදීන් විසින් එකී විද්‍යානුකූල වැඩපිළිවෙළට අදාළ දෙපාර්තමේන්තුවල හෝ අමාත්‍යාංශ වල පරිපාලනය කළයුතුය කියන එකයි, යෝජනා කළේ. උදාහරණයක් වශයෙන් දිස්ත්‍රික්කයක තිබෙන මහා මාර්ග කටයුතු පිළිබඳ දෙපාර්තමේන්තුව ගනිමු. මහා මාර්ග කටයුතු සහ එකී දෙපාර්තමේන්තුවේ පරිපාලන කටයුතු සිදු කරනු ලබන්නේ ප්‍රධාන ඉංජිනේරු නැත විසිනුයි. ඔහු ඉංජිනේරුවෙක්. ඒවගේම විගණකාධිපති දෙපාර්තමේන්තුව ගනිමු. එය පාලනය කරනු ලබන විගණකාධිපතිතුමා විගණනය පිළිබඳ ප්‍රවීණ පුද්ගලයෙක්. එහෙම නැතුව පරිපාලන සේවයෙන් ගිය කෙනෙක් නොවෙයි; 'ලොන්ඩන් ප්ලේස්' එකේ තිබෙන ආයතනයෙන් පුහුණු කරනු ලැබූ කෙනෙක් නොවෙයි. විගණකාධිපතිතුමා විගණනය පිළිබඳ ප්‍රවීණ පුද්ගලයෙක්. එවැනි තත්ත්වයක් තිබියදී අපි දන්නා විධියට, දැනට ක්‍රියාත්මක වන පිළිවෙලට, ක්‍රමක්‍රමයෙන් සෞඛ්‍ය අමාත්‍යාංශයේ දිස්ත්‍රික් සේවා කටයුතු සඳහා දිස්ත්‍රික් නිලධාරීන් වශයෙන්, අධ්‍යක්ෂවරුන් වශයෙන්, පරිපාලන සේවයේ නිලධාරීන් පත් කර වෛද්‍යවරුන් ඒ අය යටතට ගෙන ඒමට කටයුතු කර තිබෙනවා. මම විශේෂයෙන් මේ කාරණය සඳහන් කරන්නට කැමතියි: අද දියුණුවුණු රටවල් වගේම දියුණු වෙමින් තිබෙන රටවලුත් ඒ අයගේ විද්‍යා ප්‍රතිපත්තිය — 'සයන්ස් පොලිසි' එක — මත කටයුතු කරලයි තිබෙන්නේ. එකී විද්‍යාවන් පිළිබඳ සුදුසුකම් ඇති, එකී විද්‍යාවන් පිළිබඳ පරිණත දැනුමක් ඇති පුද්ගලයින්ම එම ආයතනවල පාලකයන් බවට පත් කිරීමයි, එමගින් කරනු ලබන්නේ.

උදාහරණයක් වශයෙන් යම් ප්‍රදේශයක රෝගයක් පැතිරියනවායයි සිතමු. එම රෝගය මැලේරියාව වන්නට පුළුවන්; 'ඩයරියා' වන්නට පුළුවන්; එහෙම නැත්තම් කුමක් හෝ වසංගත රෝගයක් වන්නට පුළුවන්. ඒ පිළිබඳව හදිසි තීරණයක් ගන්නට සිදු වුණොත් එම කටයුතු භාරව පරිපාලන නිලධාරියෙක් වශයෙන් කටයුතු කරන ප්‍රාදේශීය අධ්‍යක්ෂවරයකුට වඩා සෞඛ්‍ය සේවා කටයුතු පිළිබඳ උපාධියක් තිබෙන වෛද්‍යවරයෙක් එම අංශයේ මූලිකයාව සිටිනවා නම් කාලානුරූපව, හා අවස්ථාවෝචිත විධියට එම ප්‍රශ්නයට මුහුණ දෙන්නට ඔහුට හැකියාවක් ලැබෙනවා. මීට ඉහත අවස්ථාවල දිස්ත්‍රික් සෞඛ්‍ය කටයුතු භාර අධ්‍යක්ෂවරුන් වශයෙන්

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[අමරසිරි දොඩන්ගොඩ මහතා]

වෛද්‍යවරුන් කටයුතු කරද්දී ඒ කාර්යාලවල සිටි පරිපාලන නිලධාරීන්ගේ සහාය ලබා ගත්තා. කළුතර දිස්ත්‍රික්කයේ 'ඩිරෙක්ටර් ඔෆ් හෙලත් සර්විසස්' හැටියට දැන් යොදා තිබෙන්නේ පරිපාලන සේවයේ නිලධාරියෙක්. ඔහු තව ටික දවසකින් වෙන තැනකට යනවා.

**පර්සි සමරවීර මහතා (නියෝජ්‍ය ස්වදේශ කටයුතු ඇමතිතුමා)**
**(திரு. பேர்சி சமரவீர — உள்நாட்டலுவல்கள் பிரதி அமைச்சர்)**
(Mr. Percy Samaraweera–Deputy Minister of Home Affairs)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මේ ගැන සුළු විස්තරයක් කරන්න සඳහා සුළු වේලාවක් ඉල්ලා සිටින්නට කැමතියි. පරිපාලන සේවයට පරිපාලන නිලධාරීන් පත් කිරීම පිළිබඳ ඉල්ලීම සෞඛ්‍ය සේවා අමාත්‍යාංශයෙන් කළේ, රාජ්‍ය සේවා වෘත්තීය සමිති සම්මේලනයයි. විශේෂයෙන් මේ ඉල්ලීම කරන්නට හේතුවුණේ මෙන්න මේ නිසයි : අද සෞඛ්‍ය දෙපාර්තමේන්තුවට දොස්තරවරුන් ඉතාමත් අවශ්‍යව තිබෙනවා. විශේෂඥ දොස්තරවරුන් 51 දෙනෙක් පමණ දිස්ත්‍රික්කවල සේවය කරනවා. දොස්තරවරුන් අඩුව තිබියදී පරිපාලන කටයුතු කරන්නට – දෙපාර්තමේන්තු නිලධාරීන් මාරු කිරීම ගොඩනැගිලි හැදීම ආදී දේ කරන්නට – දොස්තර මහත්වරුන් යෙදවීම කාලෝචිත නොවන බව අපි කල්පනා කළා. දිස්ත්‍රික්කවල " එස්එච්එස් "මහත්වරුන්ට කරන්නට තිබෙන්නේ එවැනි පරිපාලන කටයුතුයි. ඒ විධියට කල්පනා කර මේ ක්‍රමය ක්‍රියාත්මක කළ බව මතක් කරන්නට කැමතියි.

අමරසිරි දොඩන්ගොඩ මහතා
(திரு. அமரசிறி தொடங்கொட)
(Mr. Amarasiri Dodangoda)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ඇත්ත වශයෙන්ම මා මේ ප්‍රශ්නය පිළිබඳව සඳහන් කළේ වෛද්‍යවරුන් පිළිබඳ හිඟයක් අපේ රටේ තිබෙන නිසයි. එවැනි හිඟයක් තිබියදීත් පරිපාලන කටයුතු සඳහා වෛද්‍යවරුන් නිරතවීමේ ප්‍රශ්නයක් ඇතිවීම නිසා එවැනි ඉල්ලීමක් කළාය කියා නියෝජ්‍ය ඇමතිතුමා සඳහන් කළා.

මේ ප්‍රශ්නය අනික් අංශවලත් තියෙන්න පුළුවන්. නමුත් වෙනත් රටවල ක්‍රියාකාරීත්වය, ඒ රටවල විද්‍යාඥයින් සහ විද්‍යා ක්ෂේත්‍රයේ උගතුන් පිළිබඳ වැඩපිළිවෙළ ගැන කළකන විට මෙම සංශෝධනවල පොඩි වරදක් තිබෙන බව පෙනෙනවා. නිදසුනක් වශයෙන් මා මුලින්ම සඳහන් කළ පරිදි, අපේ ගරු ඇමතිතුමා වෛද්‍යවරයෙක් හැටියට ප්‍රවීනයි. ඒ වාගේම වෛද්‍යවරුන්ගේ සංගමයෙන් හිටපු ලේකම් කෙනෙක්. එතුමාට සෞඛ්‍ය අමාත්‍යාංශයේ ප්‍රශ්න පිළිබඳව, පරිපාලන කටයුතු පිළිබඳව අත්දැකීම් ලබන්න ඉතාම සුළු කාලයක් ගත වෙනවා. ඒ සුළු කාලය තුළ එතුමා ඒ අත්දැකීම් ලබල ඒ වැඩ කටයුතු පාලනය කරනවා. ඒ වාගේම මේ පරිපාලන නිලධාරීන් – මේ සේවයට යොදවනු ලැබූ පිරිස් තව මාස හයකින් ක්‍රම සම්පාදන අමාත්‍යාංශයට අනුයුක්ත කරන්න පුළුවන්. එම නිසා ඒ අයගේ සේවය " ක්ලෝස් සර්විස් " එකක් කරන්න ඕනෑ. ඒ අය ඒ සේවයට වෙන් වූ සේවයක් කරන්න ඕනෑ. එහෙම නොකළොත් ඒ පිරිස්වල සේවය නැවත වාරිමාර්ග දෙපාර්තමේන්තුවට හෝ රාජ්‍ය පරිපාලන අමාත්‍යාංශය යොමු කරන වෙනත් ස්ථානයකට වෙන්න පුළුවන්. එය මේ ප්‍රශ්නයට විසඳුමක් නොවෙයි. වෛද්‍යවරුන්ට එම්.බී.බී.එස්. උපාධිය ලබා ගන්න පුළුවන් නම්, මාසයක් ඇතුළත මේ රටේ පරිපාලන සිද්ධාන්ත පිළිබඳව ඉගෙන ගන්න එක සුළු දෙයක්. මේ කාර්ය කිරීමේදී වෛද්‍යවරුන්ට පෞද්ගලික ප්‍රතිකාර කිරීම් නැති වී යන නිසා ඒ අයට අවාසියක් ඇති වෙනවා. එම නිසා මේ තත්ත්වය ගැටලුක් ඇති නොවෙන්න ඒ අයට විශේෂ දීමනාවක් හරි දීලා, සෞඛ්‍ය අමාත්‍යාංශයේ පරිපාලන කටයුතු ඒ ක්ෂේත්‍රයේ සිටින අයගෙන්ම සිදුවෙන්න ඕනෑය කියන එක මා මේ අවස්ථාවේදී මතක් කරනවා.

මේ පිළිබඳව සංගම් දෙකක් මගින් කරුණු ඉදිරිපත් කර තිබෙනවා. ඉන් එක් සංගමයක් තමයි, " Council of Medical Technical and Engineers. " " Committee on Improvement of Quality of Public Services " කියන අනික් සංගමය ජේ. වී. පී. සමරසිංහ මහත්මයාගේ මූලිකත්වයෙන් කරුණු ඉදිරිපත් කර තිබෙනවා. ඒ වාගේම අපේ ආණ්ඩුවේ ජනාධිපතිතුමාත් මෙය පිළිගෙන තිබෙනවා. තුන්වෙනි ලෝකයේ රටවල් පිළිගෙන තිබෙනවා. දියුණු වෙමින් පවතින රටවල් පිළිගෙන තිබෙනවා. දියුණු වූ රටවල් පිළිගෙන තිබෙනවා. ඒ සියලු රටවල පිළිගැනීම මැද තමයි අපි මේ වෙනස සිදු කර තිබෙන්නේ. එම නිසා ඉංජිනේරුවරු මහාමාර්ග දෙපාර්තමේන්තුව යටතේ දිස්ත්‍රික් නියෝජනය කරනවා නම්, වාරිමාර්ග දෙපාර්තමේන්තුව නියෝජනය කරනවා නම්, සෞඛ්‍ය දෙපාර්තමේන්තුවේ දොස්තර මහත්වරුන්ටත් ඒ අමාත්‍යාංශයේ පරිපාලනය නියෝජනය කරන්නට ඉඩක් නොලැබීම නුසුදුසුයි. ඉන්ජිනේරුවන් වැනි තාක්ෂණික දැනුම තිබෙන අයන් අඩුයි. මේ තත්ත්වයට හොඳ උදාහරණයක්. මේ සභාවේ ඉන්න වෛද්‍යවරයකු වන අපේ සෞඛ්‍ය ඇමතිතුමා. මේ කටයුත්ත සඳහා ව්‍යාපාරිකයෙක් පත් කළා නම්, වැවිලි කරුවෙක් පත් කළා නම්–අපේ ඉතිහාසයේ එවැනි දේවල් සිදුවෙලා තිබෙනවා. සමහරවිට අමාත්‍යාංශ භාරදී තිබෙනවා ඒ විෂයය පිළිබඳව අලුතින් හදාරන්න ඕනෑ අයට–එය දීර්ඝ කාලයක් තිස්සේ ලැබූ අත්දැකීම් ප්‍රයෝජනයට නොගැනීමක් වෙනවා. ඒ නිසා මා මේ අවස්ථාවේදී විශේෂයෙන් මතක් කර සිටින්නේ මේ කරුණු පිළිබඳව අවධානය යොමු කරන්නය කියායි.

ගරු ඇමතිතුමාගෙන්, මේ සභාවේත් අවධානයට තවත් කරුණු දෙකක් කෙටියෙන් වුවත් සඳහන් කළ යුතුයි. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, වෛද්‍ය අධිකාරීවරයෙක් කරන්නෙත් රෝහලේ පරිපාලන කටයුතුයි. බොහෝවිට ඔහුටත් භාරව තිබෙන්නේ පරිපාලන කටයුතු. එම නිසා සමහරවිට එහිදීත් පරිපාලන නිලධාරියෙක් ඉල්ලන්න පුළුවන්. නමුත් සෞඛ්‍ය කටයුතු පිළිබඳ ප්‍රශ්න වෛද්‍ය කටයුතුත් එක්ක බැඳිලයි තිබෙන්නේ. එහෙම නැතිව වෙනම විශේෂ තත්ත්වයක් නොවෙයි. දැන් අධ්‍යාපන දෙපාර්තමේන්තුවේ " සයිඩ් " එකත් " ලයින් " එකත් දෙකම ගෙනියන්නෙ අධ්‍යාපනඥයින්. කොහොම හරි අවසානයේදී පත්වෙන්නෙ අධ්‍යාපනයට සම්බන්ධ අය. පරිපාලන නිලධාරීන් එතැනට යෙදුවොත් එතැන අඩුපාඩුවක් සිදුවෙනවා. සෞඛ්‍ය අමාත්‍යාංශයෙන් මේ කටයුත්ත ගැන මම අවධානය යොමු කරවනවා.

ඒ වගේම මීට කලින් අවස්ථාවකදී ගරු අත්තනගල්ලේ මන්ත්‍රීතුමාත් (ලක්ෂ්මන් ජයකොඩි මහතා) ඉදිරිපත් කළ බෙහෙත් පිළිබඳ ප්‍රමිතිකරණය ගැන අදහසක් මම ඉදිරිපත් කරන්න කැමතියි. මීට කලින් අවස්ථාවකදී ගරු ඇමතිතුමාත් ඊට එකඟ වුණ බව මා දන්නවා. වෛද්‍යාචාර්ය සේනක බිබිලේ මහත්මයා විසින් " ඩ්‍රග් ෆෝමියුලා " එකක් ඉදිරිපත් කළා. රටේ බෙහෙත් ව්‍යාපාරය හසුරුවන විවිධ ආයතන විවිධ නම්වලින් විවිධ වෙළඳ නම්වලින් මිල වෙනසක් ඇතිව එකම බෙහෙත–කවරයේ වෙනස නිසා මිල වෙනසක් ඇතිව–ගෙන්වනවා. වෛද්‍යවරුන් ඒ බෙහෙත නියම කරනවා. පාරිභෝගිකයින්–ලෙඩුන්–මෙයින් යම් පීඩනයක් ලබනවා. තුන්වන ලෝකයේ රටවල් අද පිළිගෙන තිබෙන දෙයක් තමයි බෙහෙත්වල ගුණය පිළිබඳ ප්‍රශ්නය මිසක් කවරය පිළිබඳ ප්‍රශ්නයක් බලපාන්නෙ නැති බව. ඒ නිසා තුන්වන ලෝකයේ රටවල් " ඩ්‍රග් ෆෝමියුලා " එක පිළිගන්න. බෙහෙත් පිළිබඳ ක්‍රමයක්. වෛද්‍යාචාර්ය සේනක බිබිලේ මහත්මයා ඒ ක්‍රමය–ඒ යෝජනාව–ඉදිරිපත් කර තිබුණා. එය ක්‍රියාත්මක කිරීමේදී ඕනෑම රජයකට නොයෙකුත් බලපෑම් එන්න පුළුවන්. බෙහෙත් ගෙන්වන්නන්ගෙන්, ඒ රටවල බෙහෙත් ඊජන්සිකාරයින්ගෙන් නොයෙක් බලපෑම් එන්න පුළුවන්. දැන් අපි " ඇස්ප්‍රීන් " කිව්වත් " ඩිස්ප්‍රීන් " කිව්වත් කවරයේ වෙනස පමණයි තිබෙන්නෙ. නමේ වෙනස පමණයි තිබෙන්නෙ. මගේ දැනීමේ හැටියට නම් එහෙමයි. මෙන්න මේ විධියට විවිධ නම්වලින් එකම බෙහෙත් ගෙන්වීම අපේ රටවලට තිබෙන ප්‍රශ්නයක්. විශේෂයෙන්ම අඩු ආදායම ලබන රටවල ජනතාව වැඩි රටවල මේ ප්‍රශ්නය තිබෙනවා. ඒ නිසා මම ඉල්ලීමක් කරන්න කැමතියි, මේ " ඩ්‍රග් ෆෝමියුලා " එක අපේ බෙහෙත් ගෙන්වීම පිළිබඳව පදනමක් කර ගන්නය කියා.

එමෙන්ම මේ විශේෂඥ වෛද්‍ය සේවාව ගැනත් ගරු ඇමතිතුමාට මතක් කිරීමක් කරන්න කැමතියි. විශේෂඥ වෛද්‍ය සේවාව පිළිබඳව තමුන්නාන්සේ විසින් කමිටුවක් පත් කර තිබුණු බව මට මතකයි. විශේෂඥ වෛද්‍ය සේවාවට " වැනලින් " කියා වෙන නමකුත් පාවිච්චි කරනවා. විශේෂඥ දොස්තර මහත්වරු කැමති නැහැ, එය වෙනස් කරනවාට. මම ඉල්ලුවේත් අද ඉල්ලා සිටින්නේත් මෙයයි. ආණ්ඩුවේ රෝහල්වල මේවාට අවශ්‍ය සායන තිබෙනවා ; ක්ලිනික්ස් තිබෙනවා ; ඒ සායනවල සේවකයින් සිටිනවා. එසේ තිබියදී පෞද්ගලික රෝහල්වලට බැහැර ගොස් දහවල් 12 සිට සවස 3 වනතුරු මේ රටේ විශේෂඥ වෛද්‍යවරු ඒවායේ දී බෙහෙත් තුණ්ඩු ලියා ආණ්ඩුවේ රෝහල්වලටම ලෙඩුන් ඇතුළත් කරනවා. ඒ අතර ආණ්ඩුවේ රෝහලේ අර සායනවල සේවකයන් නිකම් සිටිනවා. ඒවායේ භාණ්ඩ හා උපකරණත් තිබෙනවා. මේ අන්දමට කටයුතු කරන පෞද්ගලික රෝහල් 50 ක් 60 ක් පමණ නගරය තුළ තිබෙනවා. මේ විශේෂඥ වෛද්‍යවරු ඒවාට ගොස් ඒවායේදී ලෙඩුන් බලා ඒ දොස්තර මහත්වරුන් ගණනේ රජයේ රෝහල්වලට ලෙඩුන් ඇතුළත් කරනවා.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

නියෝජ්‍ය කථානායකතුමා
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(Mr. Deputy Speaker)

Order, please ! The Deputy Chairman of Committees will now take the Chair.

*අනතුරුව නියෝජ්‍ය කථානායකතුමා මූලාසනයෙන් ඉවත් වූයෙන්, නියෝජ්‍ය කාරක සභාපතිතුමා [එඩ්මන්ඩ් සමරවික්‍රම මහතා] මූලාසනාරූඪ විය.*

*அதன் பிறகு, பிரதிச் சபாநாயகர் அவர்கள் அக்கிராசனத்திலிருந்து அகலவே, குழுப் பிரதித் தலைவர் அவர்கள் [திரு. எட்மண் சமரவிக்ரம] தலைமை வகித்தார்கள்.*

*Whereupon* MR. DEPUTY SPEAKER *left the Chair, and* MR. DEPUTY CHAIRMAN OF COMMITTEES [MR. EDMUND SAMARAWICKREMA] *took the Chair.*

අමරසිරි දොඩන්ගොඩ මහතා
(திரு. அமரசிறி தொடங்கொட)
(Mr. Amarasiri Dodangoda)

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, අන්න ඒ නිසා මා විශේෂයෙන් සඳහන් කරන්න කැමතියි, මේ පෞද්ගලික රෝහල්වල කෙරෙන විශේෂඥ වෛද්‍ය සේවය ආණ්ඩුවේ රෝහල්වලම කරන්නට පුළුවන් බව. එවිට ඒවායේ සිටින සේවකයින්ටත් යම් සේවයක් සිදු වෙනවා. එමෙන්ම පෞද්ගලික රෝහල්වලට යන මුදලත් ආණ්ඩුවේ රෝහල්වලට ලැබෙනවා. මම හිතන විධියට ඒ ආයතනයට ලැබෙන්නේ එක් අයෙකුගෙන් රුපියල් 10 ක මුදලක් පමණයි මගේ දැකීමේ හැටියට මෙයට විශේෂඥ වෛද්‍යවරුන් කැමති නැත්තේ ආදායම් බදු පිළිබඳ ප්‍රශ්නය නිසයි. ආණ්ඩුවේ රෝහල්වල සේවය කළ විට සේවය කරනු ලැබූ ප්‍රමාණය පිළිබඳ ගණනය කිරීමක් සිදු වන අතර පෞද්ගලික අංශයේ රෝහල්වල එවැනි ගණනය කිරීමක් සිදු වන්නේ නැහැ.

ඇත්ත වශයෙන්ම විශේෂඥ වෛද්‍ය සේවාව පිළිබඳව කථා කරන විට අද රටේ හැම කෙනෙක්ම උත්සාහ කරන්නේ එම සේවාව පෞද්ගලික රෝහලකට ගොස් ලබා ගන්නයි. ඒ නිසා මේ යටතේ රෝගීන් විශාල ප්‍රමාණයක් සේවය ලබනවා. රජයේ රෝහල්වල එම සායන තිබියදීත් ක්ලිනික්ස් තබන්නු කරද්දීත් ඒවායේ සේවකයින්ට වැටුප් ගෙවද්දීත් ඒ සේවාවන් පෞද්ගලික අංශයේ රෝහල්වල සිදු වෙනවා. ඒ නිසා මම නැවතත් වරක් මෙන්න මේ කරුණ පිළිබඳව ගරු ඇමතිතුමාගේ අවධානය යොමු කරන්න කැමතියි.

වෛද්‍ය ආඥාපනතේ සංශෝධන කළ යුත්තේ වරින්වර කොටස් වශයෙන් නොවෙයි. නිදසුනක් වශයෙන් කියනවා නම් 1976 දී වාර්තාව සැපයූ දන්ත වෛද්‍ය සේවය පිළිබඳ සංශෝධන තවම පාර්ලිමේන්තුවට ඇවිත් නැහැ. වහාම ඒවා ඉදිරිපත් කරනවා යයි ගරු ඇමතිතුමා කියනවා. ඒ ගැන මම ස්තුතිවන්ත වෙනවා. එමෙන්ම " සිලෝන් මෙඩිකල් කවුන්සිල් " කියන එක " ශ්‍රී ලංකා මෙඩිකල් කවුන්සිල් " වෙලා හුඟක් කල් වෙනවා. අපේ සේවාවන්හි සමහර විට ඩොනමෝර් යුගයට සම්බන්ධ ක්‍රියාත්මකවීම් තවම තිබෙනවා. ඒවා වහාම සංශෝධනය කර මේ සේවාවල සිටින පිරිස්වලට සහනය ලබා දීමට ගත් පියවරක් හැටියට මෙය සලකනවා.

එමෙන්ම ඖෂධවේදීන් හැටියට ලියාපදිංචි වී අඩුපාඩු සහිතව හානිකරව කටයුතු කරන අයත් සිටින බව පෙනෙනවා. මේ ක්ෂේත්‍රය ගැන කථා කරන විට තවත් එක් කරුණක් තමුන්නාන්සේගේ අවධානයට යොමු කරන්නට කැමතියි, ඖෂධ නිපදවන පිරිස් ගැන. මේ අංශයෙන් පමණක් නොවෙයි, දේශීය වෛද්‍ය අංශයෙනුත් ඖෂධ නිපදවන්නන් කවුද කියන එක ගැන කියන්න කැමතියි. ඖෂධ නිපදවන සමහර වෙද මහත්වරු ගැන මම දන්නවා. ඒ අය ඉංග්‍රීසි බෙහෙත්වලට අයත් " අයන් පිල්ස් " සහ " විටමින් පිල්ස් " ගෙන ගොස් ඒවා කොටා කුඩු කර පැනි ටිකක් දමා ප්‍රතිශක්තිකරණ බෙහෙත් හැටියට විකුණනවා. ඔවා පාවිච්චි කළාම සුමානයෙන් අර කී ගුණය දැනෙනවා. ඒවා තිබෙනවා ; නොයෙකුත් විධියෙ වෙළඳ නම්වලින්. සමහර විට නගරයේ ගස් යටත් මේවා විකුණනවා. එහෙම නැතිනම් ලබා ගන්න පුළුවන් තැන් ගැන පත්‍රයේ පළ කරනවා. මේ බෙහෙත් වර්ග අරගෙන බැලුවොත් ඇමතිතුමාටම දැනගන්නට පුළුවන් වේවි, මේවායේ කලවම් කර තිබෙන්නේ මොනවාද කියා. වෙළඳ පොළේ ඇති විටමින් පෙති, යකඩ පෙති හා වෙනත් වර්ගවල පෙති කුඩු කර, ඒවාට තවත් මොනවා හරි කලවම් කර බීමක් හැටියට සකස් කර දෙනවා. හැන්ද—හැන්ද සුමානයක් බොන කොට එම පෙතිවලින් ඇඟට ගුණයක් දැනෙනවා. එම නිසා මෙම වෛද්‍ය පනත් කෙටුම්පත සංශෝධනය කරන්නා වාගේම මේ රටේ බෙහෙත් වෙළඳ පොළේ විකුණන, බෙහෙත් ද්‍රව්‍ය වශයෙන් ලියාපදිංචි කර ඇති බෙහෙත් සම්බන්ධයෙන් කිසියම් ප්‍රමිතිකරණයක් කරන්නටය. ඒ සඳහා ගරු ඇමතිතුමාගේ අමාත්‍යාංශය මූල් වී මේ කටයුත්ත සාර්ථකව කරන්නටය කියා ඉල්ලා සිටිමින්, මෙම සංශෝධන පනතට මගේ එකඟතාවය පළ කරමින් මම නිශ්ශබ්ද වෙනවා.

අ. භා. 3. 13

වෛද්‍යාචාර්ය රංජිත් අතපත්තු මහතා
(டாக்டர் ரஞ்ஜித் அத்தபத்து)
(Dr. Ranjith Atapattu)

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, දැන් සඳහන් කළ කරුණු සියල්ලටම පිළිතුරු දීම අවශ්‍ය නැතැයි මම හිතනවා. මන්ද ? මේ පනතට අදාළ නොවන කරුණු රාශියක්ම ඉදිරිපත් වුණා. කෙසේ වුණත් ඒ කරුණු සියල්ල ගැනම මගේ අවධානය යොමු කරන බව විශේෂයෙන් මතක් කරනවා. එයින් එක් කාරණයක් ගැන පමණක් කරුණු පැහැදිලි කර දෙන්න කැමතියි. එනම් පරිපාලනය සඳහා පරිපාලන නිලධාරීන් යොදවා ගැනීම ගැනයි. එමගින් යථාර්ථවාදී ක්‍රියාවකුයි මම කර තිබෙන්නේ. පසුගිය අවුරුදු පහ තිස්සේ වෛද්‍ය පරිපාලන සේවයට, එකම දෙස්තර මහත්මයකුවත් ඉල්ලුම් පත්‍රයක්වත් එව්වේ නැති නිසාත්, එම වැඩ කටයුතු කර ගෙන යා යුතු නිසාත්, එහි ඇබැර්තු රාශියක් ඇති නිසාත් වෙනත් කරන්නට දෙයක් නැති නිසා තමයි පරිපාලන සේවයේ අය මෙයට අනුයුක්ත කරන්නට මම පියවර ගත්තේ. තමුන්නාන්සේලා කී පරිදි විශේෂ දීමනා ආදි දේවල් සියල්ලක්ම මේ අයට දීමට මම යෝජනා කර තිබුණත් වැටුප් සමාලෝචන කොමිටිය ඒවා අනුමත කළේ නැහැ. එම නිසා, වෛද්‍යවරුන් ඉල්ලුම් කර නැති නිසා මට මේ පියවර ගැනීම හැරෙන්නට වෙනත් කරන්නට දෙයක් තිබුණේ නැහැ.

රිචඩ් පතිරණ මහතා
(திரு. றிச்சட் பத்திரன)
(Mr. Richard Pathirana)

මෙම සේවයට ගියාම විශේෂඥ වෛද්‍යවරුන්ට පෞද්ගලිකව ප්‍රතිකාර කරන්නට බැරි වෙනවා. එම නිසා, මෙම සේවයට යන දෙස්තර මහත්වරුන්ට වැඩි වැටුප් ගෙවන්නටය කියා පසුගිය අයවැය විවාදයේදී මම තමුන්නාන්සේගෙන් ඉල්ලා සිටියා.

වෛද්‍යාචාර්ය රංජිත් අතපත්තු මහතා
(டாக்டர் ரஞ்ஜித் அத்தபத்து)
(Dr. Ranjith Atapattu)

ඒක මම යෝජනා කළා. නමුත් වැටුප් සමාලෝචන කොමිටිය එය පිළිගත්තේ නැහැ. එම නිසා මේ ගැන මට කරන්නට දෙයක් නැහැ. තවදුරටත් මේ ඇබැර්තු තබා ගෙන මට ඉන්නට බැහැ, පුළුවන් හැටියට මේවා මම පුරවනවා. ඒ සඳහා වෛද්‍යවරුන් ඇතුළු වෙනවා නම් මම ඉතාම සතුටින් ඒ අය පිළිගන්නවා. දැන් මේ සංශෝධන පනත ගරු සභාවට මම ඉදිරිපත් කරනවා.

*ප්‍රශ්නය විමසන ලදින්, සභාසම්මත විය.*

*පනත් කෙටුම්පත ඊට අනුකූලව දෙවන වර කියවන ලදී.*

*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*

*அதன்படி, சட்டமூலம் இரண்டாம் முறையாக மதிப்பிடப்பெற்றது.*

*Question put, and agreed to.*

*Bill accordingly read a Second time.*

*මතු පළවන යෝජනාව සභාසම්මත විය :*

" පනත් කෙටුම්පත පූර්ණ පාර්ලිමේන්තු කාරක සභාවකට පැවරිය යුතුය.–[වෛද්‍යාචාර්ය රන්ජිත් අතපත්තු මහතා]

*தீர்மானிக்கப்பட்டது :*

*" சட்டமூலம் முழுப்பாராளுமன்றக் குழுவுக்குச் சாட்டப்படுமாக. " [வைத்தியகலாநிதி ரஞ்ஜித் அத்தபத்து ]*

*Resolved :*

"That the Bill be referred to a Committee of the whole Parliament."–[*Dr. Ranjith Atapattu*]

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

**කාරක සභාවෙහිදී සලකා බලන ලදී.**

*[නියෝජ්‍ය කාරක සභාපතිතුමා මූලාසනාරූඪ විය]*

*குழுவில் ஆராயப்பட்டது.*

*[ குழுக்களின் பிரதித் தலைவர் அவர்கள் தலைமை வகித்தார்கள் ]*

*Considered in Committee.*

[Mr. Deputy Chairman of Committees *in the Chair.*]

*1 වන සහ 2 වන වගන්ති පනත් කෙටුම්පතෙහි කොටසක් හැටියට තිබිය යුතු යයි නියෝග කරන ලදී.*

*1 ஆம் 2 ஆம் வாசகங்கள் சட்டமூலத்தின் பகுதியாக இருக்க வேண்டுமென கட்டளையிடப்பட்டது.*

*Clauses 1 and 2 ordered to stand part of the Bill.*

**3 වන වගන්තිය.– (ප්‍රධාන ප්‍රඥප්තියේ 56 වන වගන්තිය සංශෝධනය කිරීම)**

**3 ஆம் வாசகம்.—(முதன்மைச் சட்டவாக்கத்தின் 56 ஆம் பிரிவைத் திருத்தல்)**

*CLAUSE 3.–(Amendment of section 56 of the principal enactment.)*

වෛද්‍යාචාර්ය රංජිත් අතපත්තු මහතා
(டாக்டர் ரஞ்ஜித் அத்தபத்து)
(Dr. Ranjith Atapattu)

I move,

"In page 1, line 23, leave out the words and figures, 'December 31, 1986; or' and insert the words 'a date to be determined by the Minister by Order published in the Gazette; or' ".

*සංශෝධනය පිළිගත යුතුය යන ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.*

*திருத்தம் விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*

*Amendment put, and agreed to.*

*3 වන වගන්තිය, සංශෝධිතාකාරයෙන්, පනත් කෙටුම්පතෙහි කොටසක් හැටියට තිබිය යුතු යයි නියෝග කරන ලදී.*

*3 ஆம் வாசகம், திருத்தப்பட்டவாறு சட்டமூலத்தின் பகுதியாக இருக்கவேண்டுமென கட்டளையிடப்பட்டது.*

*Clause 3, as amended, ordered to stand part of the Bill.*

*4 සිට 7 තෙක් වගන්ති පනත් කෙටුම්පතෙහි කොටසක් හැටියට තිබිය යුතු යයි නියෝග කරන ලදී.*

*ප්‍රඥප්ති වගන්තිය සහ නාමය පනත් කෙටුම්පතෙහි කොටසක් හැටියට තිබිය යුතු යයි නියෝග කරන ලදී.*

*පනත් කෙටුම්පත, සංශෝධන සහිතව, වාර්තා කරන ලදී.*

*4 ஆம் வாசகத்திலிருந்து 7 ஆம் வாசகம் வரை சட்டமூலத்தின் பகுதியாக இருக்கவேண்டுமென கட்டளையிடப்பட்டது.*

*சட்டமாகு வாசகமும் தலைப்பும் சட்டமூலத்தின் பகுதியாக இருக்கவேண்டுமென கட்டளையிடப்பட்டது.*

*சட்டமூலம் திருத்தங்களுடன் அறிக்கை செய்யப்பட்டது.*

*Clauses 4 to 7 ordered to stand part of the Bill.*
*Enacting Clause and Title ordered to stand part of the Bill.*
*Bill reported with Amendment.*

වෛද්‍යාචාර්ය රංජිත් අතපත්තු මහතා
(டாக்டர் ரஞ்ஜித் அத்தபத்து)
(Dr. Ranjith Atapattu)

I move,

"That the Bill, as amended, be now read the Third time."

*ප්‍රශ්නය විමසන ලදින්, සභාසම්මත විය.*

*පනත් කෙටුම්පත ඊට අනුකූලව සංශෝධිතාකාරයෙන් තුන්වන වර කියවා සම්මත කරන ලදී.*

*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*

*அதன்படி, சட்டமூலம் திருத்தப்பட்டவாறு மூன்றும் முறையாக மதிப்பிடப்பெற்று நிறைவேற்றப்பெற்றது.*

*Question put, and agreed to.*
*Bill, as amended, accordingly read the Third time, and passed.*

## ශ්‍රී ලංකා රාජ්‍ය ඖෂධ නීතිගත සංස්ථාවේ වාර්ෂික වාර්තාව

## இலங்கை அரச மருந்தகக் கூட்டுத்தாபனம் : ஆண்டறிக்கை

## STATE PHARMACEUTICALS CORPORATION OF SRI LANKA : ANNUAL REPORT

වෛද්‍යාචාර්ය රංජිත් අතපත්තු මහතා
(டாக்டர் ரஞ்ஜித் அத்தபத்து)
(Dr. Ranjith Atapattu)

I move,

"That in terms of section 30 (2) of the State Industrial Corporation Act, No. 49 of 1957 and section 14 (3) of the Finance Act, No. 38 of 1971, the Annual Report and Accounts of the State Pharmaceuticals Corporation of Sri Lanka, being report incorporating the Auditor-General's observations for the year ended 31st December, 1980, which were presented on 08.03.1985, be approved."

I wish to make a few comments. First, I must apologise to the House for the delay in presenting the 1980 Report of the State Pharmaceuticals Corporation. This was due to two reasons. One was that in the initial copy that was sent to the House, there was a mishap in the binding and therfore it had to be sent back. It had been on the Order Paper for the last four months and had taken some time to come up due to various other matters that came up in the House.

The comment I wish to make is that the years 1979 and 1980 have been two particularly bad years for this Corporation and as such I would not like the present stage of the Corporation to be judged by this Report. We have suffered a loss during these two years due to a conscious action taken by the Government at that stage. After the revaluation of the rupee in the 1977 Budget, the cost of drugs in the open market went up by 100 percent and the Cabinet took a decision to try and cushion the blow by instructing the Corporation to keep down the price by 40 per cent. Therefore, in 1979 and 1980 we suffered a loss because of the obvious reason that we were selling below the import cost. Subsequently we had to correct it and in the subsequent years the Corporation has shown a profit.

I commend this Report to the House.

*ප්‍රශ්නය සභාභිමුඛ කරන ලදී.*

*வினா எடுத்தியம்பப்பெற்றது.*

*Question proposed.*

ආනන්ද දසනායක මහතා
(திரு. ஆனந்த தஸநாயக்க)
(Mr. Ananda Dassanayake)

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, මේ වාර්තාව සම්බන්ධයෙන් මට ප්‍රශ්න කිහිපයක් මතු කරන්න තිබෙනවා. ඔඩිටර් ජනරාල් වරයා ඉදිරිපත් කර තිබෙන කරුණු බැලුවාම මම ගරු ඇමතිතුමාට කියනවා මීට වඩා මේ සම්බන්ධව අවධානයෙන් යුතුව කටයුතු කරන්නය කියා.මේ ඉදිරිපත් කර තිබෙන වාර්තාවේ 6 වැනි පිටුවේ 3 : 5 : 4 ඡේදය යටතේ මෙසේ සඳහන් වෙනවා :

5 .6 " අයවිය යුතු මුදල් (ණයගැති ශේෂ ආදිය)

(අ) පහත දක්වෙන හේතුන් නිසා ශේෂ පත්‍රයේ දක්වෙන ණය ගැතියන්ගේ වටිනාකමෙහි සාධාරණත්වය පිළිබඳව අදහසක් ප්‍රකාශ කළ නොහැකිය.

i. ණය ගැතියන් පිළිබඳ කාල විශ්ලේෂණ විගණනය සඳහා ලබාගත නො හැකි විය. "

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

පාලන මණ්ඩලය මේවා ගැන නොසලකා තිබෙන්නේ ඇයි කියන එක ගරු ඇමතිතුමාගෙන් ප්‍රශ්න කළයුතුව තිබෙනවා. එහි තවදුරටත් මෙසේ සඳහන් වෙනවා :

" ii. ණය ගැතියන්ගේ ශේෂ සනාථ කිරීම පිළිබඳ තත්ත්වය ඉතා අසතුටුදායක විය. බොහෝ ණය ගැතියන් සහ තැන්පත් ගිණුම් සම්බන්ධයෙන් ශේෂ සනාථ කිරීම් ඉදිරිපත් කරන ලෙස සංස්ථාව විසින් දන්වාද නොතිබුණි.

iii. වෙළඳ ණය ගැතියෝ රු. 1,28,86,603 — මෙතෙක් අය නො වූ ණය සැලකිය යුතු ප්‍රමාණයක් වූ අතර, 1980 වර්ෂයේදීම ආපසු ලැබී තිබූ රු. 39,825 ක නොග තිවැරදිව ගිණුම් ගත කර නොතිබුණි. "

ගරු ඇමතිතුමනි, මේවා නම් තමුන්නාන්සේගේ අවධානය විශේෂයෙන්ම යොමු කළයුතු ඒවා. මේ රුපියල් 1,28,86,603 ක ණය ගැතියන් සම්බන්ධයෙන් විශේෂයෙන් සොයා බලන්නට ඕනෑ. ඊළඟට IV වැනි කරුණ :

" iv. විවිධ ණය ගැතියෝ රු. 4,16,476 — මෙම මුදලින් මෙතෙක් අය නොවූ ණය මුදල රු. 4,06,476 ක් පමණ විය. එයින්ද රු. 3,69,275 ක මුදලක් ශේෂ පත්‍ර දිනට වර්ෂයකටත් වඩා (දළව වර්ෂ 2 ක් පමණ) පැරණි ණය වූයේය.

v. අත්තිකාරම් රු. 95,969 — විවිධ කරුණු වෙනුවෙන් අත්තිකාරම් වශයෙන් දී තිබූ මෙම මුදලින් රු. 89,929 කට ආසන්න මුදලක් මෙතෙක් නිරවුල් කර නොමැත. "

මේ විදියට ඒ පිටුවේ සම්පූර්ණයෙන්ම තිබෙන්නේ ගිණුම් තැබීම් සම්බන්ධවත්, සංස්ථාවට අයවිය යුතුමුදල් අය කර නොගැනීම ආදිය සම්බන්ධවත් විස්තර තමයි. ඒ වාගේම විගණනයේදී අවශ්‍ය ලිපි ලේඛන ඉදිරිපත් නොකිරීම සම්බන්ධවත් විස්තර කර තිබෙනවා. මිල නියම කිරීමේ කටයුතු වලදී වැරදි විදියට කටයුතු කර තිබෙනවා කියාත් තිබෙනවා. ලාභ අඩුවීමක් සම්බන්ධයෙනුත් සඳහන් වෙනවා. 1979 දී තිබුණු ප්‍රමාණය 1980 වන විට සියයට 28.08 සිට 11.10 දක්වා පහත බැස තිබෙනවා. අවුරුද්දක් තුළදී ලාභය එලෙස පහත බැස තිබෙනවා. මේවා පෙන්වා දී තිබෙනවා. නමුත් හේතු සඳහන් කර නැහැ. මේ සංස්ථාවල කොපමණ හොඳ පාලකයින් සිටියත් මේවා වැරදි හැටියට පෙන්වා දෙන්නට අපට සිදුවී තිබෙනවා. එමනිසා අමාත්‍යාංශය මේ සම්බන්ධයෙන් විශේෂ වැඩ පිළිවෙළක් යෙදිය යුතුයි.

ඖෂධ මිලට ගැනීමේදී කිසිම ටෙන්ඩර් කැඳවීමක් නොකර ඒවා මිලදී ගෙන තිබෙනවා. විශාල මුදල් ප්‍රමාණයක් එනම්, රුපියල් 1,03,50,425 ක විදේශ විනිමයක් වැය කර බෙහෙත් ද්‍රව්‍ය ගෙන්වා තිබෙනවා. නමුත් ටෙන්ඩර් කැඳවා නොවෙයි එය කර තිබෙන්නෙ. මම හිතන්නෙ ඖෂධ සංස්ථාවට ටෙන්ඩර් කැඳවීමේ ප්‍රතිපත්තියෙන් බැහැරව පැන යන්නට බැරි විදියට නීති සකස් කර තිබෙනව කියලයි. මම හිතන හැටියට පසුගිය කාලය තුළ ගරු ඇමතිතුමාට මේවා ගැන හොයන්නට බැරි වුණා වෙන්න ඇති. දැන් නම් සමහර විට ත්‍රස්තවාදය නිසා ඔවා කරන්නට බැහැයි කියා තමුන්නාන්සේ කියයි. නමුත් එය ඉතා වැදගත් වෙනවා. මොකද ? ටෙන්ඩර් කැඳවන්නේ නැතිව ගොඩනැඟිලි හදන්නට දී තිබෙන බව මෙතැන පෙන්වනවා. මේ වාර්තාව හොඳට කියවලා බැලුවා නම් තමුන්නාන්සේට පෙනෙයි.

වෛද්‍යාචාර්ය රංජිත් අතපත්තු මහතා
(டாக்டர் ரஞ்ஜித் அத்தபத்து)
(Dr. Ranjith Atapattu)
නැහැ ! බෙහෙත් ගෙන්වා තිබෙනවා.

ආනන්ද දසනායක මහතා
(திரு. ஆனந்த தஸநாயக்க)
(Mr. Ananda Dassanayake)
බෙහෙත් ගෙන්වීමක් තිබෙනවා, ගොඩනැඟිලිත් තිබෙනවා.

වෛද්‍යාචාර්ය රංජිත් අතපත්තු මහතා
(டாக்டர் ரஞ்ஜித் அத்தபத்து)
(Dr. Ranjith Atapattu)
ගොඩනැඟිලි නැහැ.

ආනන්ද දසනායක මහතා
(திரு. ஆனந்த தஸநாயக்க)
(Mr. Ananda Dassanayake)
මම සමාව ඉල්ලනවා. එය වැරදීමක්. කොන්ත්‍රාත්කරුවෙකු පත්කර තිබෙනවා—

රිචඩ් පතිරණ මහතා
(திரு. றிச்சட் பத்திரன)
(Mr. Richard Pathirana)
සමහර බෙහෙත් වර්ග ටෙන්ඩර් කැඳවන්නේ නැතිව ගෙන්වන්නට වෙනවා.

අමරසිරි දොඩන්ගොඩ මහතා
(திரு. அமரசிறி தொடங்கொட)
(Mr. Amarasiri Dodangoda)
තුවක්කු ගෙනාවා වගේ.

ආනන්ද දසනායක මහතා
(திரு. ஆனந்த தஸநாயக்க)
(Mr. Ananda Dassanayake)
තුවක්කු ගෙනාවා වගේ පෙන්වන්නට වෙනවා.

රිචඩ් පතිරණ මහතා
(திரு. றிச்சட் பத்திரன)
(Mr. Richard Pathirana)
හදිසියේ අසනීපයක් වුණොත් ටෙන්ඩර් කැඳව කැඳවා ඉන්නට බැහැ.

ආනන්ද දසනායක මහතා
(திரு. ஆனந்த தஸநாயக்க)
(Mr. Ananda Dassanayake)
මේ අනුව බලන විට කොන්ත්‍රාත්කරුවන්ට දී තිබෙන කාලය දීර්ඝ කර තිබෙන ක්‍රමයේ වැරදි තිබෙනවා. අවුරුද්දෙන් අවසන් කරන්නට ගත් කොන්ත්‍රාත්තුවලට අවුරුදු තුන, හතර ගත කර තිබෙනවා. එතකොට ඒ ආයතනයේ කටයුතු කරන්නට පුළුවන්කමක් ඇති වන්නේ නැහැ. එයින් මහජනයාට සේවයක් සලසන්නට අවස්ථාවක් නැතිව යනවා. ඒ විධියේ වැරදි රාශියක් සිදු වී තිබෙන බව පෙනෙනවා. සංස්ථාවේ කටයුතු සම්බන්ධයෙන් මීට වඩා සැලකිලිමත් විය යුතුයි කියන එකයි මගේ ඉල්ලීම.

රජයේ ගිණුම් කාරක සභාවටත් මේ කරුණු ඉදිරිපත් වුණා. ඔසුසලෙත් බෙහෙත් ද්‍රව්‍ය බෙද හැරීමත්, රජයේ බෙහෙත් ගබඩාවත් අතරේ මහා පටලැවිල්ලක් තිබෙනවා. නොයෙක් ප්‍රදේශවල වෛද්‍යවරුන් පවා කියන්නේ ඒ උදවියට වුවමනා බෙහෙත් ගන්නට මෙහාට ආවාම ඒ වෙනුවෙන් සුමානයක් දෙකක් රස්තියාදු වෙන්නට සිදු වෙනවාය කියන එකයි. බෙහෙත් ගෙන යන්නට වාහනයක් එව්වාම මෙහාට ඇවිදින් ඒ අයට ඕනෑ විධියට, වුවමනා දවසට බෙහෙත් අරගෙන යන්නට බැරි වෙනවා.

වෛද්‍යාචාර්ය රංජිත් අතපත්තු මහතා
(டாக்டர் ரஞ்ஜித் அத்தபத்து)
(Dr. Ranjith Atapattu)
පෞද්ගලික අයද ? ආණ්ඩුවේ අයද ?

ආනන්ද දසනායක මහතා
(திரு. ஆனந்த தஸநாயக்க)
(Mr. Ananda Dassanayake)
නැහැ ! නැහැ ! ආණ්ඩුවේ අය.

වෛද්‍යාචාර්ය රංජිත් අතපත්තු මහතා
(டாக்டர் ரஞ்ஜித் அத்தபத்து)
(Dr. Ranjith Atapattu)
ආණ්ඩුවේ අය සංස්ථාවට එන්නේ නැහැනේ. රජයේ බෙහෙත් ගබඩාවෙනුයි බෙහෙත් ගන්නේ.

ආනන්ද දසනායක මහතා
(திரு. ஆனந்த தஸநாயக்க)
(Mr. Ananda Dassanayake)
සංස්ථාවට එන්නට වෙනවා, ඒ ප්‍රදේශය වෙනුවෙන්.

වෛද්‍යාචාර්ය රංජිත් අතපත්තු මහතා
(டாக்டர் ரஞ்ஜித் அத்தபத்து)
(Dr. Ranjith Atapattu)
ඒ උදවිය එන්න ඕනෑ රජයේ බෙහෙත් ගබඩාවටයි.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

ආනන්ද දසනායක මහතා
(திரு. ஆனந்த தஸநாயக்க)
(Mr. Ananda Dassanayake)

රජයේ බෙහෙත් ගබඩාවට තමයි.

වෛද්‍යාචාර්ය රංජිත් අතපත්තු මහතා
(டாக்டர் ரஞ்ஜித் அத்தபத்து)
(Dr. Ranjith Atapattu)

ඉතින් ඒක ආණ්ඩුවේ දෙපාර්තමේන්තුවක්. මේක සංස්ථාව. ඒ දෙක වෙනස්.

ආනන්ද දසනායක මහතා
(திரு. ஆனந்த தஸநாயக்க)
(Mr. Ananda Dassanayake)

සමහරවිට රජයේ බෙහෙත් ගබඩාවට ඔසුසැලෙනුත්, සංස්ථාවෙනුත් බෙහෙත් ද්‍රව්‍ය සපයනවා.

වෛද්‍යාචාර්ය රංජිත් අතපත්තු මහතා
(டாக்டர் ரஞ்ஜித் அத்தபத்து)
(Dr. Ranjith Atapattu)

නැහැ !

ආනන්ද දසනායක මහතා
(திரு. ஆனந்த தஸநாயக்க)
(Mr. Ananda Dassanayake)

ඉතින් මේ ප්‍රශ්නය ආවාම ඒ චුවමනා කරන බෙහෙත් ද්‍රව්‍ය ගන්නට නැහැ. ඒ නිසා මම කියන්නේ මෙයයි. (බාධාකිරීමක්) 'ප්‍රයිවට් ප්‍රැක්ටිස්' වුණත් බෙහෙත් දෙන්නේ ලෙඩුන්ට නේද ? ඒ නිසා ප්‍රශ්නයක් නැහැ. රජයේ වුණත් පෞද්ගලික අංශයේ වුණත් කොහේ හරි මෙතැන ගැටලුවක් තිබෙනවා. ඒ නිසා සමහර අවස්ථාවලදී ඒ අයට දුෂ්කරතාවනට මුහුණ පාන්නට සිදු වී තිබෙන බව වෛද්‍යවරුන් ප්‍රකාශ කරනවා. රජයේ ඖෂධ ගබඩාව දැන් කොළඹ විතරක් තිබිලා මදියි කියන එකයි මම කියන්නේ. ප්‍රසිද්ධ නගරවල ඖෂධ ගබඩා ඇති කරනවා නම් මේ දුෂ්කරතා මගහරවා ගන්නට පුළුවන්. වෛද්‍යවරුන් මේ කාරණය ඉදිරිපත් කර තිබෙන නිසයි මම කියන්නේ. [බාධාකිරීමක්] සෞඛ්‍ය ඇමතිතුමා නම් ඒකට ඉඩ දෙන්නේ නැති බව මම දන්නවා. සභාපතිතුමියක් වෙන්න ඇති ඉන්නේ. ඒ ගැන මම දන්නේ නැහැ. නම් වශයෙන් කියන්නට මම කැමති නැහැ. මොනවා වුණත් ඒ තත්ත්වය විමධ්‍යගත කර මධ්‍යම ප්‍රදේශය සඳහා මහනුවරත්, ඌව ප්‍රදේශයට බදුල්ලේත්, දකුණු පළාතට ගාල්ලේත් යනාදි වශයෙන් ඖෂධ ශාලා තිබුණොත් ඒ ප්‍රදේශවල වෛද්‍යවරුන්ටත්, සේවකයන්ටත් එය ලොකු පහසුවක් වෙනවා. ඒ වාගේම පෞද්ගලික අංශයේ වෛද්‍යවරුන්ටත් බෙහෙත් ගැනීම පහසු වෙනවා. අපට වුවමනා කරන්නේ ජීවිත ආරක්ෂා කිරීමටයි. ලෙඩුන් සුව කිරීමටයි. එමනිසා ඒ සම්බන්ධව කටයුතු කරන ලෙස මම තමුන්නාන්සේගෙන් ඉල්ලා සිටිනවා. සමහර විට තමුන්නාන්සේ මගේ අදහස හිතහවට ලක් කරන්නට පුළුවන්.

වෛද්‍යාචාර්ය රංජිත් අතපත්තු මහතා
(டாக்டர் ரஞ்ஜித் அத்தபத்து)
(Dr. Ranjith Atapattu)

කවදාවත් එහෙම කරන්නේ නැහැ.

ආනන්ද දසනායක මහතා
(திரு. ஆனந்த தஸநாயக்க)
(Mr. Ananda Dassanayake)

මහජනයාගේත් වෛද්‍යවරුන්ගේත් ඉල්ලීමක් හැටියට මෙය ඉෂ්ට කරයි කියා අපි බලාපොරොත්තු වෙනවා.

වෛද්‍යාචාර්ය රංජිත් අතපත්තු මහතා
(டாக்டர் ரஞ்ஜித் அத்தபத்து)
(Dr. Ranjith Atapattu)

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, පිළිතුරු වශයෙන් කරුණු දෙක තුනක් ඉදිරිපත් කරන්න කැමතියි. විගණකාධිපතිතුමා ඉදිරිපත් කළ කරුණු ගැන සම්පූර්ණ අවධානය යොමු කර තිබෙනවා.

විශේෂයෙන්ම ණය ගෙවිය යුතු අය ගැන කොත්මලේ මන්ත්‍රීතුමා (ආනන්ද දසනායක මහතා) සඳහන් කළා. සංස්ථාවට වැඩියෙන්ම ණය ගෙවන්න තිබෙන්නෙ සෞඛ්‍ය දෙපාර්තමේන්තුවයි. ඊළඟට මා කියන්න කැමතියි බෙහෙත් ගෙන්වීමේදී– ඖෂධ ගෙන්වීමේදී–ටෙන්ඩර් ක්‍රමයට පටහැනිව සමහර අවස්ථාවලදී අපට කටයුතු කරන්නට සිදුවෙන බව. එයට හේතු දෙකක් තිබෙනවා. එක හේතුවක් නම් ටෙන්ඩර් කැඳවා අඩු ටෙන්ඩර්කරුට බෙහෙත් තොග ගෙන්වීම භාර දුන්නත් කලට වේලාවට ඒ බෙහෙත් ලැබෙන්නෙ නැති අවස්ථා තිබෙනවා. එවිට වැඩියෙන් වියදම් කර අපට ඒවා ගෙන්වන්නට සිදුවෙනවා. විගණකාධිපතිතුමා විසින් එය පෙන්නුම් කර දීම හරි. නමුත් අපට වරින් වර එවැනි ක්‍රියාවල් කරන්නට සිදුවෙනවා.

ඊළඟට විමධ්‍යගත කිරීමක් ගැනත් කියන්න යෙදුණා. මම දන්නේ නැහැ, ඖෂධ සංස්ථාව විමධ්‍යගත කරන්න කිව්වාද එහෙම නැත්නම්.

ආනන්ද දසනායක මහතා
(திரு. ஆனந்த தஸநாயக்க)
(Mr. Ananda Dassanayake)

බෙදා හැරීම.

වෛද්‍යාචාර්ය රංජිත් අතපත්තු මහතා
(டாக்டர் ரஞ்ஜித் அத்தபத்து)
(Dr. Ranjith Atapattu)

අපි සෞඛ්‍ය දෙපාර්තමේන්තුවෙන් බෙදා හැරීම නම් විමධ්‍යගත කර තිබෙනවා.

ලක්ෂ්මන් ජයකොඩි මහතා
(திரு. லக்ஷ்மன் ஜயக்கொடி)
(Mr. Lakshman Jayakody)

දෙපාර්තමේන්තුවත් විමධ්‍යගත කරන්න ඕනෑ.

වෛද්‍යාචාර්ය රංජිත් අතපත්තු මහතා
(டாக்டர் ரஞ்ஜித் அத்தபத்து)
(Dr. Ranjith Atapattu)

දෙපාර්තමේන්තුවෙන් ඖෂධ බෙදා හැරීම විමධ්‍යගත කර තිබෙනවා. ඖෂධ සංස්ථාවේ ගබඩාවල් විමධ්‍යගත කරන්න බැහැ. ඔසුසල් හැම තැනම ව්‍යාප්ත කරන්න අමාරුයි. ඒ මන්ද ? වෙළඳාමක් කරනවා නම් එය හරියට තිතියට කරන්න ඕනෑ. වුවමනා කරන පාරිමසී ප්‍රමාණය තිබෙන්න ඕනෑ. ඒ විධියට වැඩ කටයුතු කරන විට ඒ තරම් ලාභයක් ලැබෙන්නෙ නැහැ. මහනුවර එකත් බොහොම අමාරුවෙන් තමයි කරගෙන යන්නෙ. නමුත් අපේ ඒජන්තවරු හැම නගරයකම ඉන්නවා. ඒ නිසා වෛද්‍යවරයෙකුට කිසිම ප්‍රශ්නයක් නැතිව බෙහෙත් ලබා ගන්න පුළුවන්.

I commend this motion to the House.

*ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.*
*வினா விடுக்கப்பெற்று ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

නියෝජ්‍ය කාරක සභාපතිතුමා
(குழுப் பிரதித் தலைவர் அவர்கள்)
(The Deputy Chairman of Committees)

Item 10–National Institute of Education Bill–Second Reading–stand down.

ලක්ෂ්මන් ජයකොඩි මහතා
(திரு. லக்ஷ்மன் ஜயக்கொடி)
(Mr. Lakshman Jayakody)

Item 10 will be discussed first tomorrow ?

එම්. වින්සන්ට් පෙරේරා මහතා
(திரு. எம். வின்சன்ற் பெரேரா)
(Mr. M. Vincent Perera)

Item 10 will go down.

ලක්ෂ්මන් ජයකොඩි මහතා
(திரு. லக்ஷ்மன் ஜயக்கொடி)
(Mr. Lakshman Jayakody)

Not tomorrow ?

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

## කල්තැබීම
## ஒத்திவைப்பு
## ADJOURNMENT

එම්. වින්සන්ට් පෙරේරා මහතා
(திரு. எம். வின்சன்ற் பெரேரா)
(Mr. M. Vincent Perera)

I move,

"That the Parliament do now adjourn".

*ප්‍රශ්නය සභාභිමුඛ කරන ලදී.*
*வினா எடுத்தியம்பப்பெற்றது.*
*Question proposed.*

**ආනන්ද දසනායක මහතා**
**(திரு. ஆனந்த தஸநாயக்க)**
(Mr. Ananda Dassanayake)

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, ප්‍රශ්න දෙක තුනක්ම අසන්නට මා කල් දී තිබෙනවා. එක් ප්‍රශ්නයක් අසන්නට බලාපොරොත්තු වෙන්නේ ගරු අගමැතිතුමා සහ පළාත් පාලන නිවාස හා ඉදිකිරීම් ඇමතිතුමාගෙනුයි. මම ඒ ප්‍රශ්නය එතුමාට ඉදිරිපත් කර තිබෙනවා. ත්‍රිකපොත අංග විකල පුද්ගලයෙක් පොඩි පාරක් ළඟ පොඩි "හට්" එකක් හදාගෙන කඩයක් දමාගෙන ජීවත් වුණා. නමුත් ත්‍රිකපොත සංවර්ධන සභා උප කාර්යාලය මඟින් 26. 06. 85 දින සිට එම කඩය පවත්වාගෙන යාම නවත්වන්නට නියම කර තිබෙනවා. එය නවත්වන්නේ මොන හේතුවක් උඩද කියා දන්නේ නැහැ. මේ පුද්ගලයා අහිංසක සාමාන්‍ය දුප්පතෙක්. මෙම වෙළඳ පොළ නවත්වා දැම්මෙත් සංවර්ධන සභා උප කාර්යාලයට ලාභයක් ලැබෙන්නෙත් නැහැ ; පාඩුවක් වෙන්නෙත් නැහැ. ඇත්තවශයෙන්ම මේ අහිංසක පුද්ගලයාට ජීවත්වෙන්න වෙන ක්‍රමයකුත් නැහැ. අංග විකල කෙනෙකු නිසා ඔහුට වෙනත් රක්ෂාවක් කරන්න බැහැ. අපි ආධාර දිය යුතු පුද්ගලයෙක්. ඒ නිසා ඒ පුද්ගලයාට සහනයක් දීම සඳහා නැවත ඒ කඩය පවත්වාගෙන යාමට අවස්ථාවක් සලසා දෙනවාද ? එසේ නැත්නම් එසේ පවත්වාගෙන යාමට ඉඩ දෙන්නට ඇති අපහසුව මොකක්ද කියා එම සංවර්ධන සභා උප කාර්යාලයෙන් අසා දැනගෙන පිළිතුරක් සපයන මෙන් මා ඉල්ලා සිටිනවා.

ඊළඟට මගේ දෙවැනි ප්‍රශ්නය අසන්නට බලාපොරොත්තු වෙන්නේ අධ්‍යාපන ඇමතිතුමාගෙනුයි. එතුමා නැති නිසා පාර්ලිමේන්තු කටයුතු පිළිබඳ ඇමතිතුමා පිළිතුරු දෙයිද කියා මා දන්නේ නැහැ.

එම්. වින්සන්ට් පෙරේරා මහතා
(திரு. எம். வின்சன்ற் பெரேரா)
(Mr. M. Vincent Perera)

නියෝජ්‍ය ඇමතිතුමා ඉන්නවා.

**ආනන්ද දසනායක මහතා**
**(திரு. ஆனந்த தஸநாயக்க)**
(Mr. Ananda Dassanayake)

මම එතුමාව දැක්කෙ නැහැ. එහෙම නම් එතුමා පිළිතුරු දෙන්න සූදානම්ව ඇති. මගේ ප්‍රශ්නය මෙයයි :

(1) උපාධිධාරී වෘත්තීය ස්ථාපන සේවය — උපාධිධාරී පුහුණු වැඩසටහන් හා රැකියා අවස්ථාවන් යටතේ විජේනායක සමරසිංහ ප්‍රේමසිලී මෙනෙවිය 1983 මැයි මස අංක 6357 යටතේ ලියාපදිංචි වී සිටියේද ?

(2) 1984 ඔක්තෝම්බර් මස 08 වැනි දින පවත්වන ලද සම්මුඛ පරීක්ෂණයේදී අවශ්‍ය සුදුසුකම් සපුරා තිබියදීත් ඇය උපාධිධාරී ගුරු පත්වීම් සඳහා තෝරා නොගත්තේ මන්ද ?

(3) ඇයට උපාධිධාරී ගුරු පත්වීමක් ලබාදීමට අවශ්‍ය කටයුතු කරන්නේද ? එසේ නම් කවදා ද ? නොඑසේ නම් ඒ මන්ද ?

මම ඒ ප්‍රශ්නය ඇහුවේ මේ නිසයි : යොවන කටයුතු හා රැකීරක්ෂා අමාත්‍යාංශය 1984.09.24 දතම්න් ඒ මෙනෙවියට ලියුමක් යවා තිබෙනවා. "උපාධිධාරී වෘත්තීය ස්ථාපන සේවය–උපාධිධාරී පුහුණු වැඩසටහන් හා රැකියා අවස්ථාවන්" කියලයි ඒ ලියුමේ මාතෘකාව. "1984.10.08 දින පෙ. ව. 9.30 ට පැමිණෙන මෙන් මෙයින් කාරුණිකව දන්වමි" කියා එහි සඳහන් වෙනවා. ඒ කියන්නේ සම්මුඛ පරීක්ෂණයට එන්නය කියායි. ඇය ඒ සම්මුඛ පරීක්ෂණයට ගිහින් තිබෙනවා. ඇය පිළිබඳ විස්තර මේවායි : සම්පූර්ණ නම–විජේනායක සමරසිංහ ප්‍රේමසිලී. ලිපිනය–අංක 119, බැදිගම, විතාරන්දෙනිය, තංගල්ල. උපාධිය ලැබූ වර්ෂය–1981. උපාධියෙහි ස්වභාවය–වාණිජවේදී (විශේෂ). විශ්ව විද්‍යාලය–කොළඹ විශ්ව විද්‍යාලය. ස්ථාපන සේවයෙහි ලියාපදිංචිය–1983 මැයි. ස්ථාපන සේවයෙහි ලියාපදිංචි වූ අංකය–6357. ස්ථාපන සේවයෙහි සම්මුඛ පරීක්ෂණයට කැඳවූ දිනය–1984.10.08

ඒ සම්මුඛ පරීක්ෂණයෙන් පසු ඇයට කිසිම තොරතුරක් දැන ගන්න ලැබී නැහැ. ඒ නිසා ඒ සම්බන්ධයෙන් නියෝජ්‍ය ඇමතිතුමා පැහැදිලි විස්තරයක් ඉදිරිපත් කරනවා ඇතැයි මම බලාපොරොත්තු වෙනවා. ඒ සමගම, උපකාරයක් වශයෙන් ඇය ස්ථාපන සේවයේ පිහිටුවීමට කටයුතු කරන හැටියටත් ඉල්ලා සිටිනවා.

ඊළඟට, තවත් ප්‍රශ්නයක් අහන්න තිබෙනවා. ගරු අධ්‍යාපන ඇමතිතුමාගෙන් ඇසීම සඳහා 1985 මැයි 09 වැනිද මම ඒ ප්‍රශ්නය දැනුම් දී තිබෙනවා.

**නියෝජ්‍ය කාරක සභාපතිතුමා**
**(குழுப் பிரதித் தலைவர் அவர்கள்)**
(The Deputy Chairman of Committees)

Order, Please ! The hon. Member cannot raise this particular question because he has not given notice of it.

**ආනන්ද දසනායක මහතා**
**(திரு. ஆனந்த தஸநாயக்க)**
(Mr. Ananda Dassanayake)

Sir, I have given notice of this Question on the 9th of May. At that time the Hon. Minister concerned and the Deputy Minister were not here. I think then the Hon. Minister of Parliamentary Affairs and Sports promised to bring the matter to the notice of the Minister of Education. I do not know whether he has done that.

**නියෝජ්‍ය කාරක සභාපතිතුමා**
**(குழுப் பிரதித் தலைவர் அவர்கள்)**
(The Deputy Chairman of Committees)

That would have been a private discussion. That is not on record here.

**ආනන්ද දසනායක මහතා**
**(திரு. ஆனந்த தஸநாயக்க)**
(Mr. Ananda Dassanayake)

Sir, i am sorry to interrupt. I am not saying anything wrong. I have given notice of this question on the 9th of May. At that time the Hon. Minister and the Deputy Minister were not present in the House and the Hon. Minister of Parliamentary affairs and Sports said he would bring the matter to the notice of the Hon. Minister conerned. But I did not get any reply yet. I would like to remind the Hon. Minister of Education to give me a reply even within a week or next week. That is what I would request.

**නියෝජ්‍ය කාරක සභාපතිතුමා**
**(குழுப் பிரதித் தலைவர் அவர்கள்)**
(The Deputy Chairman of Committees)

That will be all right. I call upon the hon.Member for Baddegama to ask his question.

අමරසිරි දොඩන්ගොඩ මහතා
(திரு. அமரசிறி தொடங்கொட)
(Mr. Amarasiri Dodangoda)

නියෝජ්‍ය සභාපතිතුමනි, මේ අවස්ථාවේදී මතු කිරීම සඳහා මම ප්‍රශ්න දෙකක් කල් දී තිබෙනවා. එයින් එකක්, මීට කලිනුත් මතු කළ ප්‍රශ්නයක්. හැබැයි, මේ ගරු සභාවේ මහාමාර්ග කටයුතු පිළිබඳ ඇමතිවරයෙකු ඉන්න

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[අමරසිරි දොඩන්ගොඩ මහතා]

වගක් මට පෙනෙන්නේ නැහැ. ඒ නිසා පාර්ලිමේන්තු කටයුතු ඇමතිතුමා ඊට පිළිතුරු දෙයි කියා මම හිතනවා. මේ තත්ත්වය දුන් පුරුද්දකට ගිහින් තිබෙනවා. කොහොම වුණත්, ප්‍රශ්නය මේකයි :

"මහා මාර්ග දෙපාර්තමේන්තුවේ සේවය කරමින් සිට මහා මාර්ග සංවර්ධන අධිකාරිය පිහිටුවීමෙන් පසු රැකියා අහෝසි වී ගිය එම දෙපාර්තමේන්තුවේ කම්කරුවන්ට වන්දි මුදල් ගෙවීමේදී විශාල අක්‍රමිකතාවන් සිදු වී ඇති බව දැනගන්නට තිබේ. සෑම සේවකයකුගේම සේවා කාලය සැලකිල්ලට ගෙන වන්දි මුදල් ලබා දීමට කටයුතු කර නොමැති බව පෙනී යන හෙයින්, සාධාරණ පදනමක් මත සියලුම දෙනාට වන්දි මුදල් ගෙවීමට එතුමා කටයුතු කරන්නේද ?

නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, මේ වන්දි ගෙවීම සම්බන්ධයෙන් ගරු ඇමතිතුමාට තෝරා දිය යුතු කරුණක් තිබෙනවා. මේ ප්‍රශ්නයට අදාළ සේවකයන් විශාල සංඛ්‍යාවක් ඉතා අඩු වැටුපකට සේවය කළ, පීඩා වින්ද කොටසක් බව පෙන්වා දෙන්න ඕනෑ. මහා මාර්ග සංවර්ධන අධිකාරිය ආවාට පස්සේ මේ අයට වන්දි ගෙවීම සම්බන්ධයෙන් කොන්දේසියක් පැනෙව්වා. ඒ කොන්දේසිය මත 1984 අවුරුද්දේ දවස් 55 ක් වැඩ කර තිබෙනවා නම් රු. 20,000 ගේ වන්දිය ගෙවනවා. කලින් කොපමණ කලක් වැඩ කර තිබුණත්, 1970 සිට හෝ 1977 සිට හෝ දිගටම වැඩ කරගෙන ඇවිත් 1984 දී දවස් 55 ක් වැඩ කර නැත්නම් වන්දිය නැහැ. 1984 දීම බැදී 1984 දවස් 55 ක් වැඩ කර තිබුණත් වන්දිය තිබෙනවා. මේක අසාධාරණ කොන්දේසියක්.

අනෙක් පැත්තෙන්, මේ තත්ත්වය කල්තියා දැනගෙනද මම දන්නේ නැහැ, ලොකු වැඩ පිළිවෙළක් යටතේ හෝ මේ කම්කරුවන්ට 1984 දී කොහොම හරි දවස් 55 ක් වැඩ නොදෙන්න කටයුතු කර තිබෙනවා. එය සිදු වී තිබෙන්නේ මෙහෙමයි. 1984 මුලදීම කොන්ත්‍රාත් දී තිබෙනවා. වී. ඒ. ලා ඒ අයට හිතවත් සේවකයන් කැඳවාගෙන ඇවිත් තිබෙනවා. නමුත් මහාමාර්ග සේවකයන්ට දවස් 55 ක් වැටිලා නැහැ. සිදු වුණු අසාධාරණය මේකයි :

කවද සේවයට බැඳුණත් 1984 සීමාවක් කර දවස් 55 ක් වැඩ නොතිබුණොත් වන්දිය නැහැ. 1984 මුලදී බැදී දවස් 55 ක් සේවයක් තිබෙනවා නම් වන්දිය තිබෙනවා. මේ නිසා මෙතේ ලොකු අසාධාරණයක් තිබෙනවා. ඒ නිසා මහාමාර්ග සේවකයන්ට වන්දි ගෙවීමේදී මේ 1984 දවස් 55 සීමාව ඉවත් කරනවාද කියන ප්‍රශ්නය මම ගරු ඇමතිතුමාගෙන් අහන්න කැමතියි.

ඊළඟ ප්‍රශ්නය ගරු කලවානේ මන්ත්‍රීතුමාත් අද දවසේම මීට ඉහත අවස්ථාවක මතු කළ ප්‍රශ්නයක්. මම මේ ප්‍රශ්නය අහන්නේ මුදල් හා ක්‍රම සම්පාදන ඇමතිතුමාගෙන්. රාජ්‍ය ඉස්කාගාර සංස්ථාව පෞද්ගලික සමාගමකට පැවරීමට යන බව දැනගන්න තිබෙනවා. මේ බව ජාතික පුවත්පත්වලින් හෙළිදරව් කර තිබෙනවා. මෙය සත්‍යයක් නම්, මෙතෙක් පාඩු නොලැබූ ඉස්කාගාර සංස්ථාව කඩිමුඩියේ පවරා දීමට යන්නේ කුමන හේතුවක් නිසාදැයි ගරු මුදල් හා ක්‍රම සම්පාදන ඇමතිතුමා සඳහන් කරනවාද ?

පසුගිය අවුරුදු පහ තුළ ඉස්කාගාර සංස්ථාව ආණ්ඩුවට ගෙවූ බදු සහ සංස්ථාවේ ලාභ ප්‍රමාණයන් සඳහන් කරන්න කැමතියි. අවුරුදු 10 ක විස්තර මේ ලියවිල්ලේ තිබෙනවා. 1980 දී දස ලක්ෂ 779 ක් මේ සංස්ථාව ආණ්ඩුවට බදු ගෙවා තිබෙනවා. 1981 දී දස ලක්ෂ 850 ක් ගෙවා තිබෙනවා. 1982 දස ලක්ෂ 944 ක් ගෙවා තිබෙනවා. 1983 දස ලක්ෂ 1,118 ක් ගෙවා තිබෙනවා. 1984 දස ලක්ෂ 1,221 ක් ගෙවා තිබෙනවා. ඉස්කාගාර සංස්ථාව වසරින් වසරම ආණ්ඩුවට වැඩි වැඩියෙන් බදු ගෙවා තිබෙනවා.

ඒ සංස්ථාවේ ලාභය ඊළඟට මම සඳහන් කරනවා. 1980 දී දස ලක්ෂ 22 යි. 1981 දස ලක්ෂ 52 යි. 1982 දස ලක්ෂ 34 යි. 1983 දස ලක්ෂ 36 යි. 1984 දස ලක්ෂ75 යි. මේ ලාභ ප්‍රමාණයත් ආණ්ඩුවට ගෙවා ඇති බදු ප්‍රමාණයත් ගැන සලකන විට මේ වාගේ සංස්ථාවක් පෞද්ගලික සමාගමකට දෙන්න යන්නේ ඇයි කියන ප්‍රශ්නය අහන්න වෙනවා. මට දැනගන්නට ලැබී තිබෙන හැටියට මේ සංස්ථාව භාර දෙන්න යන්නේ එංගලන්තයේ හොඳ මධ්‍යසාර සමාගමක් වන රාජගෝපාල් සමාගමට. බද්දේගම ආසනයේත් මෙහෙම එකක් දී තිබෙනවා. ගිල්බීස් නමැති සමාගමකට. ඒක බහුජාතික සමාගමක්. එංගලන්තයේ හොඳම මද්‍යසාර පෙරන සමාගමක්. ගොවීන් සිය ගණනක්, දහස් ගණනක් ඒ සමාගමේ පොරොන්දු පත්‍රිකාවක් උඩ උක් වවා දුන් අමාරුවේ වැටී සිටිනවා. සමාගම වහලා බ්‍රසීලයෙන් ස්ප්‍රීතු ගෙනත් දුන් කඩුවෙල ඉඳගෙන පුරවනවා. අපේ ඉස්කාගාර සංස්ථාවත් මේ විධියේ සමාගමකට දුන්නොත් සිදුවන්නේ කුමක්ද ? කලවානේ ගරු මන්ත්‍රීතුමාත් කී විධියට මෙතෙක් ලාභදායීව පවත්වාගෙන ගිය සංස්ථාවක්, සංඛ්‍යා ලේඛනවලින් පෙන්නා තිබෙන අන්දමට ආණ්ඩුවට හොඳ ආදායමක් දුන් මේවාගේ ආයතනයක් පෞද්ගලික සමාගමකට පවරා දෙන්නේ ඇයි කියන ප්‍රශ්නය මම ගරු මුදල් ඇමතිතුමාගෙන් අහනවා.

**දිනේෂ් ගුණවර්ධන මහතා**
**(திரு. தினேஷ் குணவர்த்தன)**
(Mr. Dinesh Gunawardene)

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, විදුලිබල හා බලශක්ති පිළිබඳ ගරු ඇමතිතුමාගෙන් ප්‍රශ්නයක් ඇසීමටයි, මම බලාපොරොත්තු වන්නේ. කොළඹ සංවර්ධන සභාවට අයිති මහරගම සංවර්ධන සභා ඒකක බල ප්‍රදේශයේ කොටස් කීපයක් විශාල විදුලි අර්බුදයකට මුහුණ පා තිබෙනවා. පසුගිය මාස 4 තුළ දිනපතාම වාගේ සවස් කාලය තුළ විශාල කොටසක් විදුලිය ඇනහිටීමකට ලක්වෙනවා. මේ සම්බන්ධයෙන් කොළඹ සංවර්ධන සභාවත් මමත් ඇමතිතුමා වෙත කීප වතාවක්ම කරුණු ඉදිරිපත් කර තිබෙනවා.

මගේ ප්‍රශ්නය මේකයි : කොළඹ සංවර්ධන සභාවේ මහරගම ඒකකය තුළ උද්‍යාන මාවත, වත්තේගෙදර, යහම්පත් මාවත සහ දෙහිවල පාර යන ස්ථානවල ට්‍රාන්ස්ෆෝමර් යන්ත්‍ර 4 ක් සවිකිරීම සඳහා පසුගිය වර්ෂයේ නිර්දේශ කර තිබුණා. මෙම ට්‍රාන්ස්ෆෝමර් යන්ත්‍ර සවි නොකළොත් මේ ප්‍රදේශය විශාල විදුලි අර්බුදයකට මුහුණ දෙනවා. කොළඹ නගරයේ ප්‍රධාන අමාත්‍යාංශ, දෙපාර්තමේන්තු සහ වැඩපළවල සේවය කරන ජනතාව තමයි, මේ ප්‍රදේශයේ වැඩි වශයෙන්ම ඉන්නෙ. මේ කාරණය හේතුකොට ගෙන ඒ කාර්යාලවල වැඩපළවල කටයුතුත් විශාල ඇනහිටීමකට පත් වෙන්න පුළුවන්.

විශේෂයෙන් මම කියන්න ඕනෑ, ශ්‍රේෂ්ඨාධිකරණයේ විනිශ්චයකාරවරුන් කීප දෙනෙක් පවා ඒ ප්‍රදේශයේ පදිංචිව සිටින බව. ඒ විනිශ්චයකාරවරුන්ට ස්වකීය රාජකාරි කටයුතු සහ පොත්පත් බැලීම් ආදිය කර ගන්නට අපහසු තත්ත්වයක් උද වී තිබෙනවා. ඒ වාගේම අධ්‍යාපන කටයුතුවල නියැළී සිටින කුඩා දරුවන්ගේ ඇස් පෙනීමටත් මෙය බලපානවා. ඒ මොකද, මාස ගණනාවක් තිස්සේ හිටි හැටියේ විදුලිය නැති වී යනවා. එමනිසා මූල්‍යමය ගණන්හිලව් වශයෙන් කල්පනා කරන්නෙ නැතිව මෙය මහජන ප්‍රශ්නයක් හැටියට සලකා විදුලිබල මණ්ඩලයේ අවධානය මේ දෙස යොමු වෙනවා නම් හොඳයි. එසේ නොකළොත් මහරගම ප්‍රදේශයේ වැසියන් සමහර විට ත්‍රස්තවාදීන් වශයෙන් නම් කරන්න තමුන්නාන්සේලාට සිද්ධ වේවි. ඒ අය බැරිම තැන මහ පාරට බැහැලා පෙළපාලි යන්න පටන්ගනීවි, අප ගෙවූ මුදල් ගැන සලකාවත් අපට විදුලිය ලබා දෙන්නය කියා. ඒකයි, අද ඇති වී තිබෙන අර්බුදය.

අපට දැනගන්න තිබුණ පරිදි මහරගම සංවර්ධන සභා ඒකකයෙන් විදුලිබල මණ්ඩලයට තිබූ ණය වශයෙන් ලක්ෂ 81 ක් විදුලිබල මණ්ඩලයට ගෙවා තිබෙනවා. පාර්ලිමේන්තු උපදේශක කාරක සභාවේදී මහරගම සංවර්ධන සභා ඒකකයෙන් ණය හැටියට ගණන් ගැනුණ මුදල ලක්ෂ 100 යි. එමනිසා එයින් සෑහෙන ප්‍රමාණයක් වන ලක්ෂ 81 ක් ගෙවා තිබෙන බව කොළඹ දිසාපතිතුමා විසින් අමාත්‍යාංශයේ ලේකම් මහාචාර්ය පෙරේරා මහතාට 1985.5.24 දිනැති ලිපියෙන් දැනුම් දී තිබෙනවා. එමනිසා, මෙසේ ලක්ෂ 81 ක් ගෙවී තිබෙන නිසා, ඒ ට්‍රාන්ස්ෆෝමර් යන්ත්‍ර හතරෙන් අවම වශයෙන් එකක්වත් සවිකිරීම තුළින් මේ විදුලි අර්බුදය විසඳන්නය කියා නියෝගයක් නිකුත් කරන්නේ නම් ඉතාමත් උචිත බව මම පෙන්වා දෙන්න කැමතියි.

ඒ මොකද, ජූනි මාසේ 4 වෙනිද කොළඹ සංවර්ධන සභා සාකච්ඡාවේදී මම ප්‍රශ්නයක් නැගූ වෙලාවේ ඒ පිළිබඳ සිරස්තල සහිත ප්‍රවෘත්තියක් "දිවයින" පත්‍රයේ 7 පිටුවේ පළ කර තිබෙනවා. "විදුලිබල මණ්ඩලයේ සභාපති පොරොන්දු ඉටු නොකළ නිසා මට මුහුණ දෙන්න බැහැ" කියා කොළඹ සංවර්ධන සභාවේ සභාපති කියා තිබෙන බව එහි සිරස්තලයෙන් දැක්වෙනවා. මම මෙහි හරි වැරදි සොයන්න යනවා නොවෙයි. නමුත් දැන් මහජනයාට කියා තිබෙන්නේ සභාපතිතුමා ප්‍රතිඥ දුන් පරිදි මුදල් ගෙවා තිබෙනවාය, ඒ අනුව ට්‍රාන්ස්ෆෝමර් යන්ත්‍ර නිකුත් කෙරෙන්නෙ නැහැ කියලයි. ඒ නිසා මම ගරු ඇමතිතුමාගෙන් විශේෂයෙන් ඉල්ලා සිටින්නේ දැන් මුදල් ගෙවා තිබෙන නිසා

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

මේ ඉල්ලන ට්‍රාන්ස්ෆෝමර් යන්ත්‍ර සවි කිරීමෙන් ඊට විදුලිය සම්බන්ධ කිරීමෙන් පළමු පියවර වශයෙන් දැනට මේ අර්බුදය උග්‍රව පවතින ජම්බුගස්මුල්ල ප්‍රදේශයට අවම වශයෙන් එක යන්ත්‍රයක්වත් සවි කිරීමට අවසරයක් තිබුන් කරන ලෙසයි. එසේ නොකර පසුව ඒ ජනතාවට ත්‍රස්තවාදීන් කියා නම් කරන පරිසරයක් උදා නොකරන ලෙස මම ඉල්ලනවා.

රිචඩ් පතිරණ මහතා
(திரு. றிச்சட் பத்திரன)
(Mr. Richard Pathirana)

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, මම ප්‍රශ්නයක් කල් දී තිබෙනවා ගරු රාජ්‍ය ඇමතිතුමාගෙන් ඇසීමට. ප්‍රශ්නය මෙයයි :

"1. අපවත් වී වදාළ ආචාර්ය ලබුදූවේ සිරිධම්ම හිමියන්ගේ අභාවය පිළිබඳව ගුවන් විදුලි හා රූපවාහිනී සංනිවේදන මාර්ගයෙන් ප්‍රචාරයක් නුදුන් බව ඔබතුමා දන්නෙහිද ?

2. එම හිමියන්ගේ මරණ දන්වීම බාර ගැනීමට පවා ගුවන් විදුලි සංස්ථාව අකමැතිව කළ බවත්, පසුව ඒ සඳහා බලවත් ආයාචනා කිරීමට සිදුවූ බවත් දන්නේද ?

3. ඒ හිමියන්ට එසේ අසාධාරණ ලෙස සලකන ලද්දේ මන්ද ?"

මේ රටේ ඉතාම ශ්‍රේෂ්ඨ සංඝයා වහන්සේ නමක් හැටියට හිටපු ලබුදූවේ සිරිධම්ම ස්වාමීන්ද්‍රයන් වහන්සේ පසුගිය මාසයේ 27 වන සඳුදා අපවත් විම සම්බන්ධයෙන් රාජ්‍ය අමාත්‍යාංශය යටතේ තිබෙන ගුවන් විදුලිය, රූපවාහිනිය යන ජන සංනිවේදන මාධ්‍යයන් දැක්වූ ගොළුවත සම්බන්ධයෙනුයි මම ඒ ප්‍රශ්නය අසා තිබෙන්නේ.

මේ ස්වාමීන්ද්‍රයන් වහන්සේ අපවත් වුණාම දියවඩන නිලමේ නැත්පත් නිරංජන් විජේරත්න මහත්මයාගේ සභාපතිත්වයෙන් යුත් ආදාහන කමිටුවක් පත් කර ගෙන ගුවන් විදුලියේ හා රූපවාහිනියේ ප්‍රවෘත්ති මාධ්‍යයෙන් උන්වහන්සේගේ අපවත්වීම ගැන ප්‍රචාරයක් කර ගන්නට සැහෙන උත්සාහයක් දරා තිබෙනවා. මට දැනගන්න ලැබුණු විධියට විජේරත්න මැතිතුමා, ජනාධිපතිතුමාගේ ලේකම්තුමාට මේ සම්බන්ධයෙන් කථා කර ගුවන් විදුලියෙන් හා රූපවාහිනියෙන් ප්‍රචාරය කරන ලෙස ඉල්ලීමක් කර තිබෙනවා. මේ ගැන ජනාධිපතිතුමාට කථා කරන්නටය කිව්වාම, එතුමාට කථා කරන්නට අවකාශ ලැබිලා නැහැ. රාජ්‍ය ඇමතිතුමාට කථා කළාම එතුමා නිදිය කියා එතුමාගේ ගෙදරින් කියා තිබෙනවායයි මට දැන ගන්නට ලැබී තිබෙනවා. කොහොම වුණත් කිසිම ප්‍රචාරයක් ගුවන් විදුලියෙනුත්, රූපවාහිනියෙනුත් ලබා දුන්නේ නැහැ. මේ දවස්වල දකුණේ ප්‍රසිද්ධ ව්‍යාපාරිකයෙක් වන සී. ඒ. හරිස්චන්ද්‍ර මහතා මැරුණා. එතුමාගේ අභාවය ගැන මේ ධර්මද්වීපයේ ගුවන් විදුලියෙන් ප්‍රචාරයක් කළා. ඒ ගැන අපේ කිසිම විරුද්ධතාවයක් නැහැ. ඒ වගේම මහාචාර්ය ලුඩොවයික් මහත්මයා මැරුණා. එතුමාගේ මරණය ගැනත් ගුවන් විදුලියේ ප්‍රවෘත්තිවල කිව්වා. ලබුදූවේ සිරිධම්ම හාමුදුරුවෝ අන්තර්ජාතික වශයෙන් මේ රටට ශ්‍රේෂ්ඨ කීර්තියක් ගෙනාපු හාමුදුරු නමක්. ඔක්ස්ෆර්ඩ් විශ්ව විද්‍යාලයේ පළමුවන වතාවට ස්වාමීන් වහන්සේ කෙනෙක් වශයෙන් දර්ශනවේදී උපාධියක් — ආචාර්ය උපාධියක් — ලබා ගත්තේ, ලබුදූවේ සිරිධම්ම හාමුදුරුවෝයි. මම ඒ ගැන සඳහන් කරන්නේ ඉතාම ආඩම්බරයෙන්. උන්වහන්සේ උත්පත්තිය ලැබුවේ අක්මීමන ආසනයේ ලබුදූව කියන ගමේයි. එම නිසා මේ සිද්ධිය ගැන මම බොහොම වේදනාවෙනුයි කථා කරන්නේ. ඔක්ස්ෆර්ඩ් විශ්ව විද්‍යාලයෙන් ආචාර්ය උපාධිය ලබාගෙන උන්වහන්සේ පිටරටවල ධර්ම ප්‍රචාරයෙහි යෙදුණා. ඉංග්‍රීසියෙන් ධර්ම දේශනා කරන්නට සැහෙන දක්ෂකමක් උන්වහන්සේට තිබුණා.

ලංකාවට ඇවිල්ලා—

ගාමිණී අතුකෝරළ මහතා
(திரு. காமினி அத்துக்கோறல)
(Mr. Gamini Atukorale)

ප්‍රශ්නයක්ද ඔය අහන්නේ?

රිචඩ් පතිරණ මහතා
(திரு. றிச்சட் பத்திரன)
(Mr. Richard Pathirana)

ප්‍රශ්නය ගැන තමයි, මේ කියන්නේ. තමුන්නාන්සේ කලබල වන්නට ඕනෑ නැහැ. උන්වහන්සේ ධර්මචක්‍ර විද්‍යා පීඨය ආරම්භ කළා. එමගින් සැහෙන සේවයක් කළා. කවර ආණ්ඩුවක් තිබුණත් ලබුදූවේ සිරිධම්ම හාමුදුරුවෝ ඒ ආණ්ඩුවේ වැරදි කිව්වා. ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ ආණ්ඩුව තිබෙන කාලයේත් හීරැස්සගල රැස්වීමකට ගිහිල්ලා 1970 දී ඒ ආණ්ඩුව තරයේ විවේචනය කළා.

වීරවන්නි සමරවීර මහතා
(திரு. வீரவன்னி சமரவீர)
(Mr. Weerawanni Samaraweera)

බඩවැල් අදින කථාවත් බුද්ධ ධර්මයට එකඟද ?

රිචඩ් පතිරණ මහතා
(திரு. றிச்சட் பத்திரன)
(Mr. Richard Pathirana)

කොයි ආණ්ඩුව කාලයේත් තිබෙන වැරදි විවේචනය කළා. එම නිසා මම කියන්නට කැමතියි. නොයෙක් ව්‍යාපාරිකයන් ගැන ගුවන් විදුලි ප්‍රවෘත්ති මාධ්‍යයෙන් නොයෙක් ප්‍රචාර දෙන රාජ්‍ය අමාත්‍යාංශය ලබුදූවේ සිරිධම්ම හාමුදුරුවන්ගේ අපවත්වීම ගැන කිසිම ප්‍රචාරයක් දුන්නේ නැති බව. එපමණක් නොවෙයි. තවත් කාරණයක් කියන්න ඕනෑ. උන්වහන්සේගේ ආදාහන පෙරහැර පේරාදෙණියේ හන්දියට පමණක් එන්නට කටයුතු යොදා තිබුණා. ඒක තහනම් කළා. ගැටඹේ රාජෝපවනාරාමයේ සිට ආදාහන මලුවට පමණයි, යන්නට දුන්නේ. පේරාදෙණියේ හන්දියට ආදාහන පෙරහැරට එන්නට දුන්නේ නැහැ. ඒ සඳහා කිසිම ඉස්කෝලයකින් පුටුවක්වත් ගන්නට දුන්නේ නැහැ. ගරු රාජ්‍ය ඇමතිතුමා මෙම ගරු සභාවේ නැති වුණත් එතුමා පසුව වත් මෙයට පිළිතුරු දේවි. පාර්ලිමේන්තු කටයුතු හා ක්‍රීඩා ඇමතිතුමා මෙම ගරු සභාවේ ඉන්නා නිසා එතුමා සමහර විට පිළිතුරක් දේවිය කියා හිතනවා. එමනිසා මේ රටේ හිටපු ශ්‍රේෂ්ඨ, ඉතාම උගත්, බුද්ධ ශාසනය වෙනුවෙන්, සිංහල ජාතිය වෙනුවෙන් විශාල කැපවීමකින් වැඩ කළ, ලබුදූවේ සිරිධම්ම හාමුදුරුවන් වහන්සේගේ අපවත්වීම සම්බන්ධයෙන් ලංකාවේ රාජ්‍ය අමාත්‍යාංශය යටතේ තිබෙන ගුවන් විදුලිය, රූපවාහිනිය වැනි ජනසංනිවේදන මාධ්‍යයන් මේ අසාධාරණය කළේ ඇයි කියන ප්‍රශ්නය මා මේ අවස්ථාවේදී අහන්න කැමතියි.

ආනන්ද දසනායක මහතා
(திரு. ஆனந்த தஸநாயக்க)
(Mr. Ananda Dassanayake)

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, මේ සම්බන්ධයෙන් මම —

වීරවන්නි සමරවීර මහතා
(திரு. வீரவன்னி சமரவீர)
(Mr. Weerawanni Samaraweera)

මෙහෙම කථා කරන්න දෙන්නේ කොහොමද ?

ආනන්ද දසනායක මහතා
(திரு. ஆனந்த தஸநாயக்க)
(Mr. Ananda Dassanayake)

නැහැ, නැහැ, පුළුවන්. මේක " adjournment dabate " එක.

වීරවන්නි සමරවීර මහතා
(திரு. வீரவன்னி சமரவீர)
(Mr. Weerawanni Samaraweera)

මෙය ප්‍රශ්නයක්. මේ ඒවාට අවස්ථාවක් නොවෙයි. මෙයට මා සම්පූර්ණයෙන්ම විරුද්ධයි. සභාපතිතුමනි, මෙහෙම කරන්න දෙන්න බැහැ.

ලක්ෂ්මන් ජයකොඩි මහතා
(திரு. லக்ஷ்மன் ஜயக்கொடி)
(Mr. Lakshman Jayakody)

ඉඩ දෙන්න පුළුවන්.

වීරවන්නි සමරවීර මහතා
(திரு. வீரவன்னி சமரவீர)
(Mr. Weerawanni Samaraweera)

මෙය විවාදයක් කර ගන්නේ කොහොමද ?

රිචඩ් පතිරණ මහතා
(திரு. றிச்சட் பத்திரன)
(Mr. Richard Pathirana)

මේ කල්තැබීමේ අවස්ථාව.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

වීරවන්නි සමරවීර මහතා
(திரு. வீரவன்னி சமரவீர)
(Mr. Weerawanni Samaraweera)
ප්‍රශ්නයක් පමණයි. අහන්න පුළුවන්.

ආනන්ද දසනායක මහතා
(திரு. ஆனந்த தஸநாயக்க)
(Mr. Ananda Dassanayake)
මෙය " adjournment dabate " එක.

වීරවන්නි සමරවීර මහතා
(திரு. வீரவன்னி சமரவீர)
(Mr. Weerawanni Samaraweera)
තමුන්නාන්සේට එය පැහැදිලි කරන්න බැහැ. ඕනෑ නම් තමුන්නාන්සේ හෙට නැවත ප්‍රශ්නයක් අහන්න.

ආනන්ද දසනායක මහතා
(திரு. ஆனந்த தஸநாயக்க)
(Mr. Ananda Dassanayake)
මේ ගැන කථා කරන්න පුළුවන්.

වීරවන්නි සමරවීර මහතා
(திரு. வீரவன்னி சமரவீர)
(Mr. Weerawanni Samaraweera)
බැහැ, බැහැ.

දිනේෂ් ගුණවර්ධන මහතා
(திரு. தினேஷ் குணவர்த்தன)
(Mr. Dinesh Gunawardene)
පුළුවන්.

ගාමිණී අතුකෝරල මහතා
(திரு. காமினி அத்துக்கோறல)
(Mr. Gamini Atukorale)
කොහොමද එහෙම කරන්නේ ?

දිනේෂ් ගුණවර්ධන මහතා
(திரு. தினேஷ் குணவர்த்தன)
(Mr. Dinesh Gunawardene)
මේ කල්තැබීමේ අවස්ථාව.

ගාමිණී අතුකෝරල මහතා
(திரு. காமினி அத்துக்கோறல)
(Mr. Gamini Atukorale)
බැහැ, මේ ගැන කථා කරන්න බැහැ.

දිනේෂ් ගුණවර්ධන මහතා
(திரு. தினேஷ் குணவர்த்தன)
(Mr. Dinesh Gunawardene)
කටුකම්බි ගහන්න එපා මේකට.

ආනන්ද දසනායක මහතා
(திரு. ஆனந்த தஸநாயக்க)
(Mr. Ananda Dassanayake)
මම හෙට ප්‍රශ්නයක් අහන්න කල් දීලා තිබෙනවා. නමුත් ඒ ප්‍රශ්නය මම හෙට අහන්නේ නැහැ. මේ ප්‍රශ්නය අද මේ මන්ත්‍රීතුමා ඇසූ නිසා.

මා කියා සිටින්නේ මේ සිද්ධිය සම්බන්ධයෙන් සම්පූර්ණයෙන් අසාධාරණයක් සිදු වුණා. විශේෂයෙන් මහා සංඝරත්නය, දියවඩන නිලමේ, මහනුවර මහ නගර සභාව—

නියෝජ්‍ය කාරක සභාපතිතුමා
(குழுப் பிரதித் தலைவர் அவர்கள்)
(The Deputy Chairman of Committees)
ඔය ප්‍රශ්නය දුන් අහල තිබෙන්නේ.

ආනන්ද දසනායක මහතා
(திரு. ஆனந்த தஸநாயக்க)
(Mr. Ananda Dassanayake)
මේ සම්බන්ධයෙන් පරීක්ෂණයක් පවත්වා, කව්ද මේ වරද කර තිබෙන්නේ කියා සොයන්න.

නියෝජ්‍ය කාරක සභාපතිතුමා
(குழுப் பிரதித் தலைவர் அவர்கள்)
(The Deputy Chairman of Committees)
ඇමතිතුමා එයට පිළිතුරක් දෙයි [බාධා කිරීමක්]

ලක්ෂ්මන් ජයකොඩි මහතා
(திரு. லக்ஷ்மன் ஜயக்கொடி)
(Mr. Lakshman Jayakody)
ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, මෙය "adjournment debate" එකක්ද නැද්ද කියා තමුන්නාන්සේ පැහැදිලි කරන්න ඕනෑ. පාර්ලිමේන්තු සම්ප්‍රදායයට අනුව "adjournment debate" එකක් කියා එකක් තිබෙනවා. මෙය කල් තැබීමේ යෝජනාව. එම නිසා අපටත් මේ ගැන යමක් කියන්න තිබෙනවා. විශේෂයෙන්ම පාර්ලිමේන්තු කටයුතු පිළිබඳ ඇමතිතුමා මේ හාමුදුරුවන්ගේ නැපකරු දායකයෙක්. එතුමාටයි. අපි කියන්න ඕනෑ. ඇත්තවශයෙන්ම මා ස්තුතිවන්ත වෙනවා, දියවඩන නිලමේ වන නිරංජන් විජේරත්න මහත්මයාට. එතුමා මේ ප්‍රශ්නය ගැන ක්‍රියා කර මෙය සාර්ථක කර ගැනීම සඳහා විශාල සේවයක් කළා. එතුමා කළ ඒ ක්‍රියාව ගැන මා එතුමාට ස්තුතිවන්ත වෙනවා. මේ මන්ත්‍රීතුමා කියූ සෑම කාරණයක්ම ඇත්ත.

මින් මත්තට මෙවැනි අසාධාරණ කටයුතු භික්ෂූන් වහන්සේලාට කරන්න එපාය කියන ඉල්ලීම පමණයි, මා කරන්න බලාපොරොත්තු වෙන්නේ. මොනවා හරි හේතුවක් නිසා සිරිධම්ම හාමුදුරුවන්ගේ කටයුතු පිළිබඳව ඇමතිතුමාට තීරණයක් ගන්න බැරිවෙන්න ඇති. නමුත් මින් මත්තට මෙවැනි දේවල් සිදුනොවේවා කියා මා ඉල්ලා සිටිනවා.

විශේෂයෙන්ම මේ විධියේ කටයුතු කිරීමට සංස්කෘතික අමාත්‍යාංශයක් තිබෙනවා. මම හිතන්නේ ආගමික කටයුතු පිළිබඳ දෙපාර්තමේන්තුවක් සංස්කෘතික අමාත්‍යාංශය යටතේ තිබෙනවා. මා හිතන්නේ මේ වාගේ වැදගත් ස්වාමීන් වහන්සේ නමක් අපවත් වූ විට ඒ කටයුතු කරන්න වග බලා ගන්නය කියා මා ආණ්ඩුවෙන් ඉල්ලා සිටිනවා.

එම්. වින්සන්ට් පෙරේරා මහතා
(திரு. எம். வின்சன்ற் பெரேரா)
(Mr. M. Vincent Perera)
කොත්මලේ ගරු මන්ත්‍රීතුමා විසින් අසන ලද ප්‍රශ්නයට පිළිතුර මෙයයි :

නිකපොත සංවර්ධන සංවර්ධන සභා උප කාර්යාලය අසල රජයේ මාර්ග රක්ෂිත ඉඩමක අනවසරයෙන් සාදනලද තාවකාලික ගොඩනැගිල්ලක එම්. ආර්. ඇල්බට් මහතා විසින් 1961 වර්ෂයේ සිට තේ කඩයක් පවත්වාගෙන ගොස් ඇත. මෙම තේ කඩය තවමත් තිබේ. මෙම තේ කඩයට පිටුපසින් පිහිටි නිකපොත සංවර්ධන සභා උප කාර්යාලයට අයත් ඉඩමේ කඩ කාමර දෙකක් 1980 දී ඉදිකර ඇත. මෙම කඩ කාමර දෙකෙන් එකක් ඉහත සඳහන් තේ කඩය නිසා ආවරණය වී ඇති බැවින් එය ටෙන්ඩර් මඟින් බදු දීමට ක්‍රියා කිරීමේදී කිසිවකු විසින් ලබාගෙන නැත. මේ හේතුව නිසා මෙම තේ කඩය ඉවත් කර තාවකාලිකව පවත්වාගෙන යෑම සඳහා උප කාර්යාලයට අයත් එම ඉඩමේම වෙනත් කොටසක් එම්. ආර්. ඇල්බට් මහතාට උප කාර්යාලය විසින් 1980 දී තාවකාලිකව බදු දී ඇත. මෙම ඉඩම් කොටස සඳහා ඇල්බට් මහතා 1980 සහ 81 වර්ෂවලට රු. 12 ක් බැගින් බදු මුදල් ගෙවා ඉන්පසුව බදු මුදල් ගෙවීම නතරකර ඇත. තමා බදු ගත් ඉඩමේ ස්ථිර ගොඩනැගිල්ලක් සෑදීම සඳහා අත්තිවාරම දමා තිබූ බැවින් එය අත්හිටුවන ලෙස උප කාර්යාලයෙන් ඔහුට දන්වා ඇත. එබැවින් ඔහු රක්ෂිත බිමේ තිබූ තේ කඩය එහිම පවත්වාගෙන ගොස් ඇත.

ඉහත සඳහන් අයුරු උප කාර්යාලයේ කඩ කාමරය මේ තේ කඩය නිසා බදු දීමට නොහැකි වූ බැවින් ඔහු රක්ෂිත බිමෙන් ඉවත් කරන ලෙස සංවර්ධන සභාව විසින් බදුල්ල දිසාපතිගෙන් ඉල්ලීමක් කර ඇත. මෙම ඉල්ලීම අනුව රජයේ ඉඩම් (සන්තකය) ආපසු ගැනීමේ පනත යටතේ මෙම

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

අය ඉවත් කිරීමට බදුල්ල දිසාපති විසින් බණ්ඩාරවෙල උසාවියේ අංක 42666 දරණ නඩුව පවරා ඇත. නඩු තීන්දුව අනුව 1985.06.26 වැනි දිනට පෙර එයින් ඉවත් වන ලෙස උසාවිය විසින් ඇල්බට් මහතාට නියෝග කර ඇත. ඉහත සඳහන් කරුණු අනුව මෙම තේ කඩය පවත්වාගෙන යැම සංවර්ධන සභා උපකාර්යාලය විසින් නතරකර ඇත.

ඇල්බට් මහතා කුඩා කල පෝලියෝ රෝගය වැළඳීම නිසා එක් පයක් අංග විකල වූ අයෙකි. එසේ වුවත් ඔහුට ඇවිදීමට සහ සාමාන්‍ය කටයුතු කිරීමට හැකියාව ඇත. වෙනත් අංග විකල බවක් ඔහුට නැත.

ඔහු තේ කඩය සාද ඇත්තේ රජයේ මාර්ග රක්ෂිත ඉඩමක මිස දෙමළ මුදලාලි කෙනෙකු විසින් දෙන ලද ඉඩමක නොවේ.

ඉහත සඳහන් අයුරු නිකපොත සංවර්ධන සභා උප කාර්යාලයේ කඩ කාමරය බදුදීමට නම් ඒ ඉදිරිපස මාර්ග රක්ෂිත බිමේ පිහිටි ඇල්බට් මහතාගේ තාවකාලික තේ කඩය ඉවත් කළ යුතුය. විශේෂ අනුග්‍රහයක් ලෙස මෙම කඩ කාමරය බදුගන්නා ලෙස ඔහුගෙන් විමසා ඇති නමුත් ඔහු එයට එකඟවී නැත. කලින් ඔහුට තාවකාලිකව බදු දී තිබූ නමුත් අවසර රහිතව ස්ථිර ගොඩනැගිල්ලක් සෑදීමට පියවර ගැනීම නිසා අවලංගු කරන ලද ඉඩමේ ස්ථිර ගොඩනැගිල්ලක් සෑදීමට අවසර දෙන්නේ නම් ඔහු රක්ෂිත බිමෙන් ඉවත්වී එහි කඩය පවත්වාගෙන යැමට එකඟ වී අත. මේ පිළිබඳව බදුල්ල සංවර්ධන සභාවේ මීළඟ විධායක කමිටුවට ඉදිරිපත් කර තීරණයක් ගැනීමට දිසා ලේකම් අපේක්ෂා කරයි. එනෙක් උසාවි නියෝගය ක්‍රියාත්මක කිරීම අත්හිටුවා ගැනීමට ද ඔහු පියවර ගනු ඇත.

ගාමිණී අතුකෝරල මහතා (නියෝජ්‍ය යෞවන කටයුතු හා රැකීරක්ෂා ඇමතිතුමා)
(திரு. காமினி அத்துக்கோறல — இளைஞர் அலுவல்கள், தொழில் வாய்ப்புப் பிரதி அமைச்சர்)
(Mr. Gamini Atukorale–Deputy Minister of Youth Affairs & Employment)

ඩබ්ලිව් එස්. ප්‍රේමසිලී මෙනෙවිය ගැන ප්‍රශ්නයක් කොත්මලේ ගරු මන්ත්‍රීතුමා ඉදිරිපත් කර තිබෙනවා. මේ සම්බන්ධයෙන් සම්පූර්ණ විස්තරයක් මේ ගැන සොයා බලා පසුව ඉදිරිපත් කිරීමට මම බලාපොරොත්තු වෙනවා. නමුත් මෙන්න මේ කරුණ මම දන්වන්න කැමතියි. උපාධිධාරී වෘත්තිය ස්ථාපන සේවය උපාධිධාරී ගුරු පත්වීම් දීමට පමණක් සීමා වී නැහැ. මේ සම්බන්ධයෙන් සම්පූර්ණ විස්තරයක් පසුව ඉදිරිපත් කරන්නම්.

එම්. වින්සන්ට් පෙරේරා මහතා
(திரு. எம். வின்சன்ற் பெரேரா)
(Mr. M. Vincent Perera)

බද්දේගම ගරු මන්ත්‍රීතුමා (අමරසිරි දේඩන්ගොඩ මහතා) ඉදිරිපත් කළ ප්‍රශ්නයට පිළිතුර මෙයයි :

ගරු මන්ත්‍රීතුමා විසින් සඳහන් කර ඇති අත්දමේ අක්‍රමිකතාවන් කිසිවක් ගැන මෙතෙක් පැමිණිලි ලැබී නැත. එහෙත් ගෙවන ලද පාරිතෝෂික මුදලේ ප්‍රමාණය හෝ පාරිතෝෂික දීමනාවක් ලැබීම සඳහා හිමිකමක් නොමැති බවට ගන්නා ලද තීරණ සම්බන්ධයෙන් නියෝජනයන් ලැබී තිබේ. එම නියෝජනයන් පිළිබඳව මහාමාර්ග අමාත්‍යාංශයේ සහකාර ලේකම්වරයකුගේ ප්‍රධානත්වයෙන් යුත් සමාලෝචන කමිටුවක් මගින් දැනටමත් කරුණු පරීක්ෂා කරගෙන යනු ලබන අතර, සාධාරණ දුක්ගැනවිලි ඇති තැනැත්තන්ට සහනය සැලසීමට කටයුතු කරනු ඇත. මෙම ගෙවීම් පිළිබඳව විශේෂ විගණනයක් පැවැත්වීමටද විධිවිධාන සලස්වා ගෙන යන අතර, එම විගණනයේ සොයා ගැනීම් අනුවද අවශ්‍ය පරිදි කටයුතු කරනු ලබේ.

පාරිතෝෂික දීමනා වැඩ පිළිවෙලේ සඳහන් සුදුසුකම් අනුව මහාමාර්ග දෙපාර්තමේන්තුවේ නිරන්තර සේවයේ යෙදී සිටි සියලුම ස්ථිර, තාවකාලික සහ අනියම් කම්කරුවන්ට පාරිතෝෂික දීමනාව ගෙවනු ලැබේ.

රිචඩ් පතිරණ මහතා
(திரு. றிச்சட் பத்திரன)
(Mr. Richard Pathirana)

ඔය පිළිතුර සම්පූර්ණයෙන්ම වැරදියි. මම වගකීම භාරගෙන ඒක කියවනවා. චක්‍රලේඛයක් යවා තිබුණා. ඒ චක්‍රලේඛය මගේ ඇස් දෙකින්ම දැක්කා. කලින් දවස් 312 ක් වැඩ කර තිබෙන්නට ඕනෑ. ගිය අවුරුද්දේදී දවස් 55 ක් වැඩ කර තිබෙන්නට ඕනෑ. මෙම කොන්දේසි දෙකම සම්පූර්ණ කළ කම්කරුවකුට පමණයි වන්දි ගෙවන්නේ. මහා මාර්ග අධ්‍යක්ෂවරයා විසින් යවන ලද එම චක්‍රලේඛය මම දැක්කා. මේ චක්‍රලේඛය අනුව ගාල්ලේ පමණක් තුන් සියයකට වැඩි සංඛ්‍යාවකට වන්දි මුදල් ලැබෙන්නේ නැහැ.

එම්. වින්සන්ට් පෙරේරා මහතා
(திரு. எம். வின்சன்ற் பெரேரா)
(Mr. M. Vincent Perera)

ඔය කාරණා මන්ත්‍රීතුමාට ඉදිරිපත් කරන්නට පුළුවනි.

රිචඩ් පතිරණ මහතා
(திரு. றிச்சட் பத்திரன)
(Mr. Richard Pathirana)

මට පුළුවනි. ඒ චක්‍රලේඛයේ ඡායා පිටපතක් ගෙනැවිත් මම ඉදිරිපත් කරන්නම්.

එම්. වින්සන්ට් පෙරේරා මහතා
(திரு. எம். வின்சன்ற் பெரேரா)
(Mr. M. Vincent Perera)

මන්ත්‍රීතුමාට කියන්නට පුළුවනි. මේ පිළිතුර අනුව එම චක්‍රලේඛය වැරදිය කියා.

රිචඩ් පතිරණ මහතා
(திரு. றிச்சட் பத்திரன)
(Mr. Richard Pathirana)

ඔය පිළිතුර සම්පූර්ණයෙන්ම වෙනස් එම චක්‍රලේඛයට වඩා.

එම්. වින්සන්ට් පෙරේරා මහතා
(திரு. எம். வின்சன்ற் பெரேரா)
(Mr. M. Vincent Perera)

මම ඉතුරු කොටසත් කියවන්නම් :

"එම දීමනාව එකී පුද්ගලයන්ගේ සේවා කාලය අනුව තීරණය කරන අතර, සේවය කළ සෑම වර්ෂයකටම මාස දෙකක වේතනය බැගින් පාරිතෝෂික දීමනාව ගණන් බලනු ලැබේ."

රිචඩ් පතිරණ මහතා
(திரு. றிச்சட் பத்திரன)
(Mr. Richard Pathirana)

පිළිතුර සම්පූර්ණයෙන්ම වැරදියි.

එම්. වින්සන්ට් පෙරේරා මහතා
(திரு. எம். வின்சன்ற் பெரேரா)
(Mr. M. Vincent Perera)

අමාත්‍යාංශයේ නියෝගය උඩ මේ විධියට තමයි වන්දි ගෙවන්නට යන්නේ.

රිචඩ් පතිරණ මහතා
(திரு. றிச்சட் பத்திரன)
(Mr. Richard Pathirana)

ගරු ඇමතිතුමනි, ඔය පිළිතුර සම්පූර්ණයෙන්ම වැරදි

නියෝජ්‍ය කාරක සභාපතිතුමා
(குழுப் பிரதித் தலைவர் அவர்கள்)
(The Deputy Chairman of Committees)

Hon. Minister of Finance.

එම්. වින්සන්ට් පෙරේරා මහතා
(திரு. எம். வின்சன்ட் பெரேரா)
(Mr. M. Vincent Perera)

He is not here.

නියෝජ්‍ය කාරක සභාපතිතුමා
(குழுப் பிரதித் தலைவர் அவர்கள்)
(The Deputy Chairman of Committees)

Is anybody answering the question ?

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

**එම්. වින්සන්ට් පෙරේරා මහතා**
(திரு. எம். வின்சன்ற் பெரேரா)
(Mr. M. Vincent Perera)

There is no answer, Sir. I will bring it to the notice of the Hon. Minister.

**පී. දයාරත්න මහතා (අම්පාර දිසා ඇමතිතුමා සහ විදුලිබල හා බලශක්ති පිළිබඳ නියෝජ්‍ය ඇමතිතුමා)**
**(திரு. பீ. தயாரத்ன — அம்பாறை மாவட்ட அமைச்சரும் மின்சக்தி, எரிபொருள் பிரதி அமைச்சரும்)**
**(Mr. P. Dayaratne–District Minister, Ampara and Deputy Minister of Power and Energy)**

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, මහරගම ගරු මන්ත්‍රීතුමා (දිනේෂ් ගුණවර්ධන මහතා) විසින් නගන ලද ප්‍රශ්නයට පිළිතුරු දෙන්න කැමතියි. මහරගම නගර සභා ප්‍රදේශය තුළ විදුලිය බෙදා හැරීම පිළිබඳව ප්‍රශ්නයක් ඇති බව අප හොඳ හැටි දන්නවා. මේක අද-ඊයේ සිට ඇති වුණු ප්‍රශ්නයක් නොවෙයි. සෑහෙන කාලයක් තිස්සේ නිරාකරණය කර ගන්නට බැරි වුණු දෙයක්. පසුගිය දවස්වල, ලංකා විදුලිබල සමාගම ආරම්භ කළ දවස්වල සංවර්ධන සභාවෙන් අප ඉල්ලීමක් කළා, පුළුවන් තරම් ඉක්මනින් එම සමාගමට භාර දෙන්නය කියා. නමුත් සංවර්ධන සභාව ඒ පිළිබඳව වැඩි උනන්දුවක් ගත්තේ නැහැ. එම නිසා දැන් මහරගම ඒකකය භාර දීමේ කටයුත්ත 1986 නැතිනම් 1987 ට කල් දමා තිබෙනවා යයි මම හිතනවා. ඒ අතරතුර විදුලිය ලබා ගැනීම සඳහා මහරගම ඒකකය විදුලිබල මණ්ඩලයට විශාල මුදලක් ගෙවන්නට තිබුණු නිසා තමයි විදුලිබල මණ්ඩලයෙන් වැඩි දියුණු කිරීම් නොකළේ. පසුගිය අප්‍රේල් සහ මැයි මාසවල රුපියල් අසූ එක් ලක්ෂයකට කිට්ටු මුදලක් ගෙවා තිබුණා. නමුත් සාමාන්‍යයෙන් සෑම සංවර්ධන සභා උප කාර්යාලයකටම විදුලිය බෙදා හැරීමේ පද්ධතියක් තිබෙනවා නම්, ඒ අයගේ මුදල් ගෙවීම පිළිබඳව මෙන්න මේ විධියේ තීරණයක් අපි අරගෙන තිබෙනවා.

"ලංකා විදුලි බල මණ්ඩලය විසින් කොළඹ සංවර්ධන සභාවේ මහරගම ඒකකය තුළ ට්‍රාන්ස්පෝමර් යන්ත්‍රයක් සවි කිරීම හා එමගින් විදුලිය සැපයීම කළ හැක්කේ එම ඒකකයේ හිඟ මුදල් තත්ත්වය මාස තුනක සාමාන්‍ය හිඟ මුදලට අඩු කළ විටය."

මේ තත්ත්වය සෑම සංවර්ධන සභා උප කාර්යාලයකටම සමාන බව කියන්නට ඕනෑ. ඒ අනුව හිඟ මුදල මාස තුනකට අඩු කර නැහැ. මාස පහකට අඩු කර තිබෙනවා. එම නිසා මෙය වෙනස් කළොත් මේ වාගේ විදුලිය බෙදා හැරීමේ පළාත් පාලන ආයතන රාශියක්ම අපෙන් ඒ ඉල්ලීම කරන්නට ඉඩ තිබෙනවා. එම නිසා මාස පහක හිඟ මුදල අකුරටම මාස තුනකට අඩු වනතුරු අඩු කළොත් එය ලබා දෙන්නට පුළුවන් බව මෙහි කියා තිබෙනවා. අපට පෙනෙනවා, සංවර්ධන සභා උප කාර්යාලය විශාල උත්සාහයක් දරා තිබෙන බව මේ හිඟ මුදල් ගෙවන්නට. පසුගිය මාස කිහිපය තුළදී ගෙවන්නට තිබුණු රුපියල් ලක්ෂ 120 ක පමණ මුදලින් රුපියල් ලක්ෂ 81 ක්ම ගෙවා තිබෙනවා. ඒ උත්සාහය ගැන අප සන්තෝෂ වෙනවා. තවත් රුපියල් ලක්ෂ 20 ක් ගෙව්වොත් වහාම එය ක්‍රියාත්මක කරන්නට පුළුවන් බවයි මෙම අවස්ථාවේදී මම ප්‍රකාශ කරන්නේ. කෙසේ වෙතත් මම අද විදුලි බල මණ්ඩලයට දැන්නුවා, ඒ වැඩි දියුණු කිරීම් සඳහා මුදල් ගෙවන තුරු, ඉක්මණින්ම ඇස්තමේන්තු සකස් කර, කරන්නට ඇති මූලික වැඩ කටයුතු ටික දැන්මම කරන හැටියට. ඒ සඳහාත් සෑහෙන කාලයක් ගත වෙනවා. කෙසේ වෙතත් අදම ඒ කටයුතු පටන් ගන්නටය කියා දැනුම් දුන්නා. එම නිසා, ලබන සතියේවත් රුපියල් ලක්ෂ 10 ක් ගෙවන්නට, තවත් සති දෙක – තුනකින් තවත් රුපියල් ලක්ෂ 10 ක්ගෙවන්නටයයි සංවර්ධන සභාවට කියන්න. එහෙම නොකළොත් ඊළඟ මාසයේ බිලත් ළඟම එනවා. ඒක තව සති දෙකකින් ආවාම මේ ලක්ෂ 40 ලක්ෂ 50 ක් වෙනවා. මාසික බිල ලක්ෂ 10 කට කිට්ටුයි. එ නිසා ඉක්මණින් ලක්ෂ 20 ක් ගෙව්වොත් අපට පුළුවන් මේ මුදල තවත් වැඩි වෙන්නට කලින් එය ක්‍රියාත්මක කරන්නට.

**දිනේෂ් ගුණවර්ධන මහතා**
**(திரு. தினேஷ் குணவர்த்தன)**
(Mr. Dinesh Gunawardene)

මම එක ඉල්ලීමක් කරනවා. ඇමතිතුමා පිළිගන්නවා මේ හිඟය ගෙවීම සඳහා ඒ අය විශාල උත්සාහයක යෙදී සිටිනවාය කියා.

**පී. දයාරත්න මහතා**
**(திரு. பீ. தயாரத்ன)**
**(Mr. P. Dayaratne)**

ඔව්.

**දිනේෂ් ගුණවර්ධන මහතා**
**(திரு. தினேஷ் குணவர்த்தன)**
(Mr. Dinesh Gunawardene)

ලක්ෂ 81 ක් ගෙවීම සුළුපටු කාර්යයක් නොවෙයි. මම දන්නා විදියට සංවර්ධන සභාවේ ඉතිරි කිරීමේ ගිණුම් සියල්ල ඉවත් කරලයි මේක ගෙවා තිබෙන්නේ. එමනිසා මේ ගැන විශේෂ සැලකිල්ලක් දක්වන්නටය කියා මම නැවත වරක් ඉල්ලනවා. මේ මහජන ප්‍රශ්නයේ පැත්ත ගැනත් අපි සලකන්නට ඕනෑ. මේ ගෙවීම් කරගෙන යන අතර මතුවී තිබෙන අර්බුදයට විදුලි සැපයුමත් අත්හිටවුවොත් ඉන් පසුව මතුවෙන්නට පුළුවන් ප්‍රශ්නය ඊට වඩා උග්‍ර වෙන්න පුළුවන්. රාජ්‍ය දෙපාර්තමේන්තුවලට පැමිණෙන සේවකයින්ට ප්‍රශ්න ඇති වෙන්න පුළුවන්. ඒ වගේම වෙනත් විවිධ ප්‍රශ්න ඔය ප්‍රදේශයෙන් මතුවෙන්නට පුළුවන්. ඒ නිසා මම නැවතත් ඇමතිතුමාගෙන් ඉල්ලනවා මේ ගැන විශේෂත්වයක් දෙන්නටය කියා, විශේෂයෙන්ම කොළඹට තදසන්න ප්‍රදේශයක් නිසා.

**පී. දයාරත්න මහතා**
**(திரு. பீ. தயாரத்ன)**
**(Mr. P. Dayaratne)**

අපටත් ඒ වාගේම ප්‍රශ්නයක් මතුවී තිබෙන නිසා තමයි මේ විදියට අපට ලැබෙන්නට තිබෙන මුදල එකතු කරගන්නට අපි උත්සාහ කරන්නේ. ඒ මොකද, රුපියල් දශ ලක්ෂ 5,000 කට වැඩි ප්‍රමාණයක් මේ පළාත්පාලන ආයතනවලින් අයවෙන්නට තිබෙනවා. තමුන්නාන්සේගේ අවසාන ප්‍රශ්නයට මෙන්න මේ උත්තරය විදුලිබල මණ්ඩලයෙන් මට දී තිබෙනවා. ඒක කියෙව්වාම තමුන්නාන්සේට සමහරවිට තේරුම් යයි මේ පළාත්පාලන ආයතනවලින් මේ මුදල් ටික ලබා ගන්නට ඇයි අපි මෙතරම් උත්සාහ කරන්නේ කියන එක.

"මහරගම ඒකකය ලංකා විදුලිබල මණ්ඩලයට රුපියල් 81 ලක්ෂයක් ගෙවා ඇතත්, 1985 මාර්තු මස දක්වා තව මාස පහක පමණ හිඟ මුදලක් ලංකා විදුලිබල මණ්ඩලයට ගෙවිය යුතුව ඇති බැවින්, එම හිඟ මුදල මාස තුනක සාමාන්‍ය ප්‍රමාණයට අඩු කිරීමට තව රුපියල් 20 ලක්ෂයක් පමණ ගෙවිය යුතුව ඇත. ට්‍රාන්ස්පොමර් සවිකිරීම හා විදුලිය සැපයීමට ලංකා විදුලිබල මණ්ඩලයට නියෝග කළ හැක්කේ එම හිඟ මුදල පියවුවාට පසුවය. රුපියල් ලක්ෂ 5,000 කට අධික මුදලක් විදුලිය හිඟ මුදල් වශයෙන් පළාත්පාලන ආයතනවලින් අයවීමට තිබේ. මෙම හිඟ මුදල් අයකිරීමට අපොහොසත් වුවහොත් විදුලිබල මණ්ඩලයට ලැබෙන ලෝක බැංකු හා ආසියානු බැංකු ආධාර ඇණ හිටීමට ඉඩ ඇත. බෙදා හැරීම, පුනරුත්ථාපන ව්‍යාපෘතිය සඳහා දැනට ලෝක බැංකු ආධාර රුපියල් ලක්ෂ 10,000 ක් ඉල්ලා ඇත."

මෙතැන තිබෙන ප්‍රශ්නය මේ "බෙදාහැරීම් පුනරුත්ථාපන ව්‍යාපෘතිය" කියන එකයි. ඒක ඉක්මණින්ම ක්‍රියාත්මක නොකළොත් තමුන්නාන්සේලාගේ ඔය ප්‍රදේශයට විදුලි බලය සැපයීම, ග්‍රිඩ් උප පොළවලින් විදුලි බලය සැපයීම, අවහිර වෙන්නට ඉඩ තිබෙනවා. මේ වැඩ පිළිවෙළ ක්‍රියාත්මක කරන්නට අපට ඒ මුදල් ඕනෑ. ඒ මුදල ලෝක බැංකුවෙන් ලබාගන්නට අපට කොන්දේසියක් හැටියට ඒ අය කියා තිබෙනවා මේ පළාත්පාලන ආයතනවලින් ලබාගන්නට තිබෙන සල්ලි වහාම ලබාගන්න කියා. නැත්නම් අපි ඒ සල්ලි දෙන්නේ නැහැ කියා ඒ අය කියනවා. එනිසා මම හිතනවා පළාත්පාලන ආයතනවල සෑම සාමාජිකයෙක්මත්, ඒ වාගේම ගරු මන්ත්‍රීවරුනුත්, ඒ ඒ ප්‍රදේශවල පළාත්පාලන ආයතනවලින් අපට ලැබෙන්නට තිබෙන මුදල, ලබා දෙන්නට උත්සාහ ගත්තොත් අනාගතයේදී විදුලිය ඇනහිටීමක් නොමැතිව ලබාදෙන්නට අපට අවස්ථාව ලැබේය කියා.

**දිනේෂ් ගුණවර්ධන මහතා**
**(திரு. தினேஷ் குணவர்த்தன)**
(Mr. Dinesh Gunawardene)

මම අහන්න ඕනෑ උතුරු පළාතේ ලක්ෂ ගණනාවක බිල්පත් ගෙවා නැති ප්‍රදේශවල ඔබතුමාගේ අමාත්‍යාංශය, විදුලිබල මණ්ඩලය මගින් විදුලිය කපාහැරීමක් කර තිබෙනවාද කියා.

**පී. දයාරත්න මහතා**
**(திரு. பீ. தயாரத்ன)**
**(Mr. P. Dayaratne)**

කොයි පළාතකවත් විදුලිය කපාහැරීමක් කෙරෙන්නෙ නැහැ.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

**දිනේෂ් ගුණවර්ධන මහතා**
**(திரு. தினேஷ் குணவர்த்தன)**
(Mr. Dinesh Gunawardene)

ඔව් එහෙම කෙරෙන්නෙ නැහැ. ඒ පළාත්වල මාස ගණනාවක් තිස්සේ ලක්ෂ ගණනාවක බිල්පත් ගෙවා නැහැ. එමනිසා මම නැවතත් ඉල්ලීමක් කරනවා ඇමතිතුමාගෙන්, ජනාධිපතිතුමා විෂය භාර ඇමතිතුමා හැටියට සිටින අමාත්‍යාංශයක් නිසා විශේෂයක් කරන්නය කියා. විශේෂයෙන්ම ජයවර්ධනපුර සංකීර්ණයේ ඉතා ප්‍රධාන බල ප්‍රදේශයක් නිසා මහරගම, එහි අර්බුදයක් ඇතිකර ගන්නට කටයුතු සලසාගන්නේ නැතුව මේ ගැන කටයුතු කරන්නය කියා මම ඉල්ලනවා.

**පී. දයාරත්න මහතා**
**(திரு. பீ. தயாரத்ன)**
**(Mr. P. Dayaratne)**

මම ඒ නිසා තමයි අද විදුලි බල මණ්ඩලයෙන් ඉල්ලා සිටියේ, පුළුවන්තරම් ඉක්මණට විශේෂයක් කරන්නටය කියා.

**නියෝජ්‍ය කාරක සභාපතිතුමා**
**(குழுப் பிரதித் தலைவர் அவர்கள்)**
(The Deputy Chairman of Committees)

The Hon. Minister of State.

එම්. වින්සන්ට් පෙරේරා මහතා
(திரு. எம். வின்சன்ற் பெரேரா)
(Mr. M. Vincent Perera)

I will bring it to the notice of the Hon. Minister.

***ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
***வினா விடுக்கப்பெற்று ஏற்றுக்கொள்ளப்பட்டது.***
*Question put, and agreed to.*

***පාර්ලිමේන්තුව ඊට අනුකූලව අ. භා. 4.12 ට 1985 ජුනි 6 වන බ්‍රහස්පතින්ද පෙ. ව. 10 තෙක් කල් ගියේය.***

***அதன்படி, பி. ப. 4.12 மணிக்கு பாராளுமன்றம், 1985 யூன் 6 ஆம் திகதி வியாழக்கிழமை மு. ப. 10 மணிவரை ஒத்திவைக்கப்பட்டது.***

*Adjourned accordingly at 4.12 p.m. until 10 a.m. on Thursday, 6th June, 1985.*

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

සැ. යු.

මෙම වාර්තාවේ අවසාන මුද්‍රණය සඳහා ස්වකීය කථාවල නිවැරදි කළ යුතු තැන් දක්වනු රිසි මන්ත්‍රීන් මින් පිටපතක් ගෙන එහි ඒවා පැහැදිලිව දක්වා එම පිටපත හැන්සාඩ් සංස්කාරක වෙත

**1985 ජුනි 19 වන බදාදා**

**නොඉක්මවා ලැබෙනසේ එවිය යුතුයි.**

குறிப்பு

அங்கத்தவர்கள் இறுதிப் பதிப்பிற் செய்யவிரும்பும் பிழை திருத்தங்களை அறிக்கையிற்றெளிவாகக் குறித்து பிழை திருத்தங்களைக் கொண்ட பிரதியை ஹன்சாட் பதிப்பாசிரியருக்கு

**1985 ஜூன் 19, புதன்கிழமைக்குப் பிந்தாமற்**

**கிடைக்கக்கூடியதாக அனுப்புதல் வேண்டும்.**

**NOTE**

Corrections which Members suggest for the Final Print should be clearly marked in this Report and the *copy containing the corrections must reach* the Editor of HANSARD,

**not later than**

**Wednesday 19th June 1985**

---

| | | |
|---|---|---|
| **Contents of Proceedings** | : | **From 10.00 a.m. to 4.12 p.m. on 05.06.1985** |
| **Final set of manuscripts received from Parliament** | : | **7.25 p.m. on 05.06.1985** |
| **Printed copies despatched** | : | **06.06.1985 morning** |

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

**දායක මුදල් :** පාර්ලිමේන්තු විවාද වාර්තාවල වාර්ෂික දායක මිල රු. 200/- කි. (අශෝධිත පිටපත් සඳහා නම් රු. 175/- කි). පිටපතක් ගෙන්වා ගැනීම අවශ්‍ය නම් ගාස්තුව රු. 2.50 කි. තැපැල් ගාස්තුව ශත 90 කි. කොළඹ 1, තැ. පෙ. 500, රජයේ ප්‍රකාශන කාර්යාංශයේ අධිකාරී වෙත සෑම වර්ෂයකම නොවැම්බර් 30 දට ප්‍රථම දායක මුදල් ගෙවා ඉදිරි වර්ෂයේ දායකත්වය ලබාගෙන විවාද වාර්තා ලබාගත හැකිය. නියමිත දිනෙන් පසුව එවනු ලබන දායක ඉල්ලුම්පත් භාරගනු නොලැබේ.

*சந்தா : ஹன்சாட் அதிகார அறிக்கையின் வருடாந்த சந்தா ரூபா 200/- (திருத்தப்படாத பிரதிகள் ரூபா 175/-) ஹன்சாட் தனிப்பிரதி ரூபா 2·50. தபாற் செலவு 90 சதம். வருடாந்த சந்தா முற்பணமாக அத்தியட்சர், அரசாங்க வெளியீட்டலுவலகம், த. பெ. இல. 500, கொழும்பு 1 என்ற விலாசத்திற்கு அனுப்பி பிரதிகளைப் பெற்றுக்கொள்ளலாம். ஒவ்வோராண்டும் நவெம்பர் 30 ந் தேதிக்குமுன் சந்தாப் பணம் அனுப்பப்படவேண்டும். பிந்திக் கிடைக்கும் சந்தா விண்ணப்பங்கள் ஏற்றுக்கொள்ளப்படமாட்டா.*

**Subscriptions :** The annual subscription for Official Report of Hansard is Rs. 200/- (For uncorrected copies Rs. 175/-). A single copy of Hansard is available for Rs. 2.50. (Postage 90 cts.) Copies can be obtained by remitting in advance an annual subscription fee to the SUPERINTENDENT, GOVERNMENT PUBLICATIONS BUREAU, P. O. Box, 500 Colombo 1. The fee should reach him on or before November 30 each year. Late applications for subscription will not be accepted.

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org